දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව

உள்நாட்டு இறைவரித் திணைக்களம் - இலங்கை

INLAND REVENUE DEPARTMENT - SRI LANKA



# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# Annual Performance Report

# 2023

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

# 2023

## වාර්ෂික
## කාර්ය සාධන වාර්තාව

**වැය ශීර්ෂ අංකය 246**

(2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.4 වගන්තිය ප්‍රකාරව)


**ඩී. යූ. ඒ. ජයවර්ධන**

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (වැඩබලන)

# පටුන

## 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ


1.1 හැඳින්වීම 13

1.1.1 දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 13

1.1.2 දැක්ම හා මෙහෙවර ප්‍රකාශය 14

1.1.3 ප්‍රධාන අරමුණු හා ඉලක්ක 14

1.2 සංවිධාන ව්‍යුහය 15

1.2.1 කළමනාකරණ කණ්ඩායම 16


## 02 පරිච්ඡේදය - බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම


2.1 හැඳින්වීම 21

2.2 බදු නීති සංශෝධනය කිරීම සඳහා 2023 වර්ෂයේ පනවන ලද නීති 21

2.2.1 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සිදු කරන ලද සංශෝධන 21

2.2.2 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට කරන ලද සංශෝධන 28

2.2.3 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනකරන ලද සංශෝධන 29

2.2.4 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු පනතට කරන ලද සංශෝධන 30

2.2.5 වර්ෂය තුළ නිකුත් කරන ලද ගැසට් නිවේදන 31

2.3 අනුමත පුණ්‍යායතන 33

2.4 ද්විත්ව බදු වළක්වා ගැනීමේ ගිවිසුම් 33


## 03 පරිච්ඡේදය - ආදායම් කාර්ය සාධනය


3.1 ආදායම් රැස් කිරීම 37

3.1.1 සමස්ත නිරීක්ෂණ 37

3.1.2 මුළු ආදායම එකතු කිරීම 37

3.1.3 ආදායම පසුගිය වසර සමග සැසඳීම 47

3.2 අනෙකුත් ප්‍රධාන ජයග්‍රහණ 48

3.2.1 ආදායම් රැස් කිරීම ශක්තිමත් කිරීමට ආරම්භ කළ අනෙකුත් ක්‍රියාමාර්ග 48

3.3 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අභියෝග සහ අනාගත ඉලක්ක 53

3.3.1 අභියෝග 53

3.3.2. අනාගත ඉලක්ක 55

## 04 පරිච්ඡේදය - අනුකූලතාව සහ බලාත්මක කිරීම


4.1 හැඳින්වීම 59

4.2 බදු ගෙවන්නන්, බදු සම්බන්ධ වෘත්තිකයන් සහ මහජනතාව සඳහා පවත්වන ලද දැනුම්වත්කිරීමේ වැඩසටහන් 60

4.3 වාර්තා ගොනුකිරීමේ අනුකූලතාව 60

4.3.1 2022/23 වර්ෂය සඳහා සංස්ථාපිත බදු වාර්තා ගොනු කිරීම 61

4.3.2 2022/23 වර්ෂය සඳහා තනි පුද්ගල ආදායම් බදු සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා ගොනු කිරීම 62

4.3.3 අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ රඳවා ගැනීමේ බදු /අත්තිකාරම් ආදායම් බදු වාර්තා ගොනු කිරීම 63

4.3.4 2023 වර්ෂයේ එකතු කළ අගය මත බදු වාර්තා ගොනුකිරීමේ අනුකූලතාව 64

4.4 බලාත්මක කිරීම 65

4.4.1 විගණන 65

4.4.2 අධිකරණ කටයුතු 66

4.4.3 බදු ගෙවීම මගහැරීම අවම කිරීම සඳහා ගත් පියවර 66


## 05 පරිච්ඡේදය - තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල් පරිවර්තනය


5.1 හැඳින්වීම 69

5.2 ජයග්‍රහණ සහ සන්ධිස්ථාන 71

5.3 අනාගත මෙහෙයුම් සහ ක්‍රමෝපායන අරමුණු 72


## 06 පරිච්ඡේදය - ආයතනික කාර්ය සාධනය


6.1 හැඳින්වීම 77

6.1.1 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නව ආචාර ධර්ම සංග්‍රහය (COC) ක්‍රියාත්මක කිරීම 77

6.1.2 බදු ගෙවන්නන්ගේ ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කිරීම 78

6.1.3 2024 - 2026 සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තු උපායමාර්ගික සැලැස්ම සම්පාදනය කිරීම 79

6.1.4 විශාල බදු පරිපාලනය පිළිබඳ ආයතනික සාධාරණීකරණය 79

6.1.5 අනුකූලතා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම 80

6.1.6 ඉහළ වත්කම් සහිත පුද්ගල අංශයක් ස්ථාපනය කිරීම 80

6.2 ප්‍රධාන කාර්යසාධන දර්ශක සහ ජයග්‍රහණ 81

6.2.1 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යසාධන දර්ශක 81

6.3 තිරසාර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය 83

## 07 වන පරිච්ඡේදය - වසරේ මූල්‍ය කාර්ය සාධනය සහ අනුකූලතා වාර්තාව


7.1 මූල්‍ය කාර්ය සාධනය 89

7.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 91

7.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 93

7.4 මූල්‍ය ප්‍රකාශන සටහන් 95

7.5 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය 106

7.6 වෙන්කිරීම් ප්‍රයෝජනයට ගැනීමේ කාර්ය සාධනය 107

7.7 මු.රෙ. 208 ප්‍රකාරව අනෙකුත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවේ වැය සඳහා වන වෙන්කිරීම් ප්‍රදාන 107

7.8 මූල්‍ය - නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 108

7.9 විගණකාධිපති වාර්තාව 108

7.10 අනුකූලතා වාර්තාව 108


## 08 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ


8.1 ශ්‍රම බලකාය පිළිබඳ විශ්ලේෂණය 117

8.2 කාර්යමණ්ඩල කළමනාකරණය 117

8.2.1 මුළු සේවක සංඛ්‍යාව 117

8.2.2 පරිපාලන අභියෝග 118

8.2.3 පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා ගන්නා ලද පියවර 119

8.2.4 2023 වර්ෂය තුළ උසස්වීම් 120

8.2.5 2023 වර්ෂය තුළ විශ්‍රාමයාම් 120

8.2.6 වයස අනුව සේවක වර්ගීකරණය 121

8.3 මානව සම්පත් සංවර්ධන වැඩසටහන් 122

8.3.1 2023 වර්ෂයේදී පවත්වන ලද දේශීය සහ විදේශීය මානව සම්පත් සංවර්ධන වැඩසටහන් 122

8.3.2 2023 වර්ෂය තුළ දේශීය ආදායම් සේවයේ නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු පන්ති සහ පරීක්ෂණ 123

8.3.3 2023 වර්ෂයේදී රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීම සඳහා පවත්වන ලද පුහුණු පාඨමාලා 123

8.3.4 2023 වර්ෂයේ දී පවත්වන ලද වෙනත් සම්මන්ත්‍රණ, වැඩමුළු, දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු වැඩසටහන් 124

# වගු ලේඛනය


| | | | |
|---|---|---|---|
| 2.1 වගුව | : | ඇතැම් ගෙවීම් මත රඳවා ගැනීමේ බද්ද (ර.ගැ.බ.)/අත්තිකාරම් ආදායම් බද්ද (අ.ආ.බ.) | 27 |
| 2.2 වගුව | : | සහන සම්බන්ධයෙන් වන සංශෝධන - තනි පුද්ගලයන් | 27 |
| 2.3 වගුව | : | තනි පුද්ගලයන්ට අදාළ ආදායම් බදු අනුපාත | 27 |
| 2.4 වගුව | : | දේශීය ආදායම් පනතේ අඩුකිරීම් නීතිවලට කරන ලද සංශෝධන | 28 |
| 2.5 වගුව | : | 2024.01.01 දින සිට බලපැවැත්වෙන ප්‍රතිශෝධිත එකතු කළ අගය මත බදු අනුප්‍රමාණ | 32 |
| 2.6 වගුව | : | 2023 වසරේ අනුමැතිය ලබා දුන් පුණ්‍යායතන | 33 |
| 3.1 වගුව | : | 2014 සිට 2023 දක්වා ඇස්තමේන්තුවලට සාපේක්ෂව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් කාර්ය සාධනය | 36 |
| 3.2 වගුව | : | රජයේ සමස්ත ආදායමට, රජයේ බදු ආදායමට සහ බදු හා දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය | 39 |
| 3.3 වගුව | : | බදු වර්ගය අනුව මුළු ආදායම් රැස් කිරීම - 2023 | 40 |
| 3.4 වගුව | : | බදු ආදායම පළාත් සභා වෙත මාරු කිරීම - 2023 | 41 |
| 3.5 වගුව | : | සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු | 43 |
| 3.6 වගුව | : | එකතු කළ අගය මත බදු දළ එකතුව සහ ආපසු ගෙවීම් | 44 |
| 3.7 වගුව | : | එකතු කළ අගය මත බද්ද දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය ඒ ඒ අංශය අනුව විශ්ලේෂණය කිරීම | 45 |
| 3.8 වගුව | : | සමාජ ආරක්ෂණ දායකත්ව බදු එකතු කිරීම ඒ ඒ අංශ අනුව විශ්ලේෂණය කිරීම | 46 |
| 3.9 වගුව | : | 2023 හා 2022 වර්ෂවල ආදායම සන්සන්දනය කිරීම | 47 |
| 3.10 වගුව | : | ලැබුණු සහ නිරවුල් කළ අභියාචනා පිළිබඳ විශ්ලේෂණය | 48 |
| 3.11 වගුව | : | ලියාපදිංචි වී ඇති බදු ගෙවන්නන් සංඛ්‍යාව | 49 |
| 3.12 වගුව | : | 2023.12.31 දිනට අයවිය යුතු බදු පිළිබඳ විශ්ලේෂණය | 50 |
| 3.13 වගුව | : | ආදායම රැස් කිරීම, මුළු වියදම සහ ආදායම් රැස් කිරීමේ පිරිවැය | 52 |
| 4.1 වගුව | : | දැනුම්වත් කිරීමේ වැඩසටහන්වල සාරාංශය | 60 |
| 4.2 වගුව | : | 2022/23 වර්ෂය සඳහා සංස්ථාපිත ආදායම් බදු වාර්තා ඉලෙක්ට්‍රොනික ගොනුකිරීම | 61 |
| 4.3 වගුව | : | 2022/23 වර්ෂයේ දී තනි පුද්ගල ආදායම් බදු සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු ගොනු කිරීම | 62 |
| 4.4 වගුව | : | 2023 වර්ෂයේ දී අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ අත්තිකාරම් ආදායම් බදු වාර්තා ගොනු කිරීම | 63 |
| 4.5 වගුව | : | විශාල බදුගෙවන්නන් සඳහා නියමිත කාලයේදී එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කිරීම | 64 |
| 4.6 වගුව | : | විශාල බදු ගෙවන්නන්ගේ අංශයට අදාළ නොවන වෙනත් ලියාපදිංචි බදු ගෙවන්නන් එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කිරීම | 65 |
| 4.7 වගුව | : | විගණන පිළිබඳ විස්තර | 65 |
| 4.8 වගුව | : | සංස්ථාපිත සහ වෙනත් අංශ මගින් රැස් කරන ලද අතිරේක බදු වර්ගීකරණය (දණ්ඩන හැර) | 66 |
| 4.9 වගුව | : | ගෙවීම් පැහැර හැර ඇති බදු එකතු කිරීම සඳහා ගොනු කර ඇති නඩු | 66 |

| | | | |
|---|---|---|---|
| 6.1 වගුව | : | 2023 වර්ෂයේ නිශ්චිත කාර්ය සාධන දර්ශක | 66 |
| 6.2 වගුව | : | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශකවල සාරාංශය | 82 |
| 6.3 වගුව | : | තිරසාර සංවර්ධන අරමුණු පදනම් කර ගත් දේශීය ආදායම් දෙපාර්තමේන්තු ක්‍රියාකාරකම් | 82 |
| 8.1 වගුව | : | 2023.12.31 දිනට කාර්ය මණ්ඩලය | 83 |
| 8.2 වගුව | : | 2023.12.31 දිනට කාර්ය මණ්ඩල සාරාංශය | 117 |
| 8.3 වගුව | : | 2023 වර්ෂය තුළ විශ්‍රාමයාම් | 119 |
| 8.4 වගුව | : | වෙනත් විශ්‍රාමයාම් | 120 |
| 8.5 වගුව | : | වයස අනුව දේශීය ආදායම් සේවයේ නිලධාරී වර්ගීකරණය | 121 |
| 8.6 වගුව | : | දේශීයව පවත්වන ලද මානව සම්පත් සංවර්ධන වැඩසටහන් | 122 |
| 8.7 වගුව | : | 2023 වර්ෂයේ දී දේශීය ආදායම් සේවයේ නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු පන්ති සහ පරීක්ෂණ | 123 |
| 8.8 වගුව | : | 2023 වර්ෂයේ දී රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සඳහා පවත්වන ලද පුහුණු පාඨමාලා | 124 |

# සටහන් ලේඛනය


| | | |
|---|---|---|
| සටහන 3.1 : | රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය | 38 |
| සටහන 3.2 : | රජයේ බදු ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය | 39 |
| සටහන 3.3 : | එකතු කළ සමස්ත ආදායම - 2023 | 40 |
| සටහන 3.4 : | 2023 හා 2022 වසරවල සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු එකතුව | 42 |
| සටහන 3.5 : | ඒ ඒ අංශය අනුව එකතු කළ අගය මත බදු රැස් කිරීම | 43 |
| සටහන 3.6 : | දළ දේශීය නිෂ්පාදිතයට එකතු කළ අගය මත බද්ද  දක්වන දායකත්වය ඒ ඒ අංශය අනුව විශ්ලේෂණය කිරීම | 44 |
| සටහන 3.7 : | 2023 වසරේ ආදායම 2022 වසරේ ආදායම සමග සන්සන්දනය කිරීම | 47 |
| සටහන 8.1 : | වයස අනුව දේශීය ආදායම් සේවයේ නිලධාරී වර්ගීකරණය | 121 |

# කෙටි යෙදුම්

| | |
|---|---|
| අ.ආ.බ. | අත්තිකාරම් ආදායම් බද්ද |
| අ.පු.ආ.බ. | අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද |
| අ.බ. | අනෙකුත් බදු |
| ආ.බ. | ආදායම් බද්ද |
| උ.වි.ගෙ. | උපයන විට  ගෙවීමේ බද්ද |
| එ.අ.බ. | එකතු කළ අගය මත බද්ද |
| එ.ජ.ඩො. | එක්සත් ජනපද ඩොලර් |
| ජා.ගො.බ. | ජාතිය ගොඩනැගීමේ බද්ද |
| ණ.ආ.ගෙ.බ. | ණය ආපසු ගෙවීමේ බද්ද |
| ති.සං.අ. | තිරසාර සංවර්ධන අභිමතාර්ථ |
| ද.දේ.නි. | දළ දේශීය නිෂ්පාදිතය |
| දේ.ආ.දෙ. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| මු.රෙ. | මුදල් රෙගුලාසි |
| ර.ගැ.බ. | රඳවා ගැනීමේ බද්ද |
| ස.ආ.දා.බ. | සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද |

01

පරිච්ඡේදය

# ආයතනික පැතිකඩ



# 1.1 හැඳින්වීම

## 1.1.1 දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

රටක බදු පරිපාලනය එහි මූල්‍ය යටිතල පහසුකම්වල මුල් ගල බඳුය. ශ්‍රී ලංකාව තුළ බදු පරිපාලක කාර්යය ඉටු කරනු ලබන ආයතනය වනුයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවයි.

ආදායම් එකතු කිරීම, බදු අනුකූලතාව කළමනාකරණය කිරීම සහ බදු පිළිබඳ නීති ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම දරනු ලබන ප්‍රධානතම ආයතනය වශයෙන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රටෙහි මූල්‍ය ස්ථාවරභාවය සහතික කිරීම පිළිබඳව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි ඉතිහාසය දශක 09ක් පමණ අතීතයකට දිව යයි. බදු අය කිරීම සඳහා පරිපාලනමය ආයතනයක අවශ්‍යතාවය සපුරාලමින් 1932 වසරේදී ආදායම් බදු දෙපාර්තමේන්තුව පිහිටවනු ලැබිණි. පසුව, 1933 වසරේදී බූදල් බද්ද සහ මුද්දර බද්ද, ආදායම් දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධ කරනු ලැබූ අතර, දෙපාර්තමේන්තුව ආදායම් බදු, බූදල් බදු සහ මුද්දර බදු දෙපාර්තමේන්තුව වශයෙන් නම් කරන ලදී. 1958 සිදු කරන ලද කැල්ඩෝර් ප්‍රතිසංස්කරණවලින් පසු එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ලෙස නම් කරන ලදී. අනතුරුව එය 1974 වසරේදී ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය ලෙස දෙපාර්තමේන්තුගත සේවයක් ලෙස ස්ථාපිත කරනු ලැබූ අතර, ඉතා ඉහළ දක්ෂතාවයන් සහිත බදු වෘත්තිකයන්ගෙන් සැදුම්ලත් රාජ්‍ය දෙපාර්තමේන්තුවක් බවට පත්විය. වර්තමානය වන විට මෙම දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන බදු රාශියක් පවතී. එනම්, සංස්ථාපිත ආදායම් බද්ද, පුද්ගල ආදායම් බද්ද, එකතු කළ අගය මත බද්ද, ඔට්ටු හා සූදු බද්ද , මුද්දර බද්ද, ප්‍රාග්ධන ලාභ බද්ද, කොටස් ගනුදෙනු බද්ද, සංක්‍රමණික බද්ද, ප්‍රේෂණ ගාස්තු, අධිභාර බද්ද, ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්දය. ඊට අමතරව, අත්තිකාරම් ආදායම් බද්ද සහ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද යන බදු ක්‍රම ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වේ.

ඉහත සඳහන් බදු පරිපාලනයේදී, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින්, බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීම, බදු වාර්තා ගොනු කිරීම සඳහා පහසුකම් සැලසීම සහ ගෙවීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීම, ආරවුල් නිරාකරණය කිරීම, බදු ගෙවන්නන් දැනුම්වත් කිරීම, අනෙකුත් රාජ්‍ය ආයතන සඳහා බදු පිළිබඳ තොරතුරු ලබා දීම ආදී සේවාවන් ඉටු කරනු ලබයි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි කළමනාකාරීත්වය, කොමසාරිස් ජනරාල්, නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් (09) ජ්‍යෙෂ්ඨ කොමසාරිස් (22) කොමසාරිස් (90) යන තනතුරුවලින් සමන්විත වේ. එහි මෙහෙයුම් මට්ටමෙහි කාර්ය මණ්ඩලය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්, නියෝජ්‍ය කොමසාරිස් සහ සහකාර කොමසාරිස් යන තනතුරුවලින් සැදුම්ලත් ඒකාබද්ධ කාර්ය මණ්ඩලයක් වේ. ඊට අමතරව, ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය, ශ්‍රී ලංකා භාෂා පරිවර්තක සේවය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය සහ කළමනාකරණ සේවා නිලධාරී සේවය වැනි අනෙකුත් සේවාවන්ට අයත් කාර්ය මණ්ඩලයන් ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ සහායක සේවාවන් සඳහා සේවයෙහි යෙදී සිටී.

රටේ ප්‍රධාන බදු පරිපාලකයා වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වාර්ෂිකව රජයේ බදු ආදායමෙන් 50%කට වඩා එකතු කරයි.

### 1.1.2 දැක්ම හා මෙහෙවර ප්‍රකාශය

# දැක්ම

මනා පුහුණුවක් සහ කැපවීමක් සහිත කාර්ය මණ්ඩලයකින් යුතුව බදු ගෙවන ජනතාව උදෙසා මා හැගි සේවයක් ඉටු කරන්නා වූ, බදු ගෙවන්නා කෙරෙහි බදු හිතෛෂී බදු පරිපාලකයෙක් බවට පත්වීම

# මෙහෙවර

බදු ගෙවීම කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාව දිරි ගැන්වීම මගින් මෙන්ම බදු ගෙවීම පැහැර හැරීම හා මග හැරීම වළක්වාලීම මගින් අදාළ බදු නීති හා අනෙකුත් අණ පනත්වලට යටත්ව බදු අය කිරීම

බදු හා ආශ්‍රිත ව්‍යවස්ථාවන් සාධාරණව, එක සමානව, ආචාරශීලීව ක්‍රියාවට නැංවීම මගින් බදු ක්‍රමයේ අවංකභාවය හා කාර්යක්ෂමතාව කෙරෙහි මහජන විශ්වාසය පවත්වාගෙන යාමට කටයුතු කිරීම

### 1.1.3 ප්‍රධාන අරමුණු හා ඉලක්ක

- රජයේ ආදායම් ඉලක්ක සපුරා ගැනීම
- ස්වේච්ඡා බදු ගෙවන්නන්ගේ අනුකූලතාව සහ ස්වයං තක්සේරුව සඳහා පහසුකම් සැලසීම
- මෙහෙයුම් නොකරන මූලස්ථානයක් විසින් අධීක්ෂණය කරනු ලබන බණ්ඩනය මත පදනම් වූ ඵලදායී කඩිසර සංවිධානයක් ගොඩනැගීම
- කාර්ය මණ්ඩලයේ නිපුණතා හා වෘත්තීය දක්ෂතා මෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඍජුබව, ඵලදායිතාව සහ අනුවර්තනය වීමේ හැකියාව ශක්තිමත් කිරීම
- විධිමත් ව්‍යාපාර ක්‍රියාවලි, තාක්ෂණය සහ දත්ත උපයෝගී කර ගනිමින් බදු ගෙවන්නන් වෙත ලබා දෙන සේවා වැඩිදියුණු කිරීම
- සමීපව සහයෝගයෙන් කටයුතු කර පාර්ශ්වකරුවන් සමග විශ්වසනීය සබඳතා ගොඩනගා ගැනීම

# 1.2 සංවිධාන ව්‍යුහය


ආයතනික ව්‍යුහය - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2023.12.31 දිනට
කොමසාරිස් ජනරාල්
නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්
ජ්‍යෙෂ්ඨ කොමසාරිස්
කොමසාරිස්
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
බදු පරිපාලන - විශාල බදු ගෙවන්නන්
විශාල බදුගෙවන්නන්ගේ මූල්‍ය අංශ සහ ඉහළ ශුද්ධ වටිනාකම් සහිත බදුගෙවන්නන්ගේ අංශය (සංස්ථාපිත නොවන)
බැංකු අංශය 1
බැංකු අංශය 2
ඉහළ ආදායම් සංස්ථාපිත නොවන අංශය
විශාල බදු ගෙවන්නන්ගේ නිෂ්පාදන අංශය
නිෂ්පාදන අංශය 1
නිෂ්පාදන අංශය 2
විශාල බදු ගෙවන්නන්ගේ සේවා අංශ සහ තොග හා සිල්ලර අංශය
සේවා අංශය 1
සේවා අංශය 2
තොග හා සිල්ලර අංශය
විශාල බදු ගෙවන්නන්ගේ අංශ - විමර්ශන, අවදානම් කළමනාකරණ, ආදායම් අධීක්ෂණ සහ බුද්ධි
ආදායම් අධීක්ෂණ අංශය
අවදානම් කළමනාකරණ අංශය
විමර්ශන අංශය
බුද්ධි අංශය
විශාල බදු ගෙවන්නන්ගේ අභියාචනා, හිඟ බදු අයකර ගැනීම් සහ ආපසු ගෙවීම්
විශාල බදු ගෙවන්නන්ගේ ආපසු ගෙවීම් අංශය
විශාල බදු ගෙවන්නන්ගේ හිඟ බදු අයකර ගැනීම් අංශය
විශාල බදු ගෙවන්නන්ගේ අභියාචනා අංශය
උපාය මාර්ගික මෙහෙයුම්, අනුකූලතා සහාය සහ ඩිජිටල් පරිවර්තන
උපාය මාර්ගික මෙහෙයුම් සහ අනුකූලතා සහාය
උපාය මාර්ගික මෙහෙයුම්,අනුකූලතා සහාය
තොරතුරු තාක්ෂණ පරිපාලන සහ ගෙවීම් හා සැසඳුම්
මධ්‍ය සැකසුම් අංශය
ගෙවීම් හා සැසඳුම් අංශය
තොරතුරු තාක්ෂණ පරිපාලන සේවා අංශය
දත්ත මධ්‍යස්ථානය සහ දත්ත ප්‍රතිසාධන අංශය
ව්‍යාපාර අවශ්‍යතා පද්ධති සහාය අංශය (වෙනස්වීම් කළමනාකරණ)
බදු පරිපාලන - ඉහළ සංස්ථාපිත
ඉහළ සංස්ථාපිත මූල්‍ය, නිෂ්පාදන හා සේවා
මූල්‍ය අංශය 1
මූල්‍ය අංශය 2
සේවා අංශය 1
නිෂ්පාදන අංශය 1
නිෂ්පාදන අංශය 2
ඉහළ සංස්ථාපිත - සේවා සහ තොග හා සිල්ලර
සේවා අංශය 2
සේවා අංශය 3
සේවා අංශය 4
තොග හා සිල්ලර අංශය 1
තොග හා සිල්ලර අංශය 2
ඉහළ සංස්ථාපිත - ආපසු ගෙවීම්, අභියාචනා සහ හිඟ බදු අයකර ගැනීම්
ඉහළ සංස්ථාපිත ආපසු ගෙවීම් අංශය (විශාල බදු ගෙවන්නන් නොවන)
ඉහළ සංස්ථාපිත හිඟ බදු අයකර ගැනීම් අංශය
ඉහළ සංස්ථාපිත අභියාචනා අංශය
රඳවා ගැනීම් බදු, උපයන විට ගෙවීම්,මුද්දර ගාස්තු,ඔට්ටු සහ සූදු බදු, ප්‍රාග්ධන ලාභ බදු සහ SVAT
උපයන විට ගෙවීම් සහ රඳවා ගැනීම් බදු විගණන අංශය
මුද්දර ගාස්තු සහ ඔට්ටු සහ සූදු බදු අංශය
ප්‍රාග්ධන ලාභ බදු අංශය
මිල පැවරුම්, පර්යේෂණ, විමර්ශන සහ ජාත්‍යන්තර අංශය
විමර්ශන (විශාල බදු අංශ හැර) අංශය
මිල පැවරුම් අංශය
පර්යේෂණ සැලසුම් සහ නවෝත්පාදන අංශය
ජාත්‍යන්තර ව්‍යාපාර අනුකූලතාව සහ බලාත්මක (නිර්වාසික) අංශය
බදු පරිපාලන - මධ්‍ය පරිමාණ සංස්ථාපිත
මධ්‍ය පරිමාණ අනුකූලතා සහ විගණන
මූල්‍ය අංශය
නිෂ්පාදන අංශය
සේවා අංශය 1
සේවා අංශය 2
සේවා අංශය 3
තොග හා සිල්ලර අංශය 1
තොග හා සිල්ලර අංශය 2
තොග හා සිල්ලර අංශය 3
මධ්‍ය පරිමාණ - ආපසු ගෙවීම්, අභියාචනා හිඟ බදු අයකර ගැනීම්
මධ්‍ය පරිමාණ ආපසු ගෙවීම් අංශය
ලෙගසි
පැහැර හරින ලද බදු අයකර ගැනීම් අංශය
මධ්‍ය පරිමාණ හිඟ බදු අයකර ගැනීම් අංශය
මධ්‍ය පරිමාණ අභියාචනා අංශය
බදු පරිපාලන - නගරබද සහ ප්‍රාදේශීය
නගරබද, නගරබද සංස්ථාපිත සේවා නියුක්ති, VIP & RTP සහ සංස්ථාපිත නොවන අභියාචනා
VIP & RTP
මැද කොළඹ මෙට්‍රෝ අංශය
කොළඹ නගරබද මෙට්‍රෝ අංශය සහ බදු සේවා අංශය
කොළඹ දකුණ මෙට්‍රෝ සහ සැකසුම් අංශය
කොළඹ නැගෙනහිර මෙට්‍රෝ අංශය
කොළඹ බටහිර මෙට්‍රෝ අංශය
නගරබද සංස්ථාපිත සේවා නියුක්ති අංශය
සංස්ථාපිත නොවන අභියාචනා
ප්‍රාදේශීය සංස්ථාපිත හා සංස්ථාපිත නොවන
කළුතර ප්‍රාදේශීය කාර්යාලය
නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය
ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය
මාතර ප්‍රාදේශීය කාර්යාලය
බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය
රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය
මහනුවර ප්‍රාදේශීය කාර්යාලය
දඹුල්ල ප්‍රාදේශීය කාර්යාලය
යාපනය ප්‍රාදේශීය කාර්යාලය
අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය
මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය
කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය
කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලය
මීගමුව ප්‍රාදේශීය කාර්යාලය
ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය
මානව ප්‍රාග්ධන, මානව සම්පත් සහ වත්කම් පරිපාලන
මානව සම්පත් කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන
මානව සම්පත් කළමනාකරණ අංශය
මානව සම්පත් සංවර්ධන අංශය
අධ්‍යක්ෂ - මානව සම්පත්
ප්‍රසම්පාදන හා වත්කම් කළමනාකරණ
ප්‍රසම්පාදන හා වත්කම් කළමනාකරණ අංශය
ඉංජිනේරු
බදු ප්‍රතිපත්ති - නීති සම්පාදන, ජාත්‍යන්තර බදු සබඳතා සහ නීති
බදු ප්‍රතිපත්ති, ජාත්‍යන්තර බදු සබඳතා සහ නීති
ජාත්‍යන්තර බදු ප්‍රතිපත්ති අංශය
බදු ප්‍රතිපත්ති සහ නීති සම්පාදන අංශය
නීති අංශය
පාරිභෝගික සේවා සහ ප්‍රවර්ධන
ප්‍රාථමික ලියාපදිංචිය , බදු ලියාපදිංචිය සහ බදුගෙවන්නන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම
ප්‍රාථමික ලියාපදිංචි අංශය
බදු ලියාපදිංචි අංශය
බදු ගෙවන්නන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීමේ අංශය
පාරිභෝගික උපකාරක සහ ප්‍රවර්ධන, ව්‍යාපාර උපදේශන සහ මධ්‍යම ලේඛන කළමනාකරණ
පාරිභෝගික උපකාරක සහ ප්‍රවර්ධන
මධ්‍යම ලේඛන කළමනාකරණ අංශය
ව්‍යාපාර උපදේශන අංශය
ස්වාධීන අභ්‍යන්තර කාර්ය පරිපාලන
වංචා වැළැක්වීමේ හා අභ්‍යන්තර විමර්ශන සංස්ථාපිත අංශය
ප්‍රධාන මූල්‍ය නිලධාරී

### 1.2.1 කළමනාකරණ කණ්ඩායම

### 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන නිලධාරීන්

| | |
|---|---|
| ඩී.යූ.ඒ. ජයවර්ධන මයා | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (වැඩ බලන) |

**නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරුන්**

| | |
|---|---|
| එම්.එස්.එම්. සියාන් මයා | බදු පරිපාලන - ඉහළ සංස්ථාපිත |
| ඩී.යූ.ඒ. ජයවර්ධන මයා | උපායමාර්ගික මෙහෙයුම් හා අනුකූලතා සහාය සහ ඩිජිටල් පරිවර්තන |
| ඩබ්ලිව්.ඒ.එස්. චන්ද්‍රසේකර මිය | බදු පරිපාලන - මධ්‍ය පරිමාණ සංස්ථාපිත |
| ටී.එම්.ජේ.එන්. බණ්ඩාර මයා | බදු පරිපාලන - විශාල බදු ගෙවන්නන් |
| එච්.ඩබ්ලිව්.එන්.කේ. තල්අරඹ මිය | මානව සම්පත් කළමනාකරණ, මානව සම්පත් සංවර්ධන සහ ප්‍රසම්පාදන හා වත්කම් පරිපාලන |
| ආර්.පී.එච්. ප්‍රනාන්දු මිය | බදු ප්‍රතිපත්ති, නීති සම්පාදන, ජාත්‍යන්තර බදු සබඳතා සහ නීති |
| බී.කේ.එස්. ශාන්ත මයා | ප්‍රභව බදු, ජාත්‍යන්තර බදු විගණන, විමර්ශන (විශාල බදු අංශ හැර), මිල පැවරුම් සහ පර්යේෂණ සැලසුම් සහ නවෝත්පාදන |
| එම්.ඩී. ආනන්දසිරි මයා | පාරිභෝගික සේවා සහ ප්‍රවර්ධන |
| එස්.පී. රණසිංහ මිය | බදු පරිපාලන - නගරබද සහ ප්‍රාදේශීය |

**ජ්‍යේෂ්ඨ කොමසාරිස්වරුන්**

| | |
|---|---|
| ජේ.ඒ.ඩී.ඩබ්ලිව්.කේ. සිරිවර්ධන මිය | ප්‍රාථමික ලියාපදිංචිය, බදු ලියාපදිංචිය සහ බදු ගෙවන්නන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම |
| යූ.ඩී.එන්. ජයවීර මයා | තොරතුරු තාක්ෂණ පරිපාලන සේවා, වෙනස්වීම් සහ ගෙවීම් සහ සැසඳුම් |
| ජේ.ඩී. රණසිංහ මිය | විශාල බදු ගෙවන්නන්ගේ අභියාචනා, හිඟ බදු අයකරගැනීම් සහ ආපසු ගෙවීම් |
| ආචාර්ය එන්.ටී.ඒ. දිසානායක මිය | විශාල බදු ගෙවන්නන්ගේ සේවා අංශ සහ තොග සහ සිල්ලර අංශය |
| ඩී.එම්.එන්.එස්.බී. දිසානායක මයා | රඳවාගැනීම් බදු / අත්තිකාරම් ආදායම් බදු, උපයන විට ගෙවීමේ බදු / අත්තිකාරම් පුද්ගල ආදායම් බදු, ඔට්ටු සහ සූදු බදු, ප්‍රාග්ධන ලාභ බදු සහ සරල කරන ලද එකතු කළ අගය මත බදු |
| වී.කේ.ඒ. තුසිතාංජලී මිය | ඉහළ සංස්ථාපිත සේවා අංශ 2-4 සහ තොග සහ සිල්ලර අංශ |
| ටී.යූ. අතුකෝරළ මයා | ප්‍රසම්පාදන සහ වත්කම් කළමනාකරණ |
| යූ.එල්.යූ.කේ. පෙරේරා මයා | ඉහළ සංස්ථාපිත - ආපසු ගෙවීම්, RAMIS කාලසීමාවට අදාළ අභියාචනා, හිඟ බදු අයකරගැනීම සහ නිර්වාසික ව්‍යාපාර - ආපසු ගෙවීම් |

| | |
|---|---|
| ඩබ්ලිව්.එම්.ආර්. බණ්ඩාර මයා | මානව සම්පත් කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන |
| ආර්.ඒ.එස්. රාජපක්ෂ මෙනවිය | මධ්‍ය පරිමාණ සංස්ථාපිත මූල්‍ය, නිෂ්පාදන, සේවා සහ තොග සහ සිල්ලර අංශ |
| එල්.කේ. රත්නායක මයා | උපායමාර්ගික මෙහෙයුම් සහ අනුකූලතා සහාය |
| ජේ.එම්.එස්.එස්. රත්නවර්ධන මයා | බදු ප්‍රතිපත්ති, නීති සම්පාදන, ජාත්‍යන්තර බදු සබඳතා සහ නීති |
| කේ.ජී.පී.කේ. ධර්මවර්ධන මයා | විශාල බදු ගෙවන්නන්ගේ නිෂ්පාදන අංශ |
| එන්.එම්.ඒ.කේ.බී. නාපාන මයා | විශාල බදු ගෙවන්නන්ගේ අංශ - විමර්ශන, අවදානම් කළමනාකරණ, ආදායම් අධීක්ෂණ සහ බුද්ධි |
| ඩී.එල්. සමරවික්‍රම මිය | පාරිභෝගික උපකාරක සහ ප්‍රවර්ධන, ව්‍යාපාර උපදේශන සහ මධ්‍යම ලේඛන කළමනාකරණ |
| එච්.එස්.එස්. කුමාර මයා | විශාල බදු ගෙවන්නන්ගේ මූල්‍ය අංශ සහ ඉහළ ශුද්ධ වටිනාකම් සහිත බදු ගෙවන්නන්ගේ අංශය |
| වී.ජී.ආර්. කුමාර මයා | ප්‍රාදේශීය සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන |
| එම්.එන්. පුෂ්පලතා මිය | මධ්‍ය පරිමාණ සංස්ථාපිත ආපසු ගෙවීම්, අභියාචනා, හිඟ බදු අය කරගැනීම්, ලෙගසි සහ පැහැර හරින ලද බදු අය කරගැනීම් |
| එම්.කේ.පී.ජේ.එස්.එස්. පෙරේරා මයා | ඉහළ සංස්ථාපිත - මූල්‍ය සහ නිෂ්පාදන අංශ, සේවා අංශ 1 |
| අයි.වී. ජයරත්න මයා | නගරබද, නගරබද සංස්ථාපිත සේවා නියුක්ති, VIP & RTP සහ සංස්ථාපිත නොවන අභියාචනා |
| ටී.එම්.එස්.එම්. තෙන්නකෝන් මිය | විමර්ශන (විශාල බදු අංශ හැර), නිර්වාසික ව්‍යාපාර අනුකූලතා හා බලාත්මක කිරීම, මිල පැවරුම් සහ පර්යේෂණ සැලසුම් හා නවෝත්පාදන |
| එස්.ඩී.සී. මල්කාන්ති මිය | ස්වාධීන අභ්‍යන්තර කාර්යය පාලන |

# 02
පරිච්ඡේදය

# බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම



## 2.1 හැඳින්වීම

ආර්ථික ක්‍රියාකාරකම්, ආදායම් බෙදී යාම සහ සමාජ යහපැවැත්ම හැඩගැස්වීමේදී බදු ප්‍රතිපත්තිය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. එහි වැදගත්කම තනි පුද්ගල සහ ව්‍යාපාරික තීරණ, සමාජමය ප්‍රතිඵල සහ පුළුල් සාර්ව ආර්ථික පරිසරයට බලපෑම් කරමින් හුදු ආදායම් උත්පාදනයෙන් ඔබ්බට විහිදේ. බදු ක්‍රමය හැඩගැස්වීමේදී, බදු නීති සම්පාදනය කිරීමේදී සහ බදු ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් උපාය මාර්ගික මාර්ගෝපදේශ ලබාදීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. එහි දී, බදු ප්‍රතිපත්ති අංශයේ ප්‍රමුඛ අරමුණ වන්නේ සාධාරණ, කාර්යක්ෂම මෙන්ම ඵලදායී බදු එකතු කිරීමේ සහ බලාත්මක කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීමය. රජයේ බදු ප්‍රතිපත්තියේ මූලික අරමුණු වන පොදු සේවා වෙත අරමුදල් සම්පාදනය කිරීම සඳහා ආදායම් උත්පාදනය කිරීම, ධනය යළි බෙදා හැරීම, ආර්ථික ස්ථාවරත්වය ඇති කිරීම සහ යෝග්‍ය අංශ දිරිගැන්වීම වැනි මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා බදු ප්‍රතිපත්ති අංශය මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සමග සමීපව කටයුතු කරනු ලැබේ. මෙම කර්තව්‍යයේ දී, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව බදු ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වන සාධාරණත්වය, කාර්යක්ෂමතාව, සරල බව, විනිවිදභාවය සහ පරිපාලනය කිරීමේ හැකියාව වැනි මූලික මූලධර්ම අනුගමනය කරනු ඇත.

මුදල් අමාත්‍යාංශය විසින් බදු ප්‍රතිපත්ති සම්පාදනය කළ පසු, සාමාන්‍යයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය නීති සම්පාදනය කිරීමට හෝ පවතින බදු නීති සංශෝධනය කිරීමට සම්බන්ධ වේ. මේ සඳහා නෛතික රාමු, මූලධර්ම, බදු රෙගුලාසි සහ පරිපාලන ක්‍රියා පටිපාටි පිළිබඳ ගැඹුරු අවබෝධයක් අවශ්‍ය වේ. යෝජිත බදු ප්‍රතිසංස්කරණ සඳහා යෙදවුම් රැස් කිරීමට සහ බදු ප්‍රතිපත්ති හොඳින් පිළිගෙන විධිමත්ව ක්‍රියාත්මක වන බව සහතික කිරීමට බදු ප්‍රතිපත්ති අංශය බොහෝ විට වාණිජ මණ්ඩල, කර්මාන්ත සංගම්, බදු විශේෂඥයින් සහ වෙනත් රාජ්‍ය ආයතන ඇතුළු විවිධ පාර්ශ්වකරුවන් සමග සම්බන්ධ වී කටයුතු කරයි. මීට අමතරව, මෙම අංශය දේශසීමා ගනුදෙනු, මිල පැවරුම්, ද්විත්ව බදු ගිවිසුම් සඳහා සාකච්ඡා කිරීම වැනි ජාත්‍යන්තර බදුකරණ ගැටලු හා සම්බන්ධ කටයුතුවල නිරත වන අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, පොදු රාජ්‍ය මණ්ඩලීය බදු පරිපාලකයින්ගේ සංගමය වැනි අනෙකුත් ජාත්‍යන්තර නියෝජිතායතන සමග මෙන්ම බදු අධිකාරීන් සමග සහයෝගීතාව පවත්වා ගනිමින් කටයුතු කරයි.

## 2.2 බදු නීති සංශෝධනය කිරීම සඳහා 2023 වර්ෂයේ පනවන ලද නීති

පාර්ලිමේන්තුව විසින් පහත සඳහන් සංශෝධන සම්මත කරන ලද අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙම වර්ෂය තුළ දී එම සංශෝධන ක්‍රියාත්මක කරන ලදී.

මෙම පරිච්ඡේදය මගින් ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කරනු ලබන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන බදු නීතිවලට 2023 වර්ෂය තුළ ගෙන එන ලද වෙනස්කම් පිළිබඳව ය. එම වෙනස්කම් කෙටි විස්තර සහිතව මෙහි ඉදිරිපත් කර ඇත.

- 2023 අංක 4 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත
- 2023 අංක 14 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත
- 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත
- 2023 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (සංශෝධන) පනත
- 2023 අංක 11 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත

### 2.2.1 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සිදු කරන ලද සංශෝධන

ආදායම් බදු හා සම්බන්ධ බදු ප්‍රතිපත්ති වෙනස්කම් කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් සංශෝධන පනත් දෙකක් සම්මත කරන ලදී.

**2.2.1.1 2023 අංක 4 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත**

ගරු කථානායකතුමා විසින් 2023 මැයි 08 වන දින සහතික කරන ලද 2023 අංක 04 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් හඳුන්වාදෙන ලද බදු ප්‍රතිපත්ති වෙනස්කම් පහත පරිදි වේ.

- **සාමාන්‍ය අඩු කිරීම් - දේශීය ආදායම් පනතෙහි 10 (2අ) වගන්තිය**

  බැංකු සහ මූල්‍ය ආයතන හරහා වෙනත් ක්‍රම මගින් සිදු කරන ගෙවීම් දිරිමත් කරන අතරම මුදල් භාවිතයෙන් සිදු කරනු ලබන ගෙවීම් අධෛර්යවත් කිරීම සඳහා ප්‍රතිපාදන හඳුන්වා දී ඇත. ඒ අනුව,

  (අ) යම් තැනැත්තකු විසින් වෙනත් තැනැත්තකුට බැංකු ගිණුමක් මාර්ගයෙන් (චෙක්පතක් / බැංකු අණකරයක් මගින්, හෝ ණය / හර කාඩ්පතක් මගින් හෝ ඉලෙක්ට්‍රොනික ගෙවීම් පද්ධතියක් භාවිතයෙන්) හැර වෙනත් යම් ආකාරයකින් තනි ගනුදෙනුවක් සඳහා හෝ යම් එක් අවස්ථාවකට අදාළ තනි ගනුදෙනු මාලාවක් සඳහා දිනකට රු.500,000කට වැඩි මුදල් ප්‍රමාණයක් ගෙවනු ලබන අවස්ථාවක, බදු කාර්යයන් සඳහා එම ගෙවීම සිදු කරන තැනැත්තාගේ ආදායම ගණනය කිරීමේ දී කිසිදු අඩු කිරීමකට ඉඩ දෙනු නොලැබේ. එමෙන්ම, එම තැනැත්තා විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණ, දේශීය ආදායම් පනතේ අරමුණු සඳහා, වත්කමක් අත්පත් කර ගැනීමේ පිරිවැයක් ලෙස සලකනු නොලැබිය යුතු ය. තවද, මුදල් භාවිතයෙන් ගෙවීම් කර ඇති එම මුදල් ප්‍රමාණ, ප්‍රාග්ධන වත්කම් හෝ ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලද ලැබීම් ගණනය කිරීමේ දී හෝ වෙළඳ තොග සඳහා දීමනා, ප්‍රාග්ධන දීමනා සහ තුලනය කිරීමේ දීමනා සඳහා වන කාර්යයන් සඳහා මෙන්ම දේශීය ආදායම් පනතෙහි වෙනත් අරමුණු සඳහා "වත්කමක පිරිවැය" ලෙස දරන ලද සහ අඩු කළ හැකි ප්‍රමාණයන් ලෙස සලකනු නොලැබේ. මෙම විධිවිධානය ක්‍රියාත්මක වන දිනය 2023 මැයි 08 වේ.

  (ආ) **"තනි ගනුදෙනුව"** යන්නෙන්, තනි ඉන්වොයිසියකින්, ලදුපතකින් හෝ ප්‍රකාශයකින් භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීම හෝ ප්‍රසම්පාදනය කිරීම අදහස් වේ. **"බැංකු ගිණුම"** යන්නෙන් ශ්‍රී ලංකාවේ බැංකුවක හෝ මූල්‍ය ආයතනයක පවත්වාගෙන යනු ලබන යම් ගිණුමක් අදහස් වේ.

  (ඇ) මෙම සීමා කිරීම්,

  - ශ්‍රී ලංකා රජය (දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ, පළාත් පාලන ආයතන),
  - ශ්‍රී ලංකා ආණ්ඩුවේ ඕනෑම කටයුත්තක්,
  - රාජ්‍ය සංස්ථා,
  - බැංකු,
  - මූල්‍ය ආයතන (දේශීය ආදායම් පනතෙහි 195 වන වගන්තියේ අර්ථ දක්වා ඇති පරිදි), සහ
  - මුදල් අමාත්‍යවරයා විසින් නියම කරන ලද පුද්ගල පන්ති සහ ගෙවීම් සඳහා අදාළ නොවේ.

- **ගෙවීම් මූලාශ්‍ර - දේශීය ආදායම් පනතෙහි 73 වන වගන්තිය**

  සේවා නියුක්තිය හා සම්බන්ධ ගෙවීම් සඳහා දේශීය ආදායම් පනතේ 73 වන වගන්තියේ පවත්නා මූලාශ්‍ර රීතිවලට අමතරව, නව මූලාශ්‍ර රීතියක් හඳුන්වා දී ඇති අතර, ඒ අනුව, යම් ගෙවීමක් ශ්‍රී ලංකාවේ වාසික වූ ද, ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන්නා වූ ද, සමාගමකින් උපයන ලද ප්‍රමාණයට සේවා නියුක්තිය සම්බන්ධයෙන් ලැබෙන ගෙවීම් සඳහා ශ්‍රී ලංකාව තුළ මූලාශ්‍රයක් තිබිය යුතුය.

- **රඳවා ගැනීම මගින් ගෙවිය යුතු බදු - දේශීය ආදායම් පනතෙහි 84අ/85/86 වගන්ති**

  (අ) 2023.05.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිර්වාසික පුද්ගලයකුට කරන ලද යම් ගෙවීමකින් (බාහිර ප්‍රේෂණ) බදු රඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය නිශ්චිතව දැක්වීමට කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත. නිර්වාසික පුද්ගලයකුට ගෙවීම සිදු කරන අදාළ රඳවා ගැනීමේ අනුයෝජිතයාට අමතරව, මූල්‍ය ආයතනය (අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුව හෝ එවැනි බාහිර ප්‍රේෂණ

ගෙවීමෙහි නිරතව සිටින බලයලත් අලෙවි නියෝජිත) ද එම ක්‍රියා පටිපාටියට අනුකූල විය යුතුය. එම ක්‍රියා පටිපාටියට අනුකූල වීමට අපොහොසත් වන මූල්‍ය ආයතන රු. 50,000/- නොඉක්මවන දඩයකට යටත් විය යුතුය.

(ආ) 85 වැනි වගන්තියේ කාර්යය සඳහා, ශ්‍රී ලංකා රජය "පුද්ගලයකු" ලෙස සලකනු ලබන අතර, ඒ අනුව, ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනයක් හරහා උපයන ලද ගෙවීමක් හැර නිර්වාසික තැනැත්තකුට කරන ලද ගෙවීම්වලින් රඳවා ගැනීමේ බද්ද අඩු කිරීමේ කාර්යය සඳහා රඳවා ගැනීමේ අනුයෝජිතයකු විය යුතුය.

(ඇ) 84අ වගන්තියේ විධිවිධාන යටතේ අත්තිකාරම් ආදායම් බදු අඩු කර ඇති රඳවා ගැනීමේ අනුයෝජිතයන් විසින් තක්සේරු වර්ෂය අවසන් වී දින 30කට පසු (අප්‍රේල් 30 වන දින) ගොනු කළ යුතු වාර්ෂික ප්‍රකාශයට අමතරව කාර්තුමය ප්‍රකාශ තුනක් ගොනු කළ යුතුය. එවැනි කාර්තුමය ප්‍රකාශ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි ජුනි මස තිස්වන දිනෙන්, සැප්තැම්බර් මස තිස්වන දිනෙන් සහ දෙසැම්බර් මස තිස් එක්වන දිනෙන් අවසන් වන සෑම මාස තුනක කාලසීමාවක්ම අවසන් වී දින තිහක් ඇතුළත ගොනු කළ යුතුය.

- **භාණ්ඩාගාර ලේකම්ගේ මතය - දේශීය ආදායම් පනතෙහි 100 වන වගන්තිය**

  කොමසාරිස් ජනරාල්වරයාට යම් බදු විධිවිධානයක් අර්ථ දැක්වීමේ කාර්යය සඳහා එවැනි බදු විධිවිධානයකට අදාළ පාදක බදු ප්‍රතිපත්තිය පිළිබඳව භාණ්ඩාගාර ලේකම්වරයාගේ මතය හෝ නිරීක්ෂණය ලබා ගත හැකිය.

  දේශීය ආදායම් පනතෙහි රහස්‍යතාව පිළිබඳ ප්‍රතිපාදන නොතකා, කොමසාරිස් ජනරාල්වරයාහට, බදු ප්‍රතිපත්තිය සහ රාජ්‍ය ආදායම සම්බන්ධයෙන් තීරණ ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය තොරතුරු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත අනාවරණය කළ හැකිය.

- **බදු වාර්තා - දේශීය ආදායම් පනතෙහි 113 වන වගන්තිය**

  සියලුම බදු ගෙවන්නන් සඳහා ඊ-සේවාව හරහා බදු වාර්තා ගොනු කිරීම (ඊ- ගොනු කිරීම) 2023 අප්‍රේල් 1 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ (2023/24) සිට අනිවාර්ය වේ. කෙසේ වෙතත්, කොමසාරිස් ජනරාල්වරයාට බදු ගෙවන්නන්ගේ සාධාරණ සහ යුක්ති සහගත හේතු මත පදනම්ව ලිඛිත බදු වාර්තා ඉදිරිපත් කිරීමට අවසර ලබා දිය හැකිය.

- **තොරතුරු - දේශීය ආදායම් පනතෙහි 123 වන වගන්තිය**

  පහත සඳහන් ආයතන සහ තැනැත්තන්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ මූල්‍ය ගනුදෙනු පිළිබඳ තොරතුරු ඇතුළු තොරතුරු ඉලෙක්ට්‍රොනික ආකෘතියකින් නිතිපතා කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයීම හෝ ඔවුන් භාරයේ ඇති එවැනි යම් වාර්තා වෙත කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රවේශය ලබා දීම කරනු ලැබිය යුතුය.

  - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා;
  - සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා;
  - මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා;
  - වෙනත් යම් රජයේ ආයතනයක භාණ්ඩ, වැඩ, හෝ උපදේශන සහ උපදේශන නොවන සේවා සැපයීම සඳහා කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම භාර නිලධාරියකු;
  - මූල්‍ය ආයතන;
  - කොටස් හුවමාරු ස්ථාන හෝ
  - නියෝග මගින් නියම කළ හැකි වෙනත් යම් තැනැත්තකු හෝ රජයේ ආයතනයක්.

- **තක්සේරු කිරීම් - දේශීය ආදායම් පනතෙහි 135 වන වගන්තිය**

  දේශීය ආදායම් පනතෙහි 135 වගන්තියේ (2) උපවගන්තියේ (ආ) ඡේදයේ දක්වා ඇති කාල කඩයිම (මාස 30) තුළ හෝ සංශෝධිත තක්සේරුවෙන් වසරක් ඇතුළත සහකාර

කොමසාරිස්වරයාට මුල් තක්සේරුව (සංශෝධිත තක්සේරුවෙන් පසුව) තවදුරටත් සංශෝධනය කළ හැකිය. කෙසේ වෙතත්, මුල් තක්සේරුවේ සංශෝධිත තක්සේරුවට සිදු කරන ලද වෙනස් කිරීම් හෝ එකතු කිරීම් සඳහා පමණක් සංශෝධිත තක්සේරුවේ සිට වසරක කාලයක් පවතී.

- **පරිපාලන සමාලෝචනය - දේශීය ආදායම් පනතෙහි 139 වන වගන්තිය**

  පරිපාලන සමාලෝචනය සඳහා වන යම් ඉල්ලීමක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබී වසර 2ක කාල සීමාවක් ඇතුළත එම ඉල්ලීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් තම තීරණය ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික අකාරයෙන් දැනුම් දිය යුතු ය. එසේ නොමැති නම්, පරිපාලන සමාලෝචනය සඳහා ඉල්ලීම ඉදිරිපත් කර මාස හතකට පසු බදු ගෙවන්නා බදු අභියාචනා කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම් මිස ඉල්ලීම පිළිගත් බව සලකනු ලැබිය යුතුය. මෙම සංශෝධනය 2023 මැයි 08 වැනි දින හෝ ඉන් පසුව කරන ලද සියලුම ඉල්ලීම් සඳහා අදාළ වේ.

- **ආදායම් බදු ආපසු ගෙවීමේ පටිපාටිය - දේශීය ආදායම් පනතෙහි 150 වන වගන්තිය**

  (අ) බදු ගෙවන්නකුට, ආපසු ගෙවීමේ හිමිකම් පෑමක් සම්බන්ධයෙන් වන බදු විගණනයකට (බදු නිලධාරියකු විසින් සිදු කරනු ලබන) පෙරාතුව, තමන් විසින් ගෙවිය යුතු පසු ආදායම් බද්දට එරෙහිව ආපසු ගෙවිය යුතු මුදලෙන් 60%ක් හිලව් කර ගන්නා ලෙස ඉල්ලා සිටිය හැකිය.

  (ආ) වාසික තැනැත්තන්ට තමන්ගේ රුපියල් 100,000ට වඩා අඩු මුදල් ආපසු ගෙවීමේ හිමිකම් පෑම්, බදු නිලධාරියකු විසින් බදු විගණනයක් සිදු කිරීමට පෙරාතුව, හිමිකම් පෑමෙන් මාස 3ක කාල සීමාවක් ඇතුළත ලබා ගැනීමට හිමිකම ඇත. තවද, එවැනි පුද්ගලයකු ජ්‍යෙෂ්ඨ පුරවැසියකු වන්නේ නම් (දේශීය ආදායම් පනතෙහි 195 වගන්තියේ අර්ථ දක්වා ඇති පරිදි), මෙන්ම සිය හිමිකම් පෑම රු. 25,000ට වඩා අඩු වන කල්හි, එම කොන්දේසිවලටම යටත්ව, ඔහු සෑම මාස 3ක කාල සීමාවකට වරක්ම (ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 සහ මාර්තු 31 දිනෙන් අවසන් වන) මුදල් ආපසු ගෙවීමේ හිමිකම් පෑම් සඳහා හිමිකම ලබයි. මෙම මුදල් ආපසු ගෙවීමේ ආකාරය සහ ක්‍රියා පටිපාටිය කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රකාශයට පත් කර ඇත.

- **ලාභාංශ බදුකරණය - දේශීය ආදායම් පනතෙහි පළමුවන උපලේඛනය**

  (අ) වාසික සමාගමක් විසින් නිර්වාසික පුද්ගලයකුට 2022 ඔක්තෝබර් 1 වන දින සිට 2022 දෙසැම්බර් 31 වන දින දක්වා කාල සීමාව තුළ ගෙවනු ලබන ලාභාංශ ආදායම් බද්දෙන් නිදහස් වේ.

  (ආ) වාසිකයන් (පුද්ගලයින් හෝ ඕනෑම අස්ථිත්වයක්) විසින් 2022/23 තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා වූ ලාභාංශ මත ලබාගත් හෝ උපයා ගත් ලැබීම් සහ ලාභ (බදු කළ හැකි ආදායමෙන් කොටසක් නම්) සඳහා අදාළ ආදායම් බදු අනුප්‍රමාණය 15%කි.

  (ඇ) යම් වාසික සමාගමකට හෝ වෙනත් වාසික සමාගමකට ලැබෙන වෙනත් ලාභාංශයකට ආරෝපණය කළ හැකි, හෝ ව්‍යුත්පන්න වන ප්‍රමාණයට, වාසික සමාගමක් විසින් යම් පුද්ගලයකුට ගෙවනු ලබන ලාභාංශ 2022 ඔක්තෝබර් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ආදායම් බද්දෙන් නිදහස් වේ.

- **දණ්ඩන හෝ පොලී සහන - දේශීය ආදායම් පනතෙහි පළමුවන උපලේඛනය**

  කිසියම් සමාගමක් විසින් 2022.10.01 දින සිට 2022.12.19 දින දක්වා කාල සීමාව සඳහා ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබුණු ලැබීම් මත ගෙවිය යුතු 30%ක ආදායම් බදු ගෙවා නොමැති නමුත්, එම සමාගම විසින් ගෙවනු ලැබිය යුතු නියමිත බදු ප්‍රමාණය (30% බැගින්) 2023.06.30 දින හෝ ඊට පෙර ගෙවන්නේ නම්, එවැනි සමාගමක් දේශීය ආදායම් පනතෙහි විධිවිධාන අනුව යම් දඩ මුදලක් ගෙවීමට හෝ පොලියක් ගෙවීමට යටත් නොවිය යුතුය.

➤ **ආයෝජන මණ්ඩල සමාගම් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ - දේශීය ආදායම් පනතෙහි දෙවන උපලේඛනය**

(අ) ව්‍යවසායක් 2018 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹී ඇත්නම්; සහ

(ආ) ඒ ව්‍යවසායේ ලාභ සහ ආදායම හෝ ඒ ව්‍යවසාය විසින් ගෙවනු ලබන යම් ලාභාංශයක් සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබීමට හෝ අඩු ආදායම් බදු අනුප්‍රමාණයක් අනුව බදු අයකරනු ලැබීමට ඒ ගිවිසුමේ විධිවිධාන සලසා ඇත්නම්,

(ඇ) ඒ ව්‍යවසායේ ඒ ලාභ සහ ආදායම හෝ ඒ ව්‍යවසාය විසින් ගෙවනු ලබන ඒ ලාභාංශය හෝ අවස්ථෝචිත පරිදි, ගෙවිය යුතු ආදායම් බද්දෙන් තවදුරටත් නිදහස් විය යුතු ය; නැතහොත් ඒ ගිවිසුමේ විධිවිධාන සලසා ඇති අනුප්‍රමාණය මත ආදායම් බද්දට යටත් විය යුතුය.

➤ **ආයෝජන දිරිගැන්වීම් - දේශීය ආදායම් පනතෙහි දෙවන උපලේඛනය**

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති යම් තක්සේරු වර්ෂයකදී ස්වකීය පවත්නා ව්‍යවසාය පුළුල් කිරීම සඳහා ආයෝජනය කරන පුද්ගලයකුට දේශීය ආදායම් පනතෙහි දෙවන උපලේඛනයේ 1 ඡේදයේ අදාළ උපඡේදයට යටත්ව අදාළ ප්‍රතිශතයෙන් වැඩි කළ ප්‍රාග්ධන දීමනා ප්‍රදානය කරනු ලැබිය යුතුය.

(ආ) දේශීය ආදායම් පනතෙහි දෙවන උපලේඛනයේ 1 වන ඡේදයේ කාර්යය සඳහා, **"පවතින ව්‍යවසාය"** යන්නෙන් තැනැත්තකු විසින් ක්ෂය විය හැකි වත්කම් මත කරන ලද ආයෝජනයේ පළමු දිනයට පෙරාතුව කරගෙන යන ලද යම් ව්‍යවසායක් අදහස් වේ. **"පුළුල් කිරීම"** යන්නට තැනැත්තකුගේ හෝ තැනැත්තකුගේ ආශ්‍රිතයකුගේ පවතින ව්‍යවසායක ක්ෂය විය හැකි වත්කමක පැවරීමක්, මිලදී ගැනීමක් හෝ හුවමාරු කිරීමක්; හෝ තැනැත්තකුගේ ව්‍යවසායක පවතින ක්ෂය විය හැකි වත්කමක් ප්‍රතියෝජනය කිරීමට ක්ෂය විය හැකි වත්කමක් මිලදී ගැනීමක් ඇතුළත් නොවේ.

➤ **ආදායම් බදු නිදහස් කිරීම් - දේශීය ආදායම් පනතෙහි තුන්වන උපලේඛනය**

නිදහස් කළ මුදල් ප්‍රමාණ පහත පරිදි විය යුතුය.

(අ) රටට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ පිළිබඳව සැලකිල්ලට ගෙන ඒ ව්‍යාපෘතිය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නේ නම් සහ ඒ ව්‍යාපෘතිය සඳහා සම්පූර්ණයෙන් ම විදේශ ප්‍රදානවලින් අරමුදල් සැපයෙන්නේ නම්, ශ්‍රී ලංකා රජයේ ව්‍යාපෘතියක යෙදී සිටින නිර්වාසික තැනැත්තකු විසින් උපයන ලද මුදල් ප්‍රමාණ

(ආ) 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව පනතේ එක් එක් තක්සේරු වර්ෂය සඳහා විධිවිධාන සලස්වා ඇති තාක් දුරට, ඒ පනතේ විධිවිධාන යටතේ අනුමත කර ඇති ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් කරගෙන යන යම් බලයලත් තැනැත්තකු වෙත ලැබෙන හෝ උපයන ලැබීම් සහ ලාභ හා ඒ පනතේ 35 වන වගන්තිය ප්‍රකාරව සේවයේ නියුක්ත කරන ලද සේවා නියුක්තයකුගේ සේවා නියුක්ති ආදායම

(ඇ) අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියකට යටත්ව, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන බවට වූ ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් තීරණයක් හේතුවෙන් ඒ ලැබීම ලැබී ඇත්තේ නම්, ව්‍යාපාරයේ ප්‍රාග්ධන වත්කමක් හෝ බැරකමක් උපලබ්ධි කිරීමක් වශයෙන් හෝ ආයෝජන වත්කමක් උපලබ්ධි කිරීමක් වශයෙන් වූ ලැබීමක් ලෙස ඍජු හෝ වක්‍ර සාමාජිකත්ව සම්බන්ධතාවයෙන් සියයට පනහකට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා ආණ්ඩුවට අයත් අස්ථිත්වයකට ලැබුණු ලැබීමක්

**2.2.1.2 2023 අංක 14 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත**

ගරු කථානායකතුමා විසින් 2023 මැයි 08 වන දින සහතික කරන ලද 2023 අංක 14 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් හඳුන්වාදෙන ලද බදු ප්‍රතිපත්ති වෙනස්කම් පහත පරිදි වේ.

- **සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, අර්ථසාධක, විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික අරමුදල් සහ සමාපන අරමුදල් සඳහා බදු අනුප්‍රමාණ - දේශීය ආදායම් පනතෙහි පළමුවන උපලේඛනය**

  2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඊට පෙරාතුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා සහ 2023 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හයක කාල සීමාව සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ, අනුමත කරනු ලැබූ අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදලක, හෝ අනුමත කරනු ලැබූ සමාපන අරමුදලක බදු අය කළ හැකි ආදායම මත 14%ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතුය.

  2023 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ දෙවන මාස හයක කාල සීමාව සඳහා සහ 2024 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ එදිනට පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ, අනුමත කරනු ලැබූ අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදලක, හෝ අනුමත කරනු ලැබූ සමාපන අරමුදලක බදු අය කළ හැකි ආදායම මත 14%ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතුය.

  2023 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ දෙවන මාස හයක කාල සීමාව සඳහා සහ 2024 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ එදිනට පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සඳහා භාණ්ඩාගාර බැඳුම්කරවලින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, අනුමත කරනු ලැබූ අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදලක්, හෝ අනුමත කරනු ලැබූ සමාපන අරමුදලක් වෙත ලැබුණු හෝ ඒවායින් උපයන ලද ලැබීම්වල සහ ලාභවල කොටස මත 30%ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතුය.

  සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, අනුමත කරනු ලැබූ අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදලක් හෝ අනුමත කරනු ලැබූ සමාපන අරමුදලක් විසින් සුදුසුකම්ලත් බැඳුම්කරවල ආයෝජනය කර ඇත්තේ නම් සහ එවැනි යම් අරමුදලක් 2023 ජූලි මස 1 වන දිනැති යෝජනා සම්මතය මගින් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය සඳහා ඵලදායී ලෙස සහභාගී වී ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරන්නේ නම්, 2023 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ දෙවන මාස හයක කාල සීමාව සඳහා සහ 2024 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ එදිනට පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සඳහා, භාණ්ඩාගාර බැඳුම්කරවලින් ඒ අරමුදල් වෙත ලැබුණු හෝ ඒවායින් උපයන ලද ලැබීම්වල සහ ලාභවල කොටස මත 14%ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතුය.

**2.2.1.3 2023ට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට කරන ලද සංශෝධන**

- **රඳවා ගැනීමෙන් ගෙවිය යුතු බදු - 83අ (1අ) / 84අ / 85 වගන්ති**

  රඳවා ගැනීමේ බද්ද (ර.ගැ.බ.), අත්තිකාරම් ආදායම් බද්ද (අ.ආ.බ.) සහ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (අ.පු.ආ.බ.) අඩු කිරීම 2023 ජනවාරි මස 01 වන දින සිට බලාත්මක වන පරිදි අනිවාර්ය කරන ලදී.

  2023 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, දේශීය ආදායම් පනතේ සංශෝධිත 83අ (1අ) වගන්තිය ප්‍රකාරව කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි සේවායෝජකයකු විසින් තම සේවකයාට කරන ලද 5 වැනි වගන්තියට යටත් ඕනෑම ගෙවීමක් මත අ.පු.ආ.බ. අඩු කළ යුතුය.

  2023 ජනවාරි මස 1 දින සිට බලාත්මක වන පරිදි, දේශීය ආදායම් පනතේ සංශෝධිත 84 (අ) සහ 85 වගන්ති ප්‍රකාරව යම් තැනැත්තකු විසින් නිදහස් කිරීම් ප්‍රමාණයන් හැර ශ්‍රී ලංකාවේ

මූලාශ්‍රයක් සහිත පහත සඳහන් ගෙවීම් මත අදාළ අනුප්‍රමාණයන් යටතේ රඳවා ගැනීමේ බද්ද (ර.ගැ.බ.) / අත්තිකාරම් ආදායම් බද්ද (අ.ආ.බ) අඩු කළ යුතුය.

### 2.1 වගුව : ඇතැම් ගෙවීම් මත රඳවා ගැනීමේ බද්ද (ර.ගැ.බ.)/අත්තිකාරම් ආදායම් බද්ද (අ.ආ.බ.)

| ගෙවීම අදාළ ර.ගැ.බ. | අනුප්‍රමාණය (%) |
|---|---|
| පහත සඳහන් කරුණු සම්බන්ධයෙන්, ගෙවීම් කරන තැනැත්තාගේ සේවා නියුක්තිකයකු නොවන වාසික පුද්ගලයකුට ලිත් මාසයකට රු.100,000 ඉක්මවන සේවා ගාස්තු ගෙවීමක් සිදු කරන විට<br>(අ) ඉගැන්වීම, දේශන පැවැත්වීම, විභාගයක් පැවැත්වීම හෝ විභාග පරීක්ෂා කිරීම හෝ අධීක්ෂණය කිරීම වෙනුවෙන්;<br>(ආ) වාසික රක්ෂණ, අලෙවි හෝ ප්‍රචාරක නියෝජිතයකුට යම් කොමිස් මුදලක් හෝ තැරැව් ගාස්තුවක් වශයෙන්; හෝ<br>(ඇ) වෛද්‍යවරයකු, ඉංජිනේරුවරයකු, ගණකාධිකාරීවරයකු, නීතිඥවරයකු, මෘදුකාංග සංවර්ධකයකු, පර්යේෂකයකු, ශාස්ත්‍රඥයකු හෝ නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් ස්වාධීන සේවා සපයන පුද්ගලයකු වැනි ස්වාධීන සේවා සපයන්නකුගේ තත්ත්වයෙන් ඒ පුද්ගලයා විසින් සපයනු ලබන සේවා වෙනුවෙන් | සම්පූර්ණ ගෙවීම මත 5% |
| ගෙවනු ලබන පොලිය හෝ වට්ටමක් සම්බන්ධයෙන් වන අවස්ථාවකදී | 5% |
| යම් වාසික තැනැත්තෙකුට ගෙවනු ලබන කුලියක් සම්බන්ධයෙන් වන අවස්ථාවකදී (මුළු මුදල ලිත් මාසයකට රු.100,000 ඉක්මවන්නේ නම්) | සම්පූර්ණ ගෙවීම මත 10% |
| අයකිරීම්, ස්වාභාවික සම්පත් ගෙවුම් හෝ අධිමිල සම්බන්ධයෙන් වන අවස්ථාවකදී | 14% |
| රාජ්‍යභාග සම්බන්ධයෙන් | 15% |
| ලාභාංශ සම්බන්ධයෙන් | 15% |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

- **සහන සම්බන්ධයෙන් වන සංශෝධන - තනි පුද්ගලයන්**

### 2.2 වගුව : සහන සම්බන්ධයෙන් වන සංශෝධන - තනි පුද්ගලයන්

| සහන වර්ගය | තක්සේරු වර්ෂය | | |
|---|---|---|---|
| | 2022/23 තක්සේරු වර්ෂයේ පළමු මාස නවයක කාල පරිච්ඡේදය 2022.04.01-2022.12.31 | 2022/23 තක්සේරු වර්ෂයේ ඉතිරි මාස තුනක කාල පරිච්ඡේදය 2023.01.01-2023.03.31 | 2023/24 තක්සේරු වර්ෂයට සහ 2023.04.01න් ඉදිරියට |
| වාසිකයන් හෝ පුරවැසියන් සම්බන්ධයෙන් වන පෞද්ගලික සහන | රු. 2,250,000 | රු. 300,000 | රු. 1,200,000 |
| වාසිකයන් සම්බන්ධයෙන් වන වියදම් සහන | රු. 900,000 | අදාළ නොවේ | අදාළ නොවේ |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

- **2022/23 තක්සේරු වර්ෂයට ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කිරීම**

  අදාළ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද කාල පරිච්ඡේද දෙක සඳහා තත්‍ය පදනම මත වෙන වෙනම ගණනය කළ යුතු නමුත් පහත අවස්ථාවලදී සමානුපාතික පදනම ද භාවිත කළ හැකිය.

  බදු අයකළ හැකි ආදායම ලබා ගැනීම සඳහා තනි පුද්ගලයන්ට ව්‍යාපාර ආදායම මාස නවයක සහ මාස තුනක කාල පරිච්ඡේද සඳහා පිළිවෙළින් 75:25 අනුපාතයන්ට බෙදිය හැකිය. තනි පුද්ගලයන් නොවන වෙනත් යම් තැනැත්තන්ට බදු අයකළ හැකි ආදායම ලබා ගැනීම සඳහා ව්‍යාපාර ආදායම පළමු මාස හයක සහ දෙවන මාස හයක කාල පරිච්ඡේද සඳහා පිළිවෙළින් 50:50 අනුපාතයන්ට බෙදිය හැකිය.

- **අවසාන රඳවා ගැනීමේ ගෙවීම්**

  2023 ජනවාරි 01 න් පසු වාසික සමාගමක් විසින් ප්‍රකාශයට පත් කරන ලද ලාභාංශ, අවසාන රඳවා ගැනීමේ ගෙවීමක් විය යුතුය.

- **තනි පුද්ගලයන්ට (වාසික සහ නිර්වාසික) අදාළ ආදායම් බදු අනුපාත**

### 2.3 වගුව : තනි පුද්ගලයන්ට අදාළ ආදායම් බදු අනුපාත

| ආදායම් බදු අනුප්‍රමාණය | | |
|---|---|---|
| 2022/23 තක්සේරු වර්ෂයේ පළමු මාස නවයක කාල පරිච්ඡේදය 2022.04.01 - 2022.12.31 | 2022/23 තක්සේරු වර්ෂයේ අවසන් මාස තුනක කාල පරිච්ඡේදය 2023.01.01 - 2023.03.31 | 2023/24 තක්සේරු වර්ෂයට සහ 2023.04.01න් ඉදිරියට |
| පළමු රු. 2,250,000 - 6% | පළමු රු. 125,000 - 6% | පළමු රු. 500,000 - 6% |
| ඊළඟ රු. 2,250,000 - 12% | ඊළඟ රු. 125,000 - 12% | ඊළඟ රු. 500,000 - 12% |
| ඉතිරිය මත - 18% | ඊළඟ රු. 125,000 - 18% | ඊළඟ රු. 500,000 - 18% |
| | ඊළඟ රු. 125,000 - 24% | ඊළඟ රු. 500,000 - 24% |
| | ඊළඟ රු. 125,000 - 30% | ඊළඟ රු. 500,000 - 30% |
| | ඉතිරිය මත - 36% | ඉතිරිය මත - 36% |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

- **2023.04.01 වන දින සිට නිදහස් කිරීම් ඉවත් කිරීම**

  යම් තැනැත්තකු විසින් පහතින් දක්වා ඇති පරිදි ඉපයූ හෝ ව්‍යුත්පන්න කළ ලැබීම් සහ ලාභ -

  i. තොරතුරු තාක්ෂණය සහ එහි සක්‍රිය සේවා සැපයීමෙන්

  ii. යම් වෘත්තිය පුහුණු ආයතනයක වෘත්තීය අධ්‍යාපන වැඩසටහන්වලින්

  iii. රත්‍රන්, මැණික් හෝ ස්වර්ණාභරණ අපනයනය කිරීමේ ව්‍යාපාරයකින් හෝ ශ්‍රී ලංකාවට මැණික් ගෙනවිත් ඒ මැණික් කපා ඔප දමා අපනයනය කරන ව්‍යාපාරයකින්

  iv. 2021.04.01 දින හෝ එදිනට පසුව ආරම්භ කළ ප්‍රතිචක්‍රීකරණය කරන ලද ඉදිකිරීම් ද්‍රව්‍ය විකිණීමෙහි නිරත වන නව ව්‍යවසායකින්

  v. 2021.04.01 දින හෝ එදිනට පසු ශ්‍රී ලංකාව තුළ බෝට්ටු සහ නැව් නිෂ්පාදනය කිරිමේ කාර්යය සඳහා (නේවාසික තැනැත්තකු විසින්) ආරම්භ කරන ලද ව්‍යවසායකින්

  vi. 2021.04.01 දින හෝ එදිනට පසුව ආරම්භ කරන ලද මෙගා වොට් සියයකට නොඅඩු බලශක්තියක් නිපදවීමේ හැකියාව සහිතව සහ ඒ බලශක්තිය ජාතික විදුලි බල පද්ධතියට සැපයීමට පිහිටුවන ලද සූර්ය හෝ සුළං බලශක්තියකින් නිපදවන යම් පුනර්ජනනීය බලශක්ති සැපයුමකින්

  vii. ශ්‍රී ලංකාවේ දේශීය ශ්‍රමය හා දේශීය අමුද්‍රව්‍ය භාවිත කරමින් සන්නිවේදන කුලුනු සහ ඒ ආශ්‍රිත උපකරණ ඉදිකිරීමට සහ ස්ථාපනය කිරීමට හෝ එම ඉදිකිරීම් හෝ ස්ථාපනය සඳහා අවශ්‍ය තාක්ෂණික සේවා සැපයීමට 2021 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසුව (වාසික පුද්ගලයකු විසින්) ආරම්භ කරන ලද ව්‍යවසායකින්

  viii. කොළඹ සහ හම්බන්තොට වරායවල බන්ධිත ගුදම් හෝ අක්වෙරළ ව්‍යාපාරයට සම්බන්ධ ගුදම් බදු දීම සඳහා 2021.04.01 දින හෝ එදිනට පසුව ආරම්භ කරන ලද ව්‍යවසායකින්

  වෘත්තීය අධ්‍යාපනය සාර්ථකව සම්පූර්ණ කිරීම මත 2021.04.01 දින හෝ ඉන් පසුව ආරම්භ කරන ලද යම් ව්‍යාපාරයක් මගින් යම් පුද්ගලයකු විසින් ඉපයූ හෝ යම් පුද්ගලයකු විසින් ව්‍යුත්පන්න කළ ලැබීම් සහ ලාභ

- **දේශීය ආදායම් පනතේ අඩුකිරීම් නීති**

  i. අලෙවිකරණ සහ සන්නිවේදන වියදම් (දේශීය ආදායම් පනතේ විධිවිධානවලට යටත් වූ ප්‍රදානයන්) සඳහා ලබා දුන් 100% ක අතිරේක අඩු කිරීම 2023/24 තක්සේරු වර්ෂය සඳහා අදාළ නොවේ.

  ii. ශුන්‍ය ලේඛනගත වටිනාකමක් සහිත ක්ෂය කළ හැකි වත්කම් මත දරන වැඩිදියුණු කිරීම් වියදම් (ප්‍රාග්ධන දීමනා සම්පූර්ණයෙන්ම ලබා දී ඇති ක්ෂය කළ හැකි වත්කම්වල) පහත සඳහන් පරිදි අඩු කළ හැකිය.

**2.4 වගුව : දේශීය ආදායම් පනතේ අඩුකිරීම් නීති-වලට කරන ලද සංශෝධන**

| ක්ෂය කළ හැකි වත්කම් | පදනම |
|---|---|
| ගොඩනැගිලි ව්‍යුහ සහ ස්ථිර ස්වභාවයේ සමාන දේ | සමාන ප්‍රමාණයන්ගෙන් අවුරුදු 12ට වඩා වැඩි |
| අනෙකුත් ක්ෂය විය හැකි වත්කම් | සමාන ප්‍රමාණයන්ගෙන් අවුරුදු 3ට වඩා වැඩි |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

- **සහනදායී බදු අනුප්‍රමාණයන් ඉවත් කිරීම**

  2023.01.01 වන දින සිට බලාත්මක වන පරිදි පුද්ගලයින් සම්බන්ධයෙන් ලැබීම් සහ ලාභ මත අදාළ කර ගත් පහත සඳහන් සහනදායී බදු අනුප්‍රමාණයන් ඉවත් කර ඇත.

  i. මැණික් හෝ ස්වර්ණාභරණ සම්බන්ධයෙන් ලැබුණු ප්‍රතිෂ්ඨාව

  ii. පුනර්ජනනීය සම්පත් භාවිත කරමින් උත්පාදනය කරනු ලබන විදුලිබලය ජාතික විදුලි බල පද්ධතියට සැපයීම

### 2.2.2 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට කරන ලද සංශෝධන

එකතු කළ අගය මත බද්දට අදාළ බදු ප්‍රතිපත්ති වෙනස්කම් කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා සංශෝධන පනතක් 2023 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

**2.2.2.1 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත**

2023 දෙසැම්බර් 13 වන දින ගරු කථානායකතුමා විසින් සහතික කරන ලද 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් ගෙන එන ලද බදු ප්‍රතිපත්ති වෙනස්කම් පහත පරිදි වේ.

- **නිදහස් කිරීම් - පළමු උපලේඛනය**

  2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් සංශෝධිත 2022 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමුවන උපලේඛනයේ II කොටස 2023.12.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවසන් කරනු ලැබේ. ඒ අනුව 2024.01.01 දින සිට ක්‍රියාත්මක වන එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලද භාණ්ඩ හා සේවා 2022 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III වන කොටසෙහි සඳහන් කර ඇත.

  එවැනි නිදහස් කරන ලද භාණ්ඩ හා සේවා ඇමුණුම 03හි දක්වා ඇත.

**2.2.2.2 2023ට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට කරන ලද සංශෝධන**

- **එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ඉවත් කිරීම**

  යම් තැනැත්තකුට සහාධිපත්‍ය වාසික නවාතැන් සැපයීම මත ප්‍රදානය කළ නිදහස් කිරීම ඉවත් කරන ලද අතර 2023 ජනවාරි මස 01 වන දා සිට බලාත්මක වන පරිදි එකතු කළ අගය මත බද්දට යටත් කර ඇත.

### 2.2.3 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතට කරන ලද සංශෝධන

සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට අදාළ බදු ප්‍රතිපත්ති වෙනස්කම් කිහිපයක් ක්‍රියාත්මක කිරීම උදෙසා සංශෝධන පනතක් 2023 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

**2.2.3.1 2023 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (සංශෝධන) පනත**

ගරු කථානායකතුමා විසින් 2023 සැප්තැම්බර් 08 වන දින සහතික කරන ලද 2023 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (සංශෝධන) පනත මගින් ගෙන එන ලද බදු ප්‍රතිපත්ති වෙනස්කම් පහත පරිදි වේ.

- **නව නිදහස් කිරීම් - සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමු උපලේඛනය**

  සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමු උපලේඛනයේ Iඅ කොටසට ඇතුළත් නව නිදහස් කිරීම්:

  (අ) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බද්දට යටත් වන සහ රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගනු ලැබූ ආනයනය කරනු ලබන යම් මෝටර් රථයක්;

  (ආ) වෙනස් හැකියාවන් සහිත පුද්ගලයන් විසින් භාවිත කරනු ලබන උපකරණ;

  (ඇ) ශ්‍රී ලංකාවට බැංකුවක් හරහා ප්‍රේෂණය කරනු ලබන විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීමට, කපා ඔප දමා ප්‍රතිඅපනයනය කිරීමේ කාර්යය සඳහා ආනයනය කරනු ලබන, රළු පිරිසකසනු නොලැබූ මැණික් ගල්;

  (ඈ) තීරු බදු රහිත වෙළඳසැල්වල විකුණනු ලබන යම් ද්‍රව්‍යයක;

  (ඉ) දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද වී වලින් නිෂ්පාදිත සහල්;

  සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමු උපලේඛනයේ II කොටසට ඇතුළත් කරන ලද නව නිදහස් කිරීම්:

  (අ) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 97 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ගුවන් ප්‍රවාහන සේවා බලපත්‍රයක් දරනු ලබන යම් සාමාන්‍ය අලෙවි නියෝජිතයකු විසින් සපයනු ලබන සේවා

- **පවතින නිදහස් කිරීම් සඳහා කරන ලද සංශෝධන - සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමුවන උපලේඛනය**

  සැක දුරු කිරීම සහ විදුලි මිල වෙනස්වීම් මගහැරීම සඳහා පළමු උපලේඛනයේ II කොටසෙහි 1 වන අයිතමය සංශෝධනය කර ඇත.

  ඒ අනුව, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13 වැනි වගන්තිය යටතේ නිකුත් කර ඇති බෙදාහැරීමේ බලපත්‍රයක් දරනු ලබන යම් තැනැත්තකු විසින් විදුලිබලය සැපයීම හැර විදුලිබලය උත්පාදනය කිරීම සහ විදුලිබලය සැපයීම සඳහා නිදහස් කිරීම් පවතී. මේ අනුව, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද බෙදාහැරීමේ බලපත්‍රයක් දරනු ලබන යම් තැනැත්තකු විසින් විදුලිබලය සැපයීම සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත වෙත බදු බැඳියාවකින් යුතු වේ.

### 2.2.4 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු පනතට කරන ලද සංශෝධන

ඔට්ටු ඇල්ලීමේ හා සූදු බද්දට අදාළ බදු ප්‍රතිපත්ති වෙනස්කම් කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් සංශෝධන පනතක් සම්මත කරන ලදී.

#### 2.2.4.1 2023 අංක 11 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත

ගරු කථානායකතුමා විසින් 2023 අගෝස්තු 21 වන දින සහතික කරන ලද, 2023 අංක 11 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත මගින් ගෙන එන ලද බදු ප්‍රතිපත්ති වෙනස් කිරීම් පහත පරිදි වේ.

- **ලියාපදිංචි කිරීම - 3 (1) (1අ) සහ 3 (1) (1ආ) වගන්ති**

  (අ) සූදු ව්‍යාපාරය කරගෙන යන තැනැත්තා

  - 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ 2 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා හිමිකම් ලැබිය යුතු අතර, එම සෑම තැනැත්තකු ම, එම බලපත්‍රය නිකුත් කිරීමේ දින සිට මාස එකක කාලයක් ඇතුළත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු ය.
  - එවැනි බලපත්‍රයක් ලබා ගෙන ඇති එහෙත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොමැති යම් තැනැත්තකු 2023 අගෝස්තු 21 දින සිට (2023 සැප්තැම්බර් 21 දිනට පෙරාතුව) මාසයක් ඇතුළත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතුය.

  (ආ) බුකීකරුවකුගේ ව්‍යාපාරය පවත්වා ගෙන යන තැනැත්තා - බුකීකරුවකුගේ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තකු විසින්ම, එම ව්‍යාපාරය ආරම්භ කිරීමේ දින සිට මාසයක් ඇතුළත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතුය.

  - 2023 අගෝස්තු 21 දිනට පෙර බුකීකරුවකුගේ ව්‍යාපාරය ආරම්භ කර ඇති එහෙත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොමැති යම් තැනැත්තකු, 2023 අගෝස්තු 21 වන දින සිට (2023 සැප්තැම්බර් 21 දිනට පෙරාතුව) මාසයක් ඇතුළත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතුය.

- **බුකීකරුවකුගේ ව්‍යාපාර සහ සූදු ව්‍යාපාර සඳහා දළ එකතුව මත බද්ද - 2 (1) (ඇ) වගන්තිය**

  බුකීකරුවකුගේ ව්‍යාපාරයකින් හෝ සූදු ව්‍යාපාරයකින් ලැබෙන දළ එකතුව මත බදු අනුප්‍රමාණය, එම දළ එකතුව මසකට රුපියල් මිලියන 1 ඉක්මවන්නේ නම්, 2023 අප්‍රේල් 1 වන දින සිට ආරම්භ වන යම් වර්ෂයක් සඳහා සියයට පහළොවක් (15%) දක්වා වැඩි කර ඇත.

- **සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ඉවත් කිරීම - 2 (1) (ඉ) වගන්තිය**

  දළ එකතුව මත බද්ද ගෙවීමට බැඳී සිටින යම් තැනැත්තකු 2023 අගෝස්තු මස 21 වන දින සිට සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවීමට යටත් නොවනු ඇත.

- **කැසිනෝ ඇතුළුවීමේ බද්ද - 2 (2) (ආ) වගන්තිය**

  2023 අප්‍රේල් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි,

- ශ්‍රී ලංකාවේ සූදු ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තකු විසින් ම, එම සූදු ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයට තමා ම ඉදිරිපත් වීමෙන් හෝ අන්තර්ජාලය හරහා ඇතුළු වන ශ්‍රී ලාංකික පුරවැසියකු වන යම් තැනැත්තකුගෙන් එක්සත් ජනපද ඩොලර් පනහක් (එ.ජ.ඩො. 50) හෝ එයට සමාන පරිවර්තනය කළ හැකි වෙනත් ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් කැසිනෝ ඇතුළු වීමේ බද්ද අය කළ යුතුය.
- ශ්‍රී ලාංකික පුරවැසියන් නොවන තැනැත්තන් කැසිනෝ ඇතුළුවීමේ බද්දට යටත් නොවේ.

➢ **සූදු ව්‍යාපාර සඳහා වන වාර්ෂික බද්ද - පනතේ දැක්වෙන උපලේඛනයේ දෙවන කොටස**

රූජිනෝ ක්‍රීඩාව ක්‍රීඩා කිරීම ඇතුළුව සූදු ව්‍යාපාරයක් කරගෙන යන තැනැත්තකු විසින් ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය 2023 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහාම රුපියල් මිලියන පන්සියයක් (රු. මි. 500) දක්වා වැඩි කරනු ලැබේ.

➢ **බුකීකරුවකුගේ ව්‍යාපාරය සඳහා වන වාර්ෂික බද්ද - පනතේ දැක්වෙන උපලේඛනයේ පළමුවන කොටස**

බුකීකරුවකුගේ ව්‍යාපාරයක් පවත්වාගෙන තැනැත්තකු විසින් ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය 2023 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහාම පහත දක්වා ඇති පරිදි සංශෝධනය කරනු ලැබේ.

අ) අනුයෝජිතයකු මාර්ගයෙන් හෝ අන්තර්ජාලය හරහා සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිත කිරීමෙන් හෝ නොකිරීමෙන් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන බුකිකරුවකු විසින් ගෙවිය යුතු වාර්ෂික බද්ද රුපියල් මිලියන පහ (රු. මි. 5) දක්වා වැඩි කර ඇත.

ආ) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිත කිරීමෙන් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන බුකිකරුවකු විසින් ගෙවිය යුතු වාර්ෂික බද්ද රුපියල් මිලියනක් (රු. මි. 1) දක්වා වැඩි කර ඇත.

ඇ) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිත නොකර ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන බුකිකරුවකු විසින් ගෙවිය යුතු වාර්ෂික බද්ද රුපියල් හැත්තෑ පන්දහස (රු. 75,000/-) දක්වා වැඩි කර ඇත.

➢ **"බුකීකරුවකු" යන්නෙහි අර්ථ දැක්වීම**

බුකීකරුවකු යන්නෙහි අර්ථ දැක්වීම පුළුල් කර ඇත. "බුකීකරුවකු" යන්නෙන්, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත තරග වදිනු ලබන හෝ තරග වැදීමට යෝජනා කරනු ලබන තුරඟ තරග සඳහා හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත පවත්වනු ලබන හෝ පැවැත්වීමට යෝජනා කරනු ලබන යම් ක්‍රීඩා ඉසව්වක් වෙනුවෙන් -

(අ) කෙලින් ම හෝ අන්‍යාකාරයකින්;

(ආ) මුදලට හෝ ණයට; හෝ

(ඇ) අන්තර්ජාලය හරහා ඔට්ටු භාරගන්නා වූ හෝ සාකච්ඡා කරන්නා වූ තැනැත්තකු අදහස් වේ.

### 2.2.5 වර්ෂය තුළ නිකුත් කරන ලද ගැසට් නිවේදන

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හා 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ පහත සඳහන් ගැසට් නිවේදන නිකුත් කරන ලදී.

#### 2.2.5.1 2023 මැයි 31 දිනැති අංක 2334/21 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය

දේශීය ආදායම් පනතේ 102 වන වගන්තිය යටතේ ලියාපදිංචි විය යුතු අතිරේක තැනැත්තන් පන්ති මෙම අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් නිශ්චිතව සඳහන් කරයි.

අ - කොටස

2023 ජුනි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි;

i. වෛද්‍ය ආඥාපනත (105 පරිච්ඡේදය) යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති වෘත්තිකයන්

ii. 1959 අංක 23 දරන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයින්

iii. 2009 අංක 23 දරන පනත යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයින්

iv. 1968 අංක 17 දරන පනත යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයින්

v. ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සාමාජිකයින්

vi. 1976 අංක 01 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පනත යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ සාමාජිකයින්

vii. 2007 අංක 20 දරන පනත යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනයේ සාමාජිකයින්

viii. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන්

ix. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිය ව්‍යාපාර ලියාපදිංචි කර ඇති තැනැත්තන්

x. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි වාහන ලියාපදිංචි කර ඇති (ත්‍රී රෝද රථ, යතුරු පැදි සහ අත් ට්‍රැක්ටර් හැර) වාහන හිමිකරුවන්

xi. 2018 අප්‍රේල් 01 වැනි දින හෝ ඊට පසු ශ්‍රී ලංකාවේ ඕනෑම නිශ්චල දේපළක් මිලදී ගත් හෝ පැවරුම් ඔප්පුවක් යටතේ අත්පත් කරගත් තැනැත්තන්

xii. ඕනෑම සේවක අර්ථසාධක අරමුදලක් සඳහා සේවාදායකයාගේ සහ සේවායෝජකයා යන දෙපාර්ශවයේම මාසික දායකත්වයෙහි එකතුව රුපියල් 20,000/- ඉක්මවන සේවකයින්

xiii. පළාත් පාලන ආයතනයකින් ගොඩනැගිලි සැලැස්මක් සඳහා අනුමැතිය ලබා ගන්නා ඕනෑම පුද්ගලයෙක්

xiv. ශ්‍රී ලංකාවේ දී ඕනෑම සේවාවක් සැපයීම තුලින් මසකට රුපියල් 100,000/- ක් හෝ මාස දොළහක් සඳහා රුපියල් 1,200,000/- කට වඩා ගෙවීමක් ලබන වෙනත් ඕනෑම පුද්ගලයෙක්

ආ - කොටස

2024 ජනවාරි මස 01 සිට බලපැවැත්වෙන පරිදි, ඉහත අ කොටසෙහි කිසිදු කාණ්ඩයකට අයත් නොවන ඕනෑම පුද්ගලයෙක් සහ, -

i. 2023 දෙසැම්බර් මස 31 වැනි දිනට වයස අවුරුදු 18 හෝ ඊට වැඩි සියලු පුද්ගලයින් හෝ

ii. 2024 ජනවාරි මස 01 වැනි දිනට හෝ එදිනට පසු වයස අවුරුදු 18 සම්පූර්ණ වන පුද්ගලයින් වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු

#### 2.2.5.2 2023 ජනවාරි 24 දිනැති අංක 2316/13 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය

මෙම අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් 2022.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සේවාවන් සැපයීම මත එකතු කළ අගය මත බද්ද ගණනය කිරීම හා සම්බන්ධ කරුණු මෙන්ම බද්ද ගණනය කරන ආකාරය නිශ්චිතව සඳහන් කරයි.

#### 2.2.5.3 2023 දෙසැම්බර් 19 දිනැති අංක 2363/22 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ පළ කරන ලද මෙම අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් 2024 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බදු අනුප්‍රමාණය පහත දක්වා ඇති පරිදි ප්‍රතිශෝධනය කර ඇත.

**2.5 වගුව : 2024.01.01 දින සිට බලපැවැත්වෙන ප්‍රතිශෝධිත එකතු කළ අගය මත බදු අනුප්‍රමාණ**

| විස්තරය | එ.අ.බ. අනුප්‍රමාණ |
|---|---|
| (අ) භාණ්ඩ ආනයනය (ෆැබ්‍රික්)ඃ 2018 නොවැම්බර් 1 දිනැති අංක 2095/20 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ උපලේඛනයහි I වන හා II වන තීරුවල සංයෝජිත වර්ගීකරණ සංකේත සහ විස්තරයෙහි සඳහන් කරනු ලැබ ඇති රෙදි වර්ග ආනයනය කිරීම | සියයට බින්දුවයි (0%) |
| (ආ) ඉහත ඡේදය යටතේ සඳහන් භාණ්ඩ ආනයනය කිරීම හැර භාණ්ඩ ආනයනය හා/හෝ සැපයීම හෝ සේවා සැපයීම සඳහා සම්මත ආනයන අනුප්‍රමාණ [ඡේදය (අ)] | සියයට දහ අටයි (18%) |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

2024.01.01 දින හෝ එදිනට පසුව ලැබිය හැකි භාණ්ඩ හෝ සේවා වෙනුවෙන් 2024.01.01 දිනට පෙරාතුව කරනු ලබන යම් අත්තිකාරම් ගෙවීමක් සඳහා 15%ක අනුප්‍රමාණයකින් එකතු කළ අගය මත බදු අය කළ හැකිය.

තවද, මූල්‍ය සේවා සැපයීමට අදාළ එකතු කළ අගය මත බදු අනුප්‍රමාණය සියයට දහ අටෙහි (18%) නොවෙනස්ව පවතිනු ඇත.

## 2.3 අනුමත පුණ්‍යායතන

අනුමත පුණ්‍යායතනයක් යනු 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ 1(අ) වගන්තියේ අරමුණු සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මුදල් අමාත්‍යවරයා විසින් අතිවිශේෂ ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරන පරිදි ඕනෑම පොදු පුණ්‍යායතනයක් හෝ භාරයකි. අනුමත පුණ්‍යායතනයකට යම් තැනැත්තකු විසින් මුදලින් කරන ලද පරිත්‍යාග, සුදුසුකම් ලැබීමේ ගෙවීමක් ලෙස එම තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කළ හැකිය.

2.6 වගුවේ දක්වා ඇති පුණ්‍යායතනය මුදල් අමාත්‍යවරයා විසින් 2023 වසරේ දී අනුමත කර ඇත.

**2.6 වගුව : 2023 වසරේ අනුමැතිය ලබා දුන් පුණ්‍යායතන**

| පුණ්‍යායතනය | ගැසට් පත්‍රයේ අංකය | ගැසට් පත්‍රයේ දිනය |
|---|---|---|
| පීටර් වීරසේකර පදනම | 2329/18 | 24.04.2023 |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

2023 දෙසැම්බර් 31 දිනට අනුමැතිය ලබා දී ඇති පුණ්‍යායතනවල සම්පූර්ණ ලැයිස්තුවක් ඇමුණුම 04 හි දක්වා ඇත.

## 2.4 ද්විත්ව බදු වළක්වා ගැනීමේ ගිවිසුම්

ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම්/ ද්විත්ව බදු සම්මුතිවල පරමාර්ථය සහ කාර්යය වන්නේ ගෝලීය මෙහෙයුම් හරහා තැනැත්තන් විසින් උපයා ගන්නා ලාභ සහ ආදායම හා සම්බන්ධ නෛතිකමය ද්විත්ව බදුකරණ සිද්ධීන් ඉවත් කිරීම හෝ සහන සැලසීම සහ බදු නොගෙවා මගහැරීම් වැළැක්වීමයි. මෙම ගිවිසුම් සංවර්ධනය වෙමින් පවතින රටවලට විශේෂයෙන් වැදගත් වන්නේ, ඒවා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීමේදී මෙන්ම විශේෂඥ දැනුම, නවීන තාක්ෂණය, රැකියා අවස්ථා යනාදිය ලබාගැනීමට විශාල කාර්යභාරයක් ඉටු කරන බැවිනි.

ශ්‍රී ලංකාව 2023 දෙසැම්බර් මස 31 වන දිනට රටවල් 46ක් සමග ද්විත්ව බදු වළක්වා ගැනීමේ ගිවිසුම්වලට සහ බහුපාර්ශ්වික ගිවිසුමකට (සාක්) එළඹ ඇත. එසේ ශ්‍රී ලංකාව විසින් එළඹ ඇති ද්විත්ව බදු ගිවිසුම් පිළිබඳ සම්පූර්ණ තොරතුරු ඇමුණුම 05හි දක්වා ඇත.

03

පරිච්ඡේදය

# ආදායම් කාර්ය සාධනය



## 3.1 ආදායම් රැස් කිරීම

### 3.1.1 සමස්ත නිරීක්ෂණ

යම් බදු පරිපාලනයක ආදායම් කාර්ය සාධනය පරීක්ෂා කිරීමේ දී ප්‍රතිපත්තිමය අරමුණු, අනුකූලතා උපාය මාර්ග සහ ආර්ථික ගතිකත්වයන් අතර වන සියුම් තුලනය විස්තීර්ණ විශ්ලේෂණයක් මගින් ගවේෂණයට ලක් කරනු ලැබේ. මෙම පරිච්ඡේදය මගින් බදු පරිපාලනයේ සන්දර්භය තුළ ආදායම් ප්‍රතිඵල ඇගයීම සඳහා මූලික දත්ත ගවේෂණයට ලක් කරනු ඇත. ආදායම් එකතු කිරීමේ කාර්යක්ෂමතාව, ආදායම් සංයුතිය, අනුකූලතා මට්ටම් සහ බදු ගෙවන්නන්ගේ චර්යාව වැනි ප්‍රධාන දර්ශක පිළිබඳව කරනු ලබන සියුම් පරීක්ෂා කිරීම් තුළින්, විකසනය වන ආර්ථික පසුබිම මධ්‍යයේ මූල්‍ය ප්‍රතිපත්තිවල සඵලතාව සහ ආදායම් පද්ධතිවල ප්‍රත්‍යාස්ථිතිය පිළිබඳ අවබෝධයක් ලැබේ. තවද, එවැනි සංඛ්‍යාලේඛන මගින් රටේ රාජ්‍ය මූල්‍ය තත්ත්වයේ ශක්තිමත් බව සන්නිදර්ශනය කරන අතර තිරසාර ආදායම් වර්ධනයක් අත්පත් කර ගැනීම උදෙසා වන අනාගත උපාය මාර්ග සඳහා මග පෙන්වනු ලැබේ.

### 3.1.2 මුළු ආදායම එකතු කිරීම

ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී මෙම වර්ෂයේ සමස්ත බදු ආදායම, ආදායම ඉලක්කගත කිරීමේ දී හා සත්‍ය වශයෙන් එම ඉලක්කය අත්පත් කර ගැනීමේ දී යන දෙඅංශයෙන්ම සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි. 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත බදු ආදායම රුපියල් බිලියන 1,761.98ක් වූ නමුත් සැබෑ ආදායම අපේක්ෂිත අගය ඉක්මවා යමින් රුපියල් බිලියන 1,842.32ක් වෙත ළඟා වූයේ රුපියල් බිලියන 80.33ක වැඩිවීමක් වාර්තා කරමිනි. මෙහිදී ආදායම් ඉලක්කය සපුරා ගැනීමේ අනුපාතිකය දළ වශයෙන් 105%කි. වැඩි දියුණු වන ආර්ථික කාර්ය සාධනය සහ ඵලදායී බදු එකතු කිරීමේ ක්‍රමෝපායන් මෙම ජයග්‍රහණය මගින් පිළිබිඹු වන්නේ ය. පසුගිය වසරේ බදු ආදායම් ඉලක්කය රුපියල් බිලියන 1,131.01ක් වූ අතර එය සැලකිය යුතු ලෙස පහළ අගයක් විය. සැබෑ ලෙස අත්පත් කර ගත හැකි වූයේ රුපියල් බිලියන 1,058.08කි. එය බදු ආදායම් ඉලක්කයට වඩා අඩු අගයක් වූ අතර රුපියල් බිලියන 72.93ක පහත වැටීමක් විය. ඉලක්කගත ආදායමට සාපේක්ෂව පසුගිය වසරේ ආදායම් ඉලක්ක සපුරා ගැනීමේ අනුපාතිකය 93.55%ක් වූ අතර එමගින් 6.45%ක ඌනකාර්ය සාධනයක් පෙන්නුම් කරයි. වසර දෙක සන්සන්දනය කිරීමේ දී, පසුගිය වසරේ රුපියල් බිලියන 1,131.01ක් වූ ආදායම් ඉලක්කය මෙම වසරේ රුපියල් බිලියන 1,761.98 දක්වා වැඩි වී ඇත. මෙහි දී ඉලක්කගත අගය ආසන්න වශයෙන් 55.79%ක සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරයි. එපමණක් නොව, එකතු කර ගත් සැබෑ ආදායම රුපියල් බිලියන 1,058.08 සිට රුපියල් බිලියන 1,842.32 දක්වා වැඩි වූ අතර එමගින් 74.12%ක පමණ සැලකිය යුතු වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් සනිටුහන් කරයි. මෙම ප්‍රතිශත මත පදනම් වූ විශ්ලේෂණය මගින් බදු ආදායම් එකතු කිරීමේ කැපී පෙනෙන වර්ධනයක් ඉස්මතු කර දක්වන අතර ක්‍රමයෙන් වැඩි දියුණු වන ආර්ථික වර්ධනයක් සහ වැඩි දියුණු වූ බදු පරිපාලනයක කාර්යක්ෂමතාව පෙන්නුම් කරයි.

වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවලට සාපේක්ෂව පසුගිය අනුයාත වසර දහය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් කාර්ය සාධනය 3.1 වගුව මගින් නිරූපණය කෙරේ.

**3.1 වගුව : 2014 සිට 2023 දක්වා ඇස්තමේන්තු වලට සාපේක්ෂව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් කාර්ය සාධනය**

| වර්ෂය | ඇස්තමේන්තු කළ ආදායම (රු.මිලියන) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස් කිරීම (රු.මිලියන) | රැස් කළ ආදායම ඇස්තමේන්තු කළ ආදායමේ ප්‍රතිශතයක් (%) ලෙස |
|---|---|---|---|
| 2023 | 1,761,984 | 1,842,315 | 104.56 |
| 2022 | 1,131,012 | 1,058,080 | 93.55 |
| 2021 | 612,615 | 632,831 | 103.30 |
| 2020 | 575,403 | 523,934 | 91.06 |
| 2019 | 1,038,129 | 1,025,319 | 98.77 |
| 2018 | 1,028,265 | 900,348 | 87.56 |
| 2017 | 837,855 | 836,518 | 99.84 |
| 2016 | 573,115 | 641,547 | 111.94 |
| 2015 | 537,050 | 560,422 | 104.35 |
| 2014 | 605,370 | 514,161 | 84.93 |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**3.1.2.1 රජයේ සමස්ත ආදායම වෙත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි දායකත්වය**

2023 වර්ෂයේදී රජයේ මුළු ආදායමේ සුවිශේෂී වර්ධනයක් වාර්තා වූ අතර එය ඉකුත් වසරේ රුපියල් ට්‍රිලියන 1.98 සිට රුපියල් ට්‍රිලියන 3.05 දක්වා ඉහළ නැංගේය. මෙමගින් දළ වශයෙන් 54.04%ක සැලකිය යුතු වර්ධන වේගයක් නියෝජනය වන අතර ආදායම් උත්පාදනයේ ශක්තිමත් කාර්ය සාධනයක් ද පෙන්නුම් කරයි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ද සිය ආදායම් එකතු කිරීමේ කාර්යයෙහි කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කර ඇත. පසුගිය වසරේ රුපියල් ට්‍රිලියන 1.06ට සාපේක්ෂව 2023 වසරේ එකතු කළ ආදායම රුපියල් ට්‍රිලියන 1.84කි. මෙය 74.12%ක පමණ වැඩිවීමක් වන අතර එය රජයේ සමස්ත ආදායම් වර්ධනයටත් වඩා ඉහළ අගයකි. මෙමගින් පෙන්නුම් කරනු ලබන්නේ හිතකර ආර්ථික පරිසරයක් සහ බදු ප්‍රතිපත්ති වෙනස් කිරීම් පමණක් නොව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලිය තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක කර ඇති ඵලදායී උපාය මාර්ග සහ මෙහෙයුම් ක්‍රියාවලියයි. මෙම සුවිශේෂී කාර්ය සාධනය හඳුනාගෙන අනාගතයේ දී දෙපාර්තමේන්තුවේ ආදායම් උත්පාදන හැකියාවන් තිරසාරව පවත්වා ගැනීමට සහ භව්‍ය ලෙස පුළුල් කිරීමට උපරිම වශයෙන් යොදා ගත යුතුය.

**3.1.2.2 රජයේ බදු ආදායම වෙත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය**

2023 වසරේ රජයේ බදු ආදායම රුපියල් බිලියන 2,720.56ක් වන අතර, ඒ සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය රුපියල් බිලියන 1,842.32කි. මේ අතර, ආදායම් වර්ධනය අතින් බැලූ කල 2023 වසරේ රජයේ බදු ආදායම රුපියල් ට්‍රිලියන 1.75 සිට රුපියල් ට්‍රිලියන 2.72 දක්වා වැඩි වී ඇත. මෙය දළ වශයෙන් 55.36%ක වර්ධන අනුපාතිකයක් පිළිබිඹු කරයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අනුරූප වර්ධන අනුපාතිකය 74.12%ක් පමණ වන අතර එය 2023 වර්ෂයේ විශේෂයෙන් කැපී පෙනෙන කාර්ය සාධනයකි. මෙම සුවිශේෂී වැඩිවීම රජයේ බදු ආදායම් වර්ධනය අබිබවා යනවා පමණක් නොව බදු එකතු කිරීමේ කාර්යයේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව ද ඉස්මතු කරයි. නොඑසේ නම්, රජයේ සමස්ත බදු ආදායම වන රුපියල් ට්‍රිලියන 2.72ට රුපියල් ට්‍රිලියන 1.84කින් දායකත්වය දැක්වීම යනු ජාතික බදු පද්ධතිය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන භූමිකාව ඉස්මතු කර දක්වමින් රජයේ මුළු බදු ආදායමෙන් දළ වශයෙන් 67.72%ක් සඳහා දෙපාර්තමේන්තුව තනිව වගකීම දරන බවයි. මෙම කැපී පෙනෙන කාර්ය සාධනය මගින් පෙන්නුම් කරන්නේ දෙපාර්තමේන්තුව සතු ශක්තිමත් මෙහෙයුම් උපාය මාර්ග සහ ජාතික ආර්ථිකයට සහාය වීම සඳහා එය දක්වන ශක්තිමත් කැපවීම ය. රටේ මූල්‍ය යහපැවැත්මේ සහ ආර්ථික ස්ථාවරත්වයේ තීරණාත්මක මෙහෙයවන්නා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව බව තහවුරු කරමින් මෙම වේග ශක්තිය පවත්වා ගැනීමත් එහි බදු එකතු කිරීමේ ක්‍රියාවලි අඛණ්ඩව වැඩිදියුණු කිරීමත් අත්‍යවශ්‍ය වේ.

**3.1.2.3 දළ දේශීය නිෂ්පාදිතය වෙත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය**

විශේෂයෙන්ම රටේ දළ දේශීය නිෂ්පාදිතය (පවත්නා වෙළෙඳපොළ මිල අනුව) වන රුපියල් ට්‍රිලියන 27.63 සම්බන්ධයෙන් සලකා බැලූ කල, රජයේ ආදායම් එකතු කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දායක කරන ලද රුපියල් ට්‍රිලියන 1.84 අනල්ප අගයකි. මින් අදහස් වන්නේ, රටේ ආර්ථික පසුබිම තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සිය සුවිශේෂී ආනුභාවය සහ වැදගත්කම පෙන්නුම් කරමින් සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් දළ වශයෙන් 6.67% කට තනිවම උර දෙන බව ය. පවත්නා වෙළෙඳපොළ මිල අනුව 2023 වසරේ දී අත්පත් කර ගත් දළ දේශීය නිෂ්පාදිතයෙන් 14.82%ක වර්ධනය මගින් ශක්තිමත් ආර්ථික ප්‍රසාරණයක් පෙන්නුම් කරයි. මෙම තත්ත්වය තුළ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය විශේෂයෙන් කැපී පෙනෙන අතර පෙර වසරට සාපේක්ෂව ආදායම් එකතු කිරීම 74.12%කින් වැඩිවීමක් පෙන්නුම් කරයි. දළ දේශීය නිෂ්පාදිතයට 6.67%ක දායකත්වයක් දක්වන අතර පෙර වසරේදී දළ දේශීය නිෂ්පාදිතයට 4.40%ක දායකත්වයක් දැක්විය. මෙම සැලකිය යුතු වර්ධනය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ශක්තිමත් කාර්ය සාධනය සහ ජාතික ආර්ථිකය තුළ එහි නැගී එන භූමිකාව ඉස්මතු කරයි.

**3.2 වගුව : රජයේ සමස්ත ආදායමට, රජයේ බදු ආදායමට සහ බදු හා දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය**

| වර්ෂය | රජයේ සමස්ත ආදායම (රු. මි.) | රජයේ සමස්ත බදු ආදායම (රු. මි.) | පවත්නා වෙළෙඳපොළ මිල අනුව ද.දේ.නි. (රු. මි.) | දේ.ආ.දෙ.වේ ආදායම් රැස් කිරීම (රු. මි.) | රජයේ ආදායමට දේ.ආ.දෙපා. වේ රැස් කිරීමේ ප්‍රතිශතය | රජයේ බදු ආදායමට දේ.ආ.දෙපා. වේ රැස් කිරීමේ ප්‍රතිශතය | රජයේ බදු ආදායම, ද.දේ.නි.යට දක්වන අනුපාතය % | ද.දේ.නි.යට දේ.ආ.දෙපා. වේ ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|
| 2019 | 1,890,899 | 1,734,925 | 15,910,976 | 1,025,319 | 54.22% | 59.10% | 10.90% | 6.44% |
| 2020 | 1,367,960 | 1,216,542 | 15,646,254 | 523,934 | 38.30% | 43.07% | 7.78% | 3.35% |
| 2021 | 1,457,071 | 1,298,019 | 17,612,370 | 632,831 | 43.43% | 48.75% | 7.37% | 3.59% |
| 2022 | 1,979,184 | 1,751,132 | 24,063,762 | 1,058,080 | 53.46% | 60.42% | 7.28% | 4.40% |
| 2023 | 3,048,822 | 2,720,563 | 27,629,665 | 1,842,315 | 60.43% | 67.72% | 9.84% | 6.67% |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව*

**සටහන 3.1 : රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය**




*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

සටහන 3.2 : රජයේ බදු ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය




*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

## 3.3 වගුව : බදු වර්ගය අනුව මුළු ආදායම් රැස් කිරීම - 2023

| බදු වර්ගය | ආදායම් ඇස්තමේන්තුව (රු.) | ආදායම් රැස් කිරීම (රු.) | රැස් කිරීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස | රැස් කිරීම මුළු ආදායමට ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| ආදායම් බද්ද | 859,500,000,000 | 908,417,651,702 | 105.69% | 49.31% |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 4,000,000,000 | 2,679,199,097 | 66.98% | 0.15% |
| එකතු කළ අගය මත බද්ද | 680,500,000,000 | 694,460,229,730 | 102.05% | 37.70% |
| ඔට්ටු හා සූදු බද්ද* | 6,000,000,000 | 7,421,816,561 | 123.70% | 0.40% |
| කොටස් ගනුදෙනු බද්ද | 1,980,000,000 | 2,477,736,910 | 125.14% | 0.13% |
| විගමන බද්ද | 4,000,000 | 14,350,332 | 358.76% | 0.0008% |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 210,000,000,000 | 216,180,546,555 | 102.94% | 11.73% |
| වෙනත් බදු** | - | 10,663,585,979 | - | 0.58% |
| **මුළු ආදායම් රැස් කිරීම** | **1,761,984,000,000** | **1,842,315,116,864** | **104.56%** | **100%** |

*රුපියල් 500,000,000ක් වූ කැසිනෝ බලපත්‍ර ගාස්තුවේ ආදායම් ඇස්තමේන්තුව සහ රු. 500,000,000ක් වූ කැසිනෝ බලපත්‍ර ගාස්තුවේ ආදායම් රැස් කිරීම ඇතුළත් වේ.

**වෙනත් බදුවලට ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද, ණය ආපසු ගෙවීමේ බද්ද, මුද්දර ගාස්තු, ආර්ථික සේවා ගාස්තු, ජාතිය ගොඩනැගීමේ බද්ද, භාණ්ඩ හා සේවා බද්ද, පිරිවැටුම් බද්ද සහ ජාතික ආරක්ෂක බද්ද ඇතුළත් වේ.

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**සටහන 3.3 : එකතු කළ සමස්ත ආදායම - 2023**




වෙනත් බදුවලට ප්‍රාග්ධන ලාභ බද්ද, ඔට්ටු හා සූදු බද්ද, කොටස් ගනුදෙනු බද්ද, විගමන බද්ද, ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද, ණය ආපසු ගෙවීමේ බද්ද, මුද්දර ගාස්තු, ආර්ථික සේවා ගාස්තු, ජාතිය ගොඩනැගීමේ බද්ද, භාණ්ඩ හා සේවා බද්ද, පිරිවැටුම් බද්ද සහ ජාතික ආරක්ෂක බද්ද ඇතුළත් වේ.

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 3.1.2.4 මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරු කිරීම

2011 අංක 10 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත සහ 2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීම්) පනත අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද ජාතිය ගොඩනැගීමේ බද්ද සහ මුද්දර ගාස්තු පහත පරිදි පළාත් සභාවලට මාරු කළ යුතුය.

| | |
|---|---|
| ජාතිය ගොඩනැගීමේ බද්ද | මුළු එකතුවෙන් 33.33% |
| මුද්දර බද්ද | මුළු එකතුවෙන් 100% |

3.4 වගුවේ දැක්වෙන්නේ රැස් කළ මුළු ආදායම සහ ඒ ඒ බදුවලින් පළාත් සභා වෙත මාරු කළ මුදල් ප්‍රමාණයි.

**3.4 වගුව : බදු ආදායම පළාත් සභා වෙත මාරු කිරීම - 2023**

| වර්ෂය | රැස් කළ මුළු ආදායම (රු.) | පළාත් සභාවලට මාරු කළ මුදල් ප්‍රමාණ (රු.) | ප්‍රතිශතය |
|---|---|---|---|
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 359,346,825 | 31,265,050* | 33.33% |
| මුද්දර ගාස්තු | 10,009,406,030 | 10,009,406,030 | 100% |

*වසර තුළ පළාත් සභා වෙත සත්‍ය වශයෙන් ම ප්‍රේෂණය කළ මුදල් ප්‍රමාණය දැක්වේ.

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 3.1.2.5 ආදායම් බදු එකතු කිරීම

ආදායම් බදු එකතු කිරීම සම්බන්ධයෙන් ගත් කල, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මෙම වසරේ දී ප්‍රශංසනීය කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත. 2023 වසරේ දී ඇස්තමේන්තුගත ආදායම් බද්ද රුපියල් බිලියන 859.50ක් වූ අතර එය පසුගිය වසරේ ඇස්තමේන්තුගත ආදායම් බද්ද වූ රුපියල් බිලියන 553.0ට වඩා සැලකිය යුතු වැඩිවීමකි. එය වඩා ඉහළ ඉලක්කයක් වුව ද, සැබෑ ආදායම ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා යමින් රුපියල් බිලියන 908.42ක් වෙත ළඟා විය. ඒ අනුව, මෙම වසරේ සැබෑ ආදායම් බදු එකතුව, ඉලක්කගත ආදායමට වඩා 5.69%ක අතිරික්තයක් පිළිබිඹු කරමින් රුපියල් බිලියන 48.92කින් වැඩි වී ඇත (ඇස්තමේන්තු කරන ලද රුපියල් බිලියන 859.50ට සාපේක්ෂව රුපියල් බිලියන 908.42ක් එකතු කරන ලදී). පසුගිය වසරේ සැබෑ ආදායම් බදු එකතුව වූ රුපියල් බිලියන 524.53ට සාපේක්ෂව මෙම වසරේ එකතුව වූ රුපියල් බිලියන 908.42 මගින් රුපියල් බිලියන 383.89ක චිත්තාකර්ෂණීය වැඩිවීමක් නියෝජනය වන අතර එය ආදායම් බදු ආදායමේ 73.19%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් බවට පත් වේ. මෙම සංඛ්‍යා මගින් බදු පරිපාලනයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව සම්බන්ධයෙන් පැහැදිලි කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරයි. සැලකිය යුතු

තරම් ඉහළ ඉලක්කයක් සාක්ෂාත් කර ගැනීමෙන් හා එම ඉලක්කය අබිබවා යාම මගින් මතු කර දැක්වෙන්නේ වර්තමාන බදු ප්‍රතිපත්තිවල හා බලාත්මකව පවතින යාන්ත්‍රණවල ශක්තිමත්භාවය පමණක් නොව ආදායම් එකතු කිරීමේ ප්‍රයත්නයට සැලකිය යුතු ලෙස අනුවර්තනය වී එය පුළුල් කිරීමට දෙපාර්තමේන්තුව සතු ධාරිතාවයයි.

**සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු එකතු කිරීම**

සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන යන ප්‍රභේද දෙකෙහිම ආදායම් බදු ආදායමේ සැලකිය යුතු වැඩිවීමක් සමග දෙපාර්තමේන්තුව මෙම වසරේ ආදායම් බදු එකතු කිරීමෙහි කැපී පෙනෙන සාර්ථකත්වයක් ලබා ගෙන ඇත. බදු බැඳියා සීමාව අඩු කිරීම, බදු ගෙවිය යුතු පරාසය වෙනස් කිරීම, සහ අත්තිකාරම් ආදායම් බදු ක්‍රමය (රඳවා ගැනීමේ බද්ද ලෙස කලින් හඳුන්වන ලද) සහ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ක්‍රමය (උපයන විට ගෙවීමේ බද්ද ලෙස කලින් හඳුන්වන ලද) යළි හඳුන්වා දීම ඇතුළුව සිදු කරන ලද වැදගත් ප්‍රතිපත්ති වෙනස්කම් මගින් 2023 වසරේ දී සමස්ත බදු ආදායම් එකතුව ශක්තිමත් විය. තක්සේරු වර්ෂයේ පළමු මාස නවය සඳහා ඉකුත් බදු නීතියත් අවසාන මාස තුන සඳහා නව වෙනස් කිරීම් හඳුන්වාදීමත් හේතුවෙන් ඇති වූ සංකීර්ණත්වය මධ්‍යයේ වුවද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ප්‍රශංසනීය කාර්ය සාධනයක් පෙන්වා ඇත.

පසුගිය වසරේ රුපියල් බිලියන 455.16ට සාපේක්ෂව මෙම වසරේ සංස්ථාපිත ආදායම් බදු එකතුව රුපියල් බිලියන 557.02 දක්වා ළඟා වී ඇත. මෙය රුපියල් බිලියන 101.86ක වැඩි වීමක් නියෝජනය කරන අතර 22.38%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයකි. මෙම වසරේ සංස්ථාපිත නොවන ආදායම් බදු එකතුව රුපියල් බිලියන 351.40ක් වන අතර එය පසුගිය වසරේ වැඩිවීම වූ රුපියල් බිලියන 69.38ට අනුව සැලකිය යුතු වැඩිවීමකි. මෙය රුපියල් බිලියන 282.02ක වැඩිවීමකි. එය 406.51%ක කැපී පෙනෙන වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයකි. බදු බැඳියා සීමාව අඩු කිරීම, බදු ගෙවිය යුතු පරාසය වෙනස් කිරීම ඇතුළු ප්‍රතිපත්තිමය වෙනස්කම් සමග අත්තිකාරම් ආදායම් බදු ක්‍රමය සහ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ක්‍රමය යළි හඳුන්වාදීම, සංස්ථාපිත නොවන ආදායම් බදු එකතුව වැඩි කිරීමෙහිලා මහඟු මෙහෙයක් ඉටු කරන ලදී.

සංස්ථාපිත නොවන බදු වෙතට සංස්ථාපිත බදු දක්වන අනුපාතය 87:13 සිට 61:39 දක්වා වෙනස් වීමට බදු ප්‍රතිපත්ති වෙනස් කිරීම් හේතු වූ අතර එය සංස්ථාපිත අංශයේ පුළුල් වීමට ඉඩ හසර සලසන ලදී.

බදු නීති වෙනස් කිරීම් තුළින් හඳුන්වා දෙන ලද සංකීර්ණතා පිළිබඳ සලකා බැලූ විට මෙම ජයග්‍රහණ විශේෂයෙන්ම චිත්තාකර්ෂණීය වේ. මෙහිදී පළමු නව මාසය තුළ කලින් පැවති නීතිය ද අවසාන තුන් මාසය තුළ නව වෙනස් කිරීම් අනුව කටයුතු කිරීමට සිදු වීම පරිපාලනයට මෙන්ම අනුකූලතාවට ද අභියෝගයක් විය. කෙසේ වුව ද, සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන යන ප්‍රභේද දෙකෙහිම බදු ආදායමේ සැලකිය යුතු වැඩිවීම මගින් දැක්වෙන්නේ මෙම අභියෝග පරිපාලනය විසින් සාර්ථක ලෙස ජය ගත් බවය.

සමස්තයක් වශයෙන් ගත් කල, මෙම වසරේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය මගින් පෙනී යන්නේ සංකීර්ණ ප්‍රතිපත්ති වෙනස්කම් ක්‍රියාත්මක කර විශාල ආදායම් වර්ධනයක් අත්පත් කර ගැනීමට දෙපාර්තමේන්තුව සතු ශක්තිමත් හැකියාවයි. මෙම ජයග්‍රහණ රජයේ මූල්‍ය ස්ථාවරවත්වයට සැලකිය යුතු ලෙස දායක වන අතර බදු ක්‍රමය ඵලදායී ලෙස කළමනාකරණය කිරීමෙහිලා මෙන්ම පුළුල් කිරීමෙහිලා පරිපාලනය විසින් ඉටු කරනු ලබන වැදගත් කාර්යභාරය අවධාරණය කරයි.

3.5 වගුව මගින් දැක්වෙන්නේ 2022 වසරේ සහ 2023 වසරේ සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු සංයුතිය සහ සැසඳීමකි.

### 3.5 වගුව : සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු

| | 2023 | | 2022 | |
|---|---|---|---|---|
| | බදු රැස් කිරීම (රු.) | % | බදු රැස් කිරීම (රු.) | % |
| සංස්ථාපිත* | 557,018,961,826 | 61% | 455,157,793,291 | 87% |
| සංස්ථාපිත නොවන** | 351,398,689,876 | 39% | 69,376,004,290 | 13% |
| **එකතුව** | **908,417,651,702** | **100%** | **524,533,797,581** | **100%** |

*2023 වසරේ රුපියල් මිලියන 47ක් ද 2022 වසරේ රුපියල් මිලියන 251ක් ද වූ ලාභාංශ බද්ද ඇතුළත් වේ.
**සේවා නියුක්තිකයන් විසින් අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ක්‍රමය යටතේ ගෙවන ලද රඳවා ගැනීමේ බද්ද සහ ආදායම් බද්ද ඇතුළත් වේ.

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### සටහන 3.4 : 2023 හා 2022 වසරවල සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු එකතුව




*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**3.1.2.6 එකතු කළ අගය මත බදු එකතු කිරීම**

එකතු කළ අගය මත බද්ද පිළිබඳ සලකා බලන කල්හි, එය සාර්ථක ලෙස ඉලක්ක සපුරා ගනිමින් එම ඉලක්ක ඉක්මවා යමින් කැපී පෙනෙන කාර්යක්ෂමතාවක් පෙන්නුම් කර ඇත. 2023 වසරේ දී එකතු කළ අගය මත බද්ද සඳහා ඇස්තමේන්තු කළ අගය රුපියල් බිලියන 680.50ක් වූ අතර එය පසුගිය වසරේ ඇස්තමේන්තුව වූ රුපියල් බිලියන 533.0ට වඩා සැලකිය යුතු ලෙස ඉහළ අගයකි. මෙය අභියෝගාත්මක ඉලක්කයක් වුව ද, එකතු කළ අගය මත බදු එකතුවේ සැබෑ ශුද්ධ වටිනාකම (ආපසු ගෙවීම් අඩු කිරීමෙන් පසු) රුපියල් බිලියන 694.46ක් විය. මෙම එකතු කළ අගය මත බදු එකතුවේ සැබෑ ශුද්ධ වටිනාකම ඉලක්කගත අගයට වඩා 2.05%ක අතිරික්තයක් ලබා දෙමින් රුපියල් බිලියන 13.96කින් ඇස්තමේන්තුගත අගය ඉක්මවා ඇත. (ඇස්තමේන්තුගත රුපියල් බිලියන 680.50ට සාපේක්ෂව රුපියල් බිලියන 694.46ක් එකතු කරන ලදී). පසුගිය වසරේ සැබෑ එකතුව වූ රුපියල් බිලියන 463.07ට සාපේක්ෂව මෙම වසරේ එකතුව වූ රුපියල් බිලියන 694.46 මගින් රුපියල් බිලියන 231.38ක වැඩිවීමක් නියෝජනය වන අතර එය එකතු කළ අගය මත බදු ආදායමේ 49.97%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයකි.

වඩා ඉහළ ඉලක්කයක් අබිබවා යමින් ලබා ගත් මෙම ජයග්‍රහණය මගින් ඉස්මතු කර දක්වන්නේ වර්තමාන එකතු කළ අගය මත බදු ප්‍රතිපත්තිවල හා බදු එකතු කිරීමේ උපායමාර්ගයන්හි ඵලදායිත්වයයි. තවද, මෙම වසර තුළ සිදු වූ බදු

අනුප්‍රමාණවල වෙනස්කම් පිළිබඳ සලකා බැලීමේ දී විශේෂයෙන්ම මෙම ජයග්‍රහණ විශිෂ්ටත්වයට පත් වේ. ප්‍රතිපත්තිමය මට්ටමේ වෙනස්කම් ක්‍රියාත්මක කිරීම නිරන්තරයෙන්ම අවිනිශ්චිතතාවට හේතුවනවා මෙන්ම බදුගෙවන්නන්ගේ හැසිරීම සකස් කිරීමට ද හේතු වේ. නමුත් ඉහළ ඉලක්කයක් සපුරා ගැනීමට පමණක් නොව එය ඉක්මවා යාමට දෙපාර්තමේන්තුව සතු වූ හැකියාව මගින් පෙන්නුම් කරන්නේ ඵලදායී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ බදු එකතු කිරීමේ ශක්තිමත් යාන්ත්‍රණයයි.

### 3.6 වගුව : එකතු කළ අගය මත බදු දළ එකතුව සහ ආපසු ගෙවීම්

| අංශය | 2023 | | | 2022 | | |
|---|---|---|---|---|---|---|
| | දළ එකතුව (රු.) | ආපසු ගෙවීම් (රු.) | ශුද්ධ එකතු කිරීම (රු.) | දළ එකතුව (රු.) | ආපසු ගෙවීම් (රු.) | ශුද්ධ එකතු කිරීම (රු.) |
| **නිෂ්පාදන** | 180,564,694,200 | 660,201,133 | 179,904,493,067 | 112,814,295,865 | 673,522,064 | 112,140,773,801 |
| **නිෂ්පාදන නොවන** | 289,202,932,959 | - | 289,202,932,959 | 179,478,446,933 | - | 179,478,446,933 |
| මූල්‍ය නොවන සේවා | 200,674,146,441 | - | 200,674,146,441 | 116,010,177,196 | - | 116,010,177,196 |
| මූල්‍ය සේවා | 88,528,786,518 | - | 88,528,786,518 | 63,468,269,737 | - | 63,468,269,737 |
| **ආනයන** | 225,401,273,133 | 48,469,429 | 225,352,803,704 | 171,478,020,566 | 25,581,768 | 171,452,438,798 |
| **එකතුව** | **695,168,900,292** | **708,670,562** | **694,460,229,730** | **463,770,763,364** | **699,103,832** | **463,071,659,532** |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### සටහන 3.5 : ඒ ඒ අංශය අනුව එකතු කළ අගය මත බදු රැස් කිරීම




*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

මෙම වර්ෂය තුළ නිෂ්පාදන අංශයේ එකතු කළ අගය මත බදු රැස් කිරීම දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.65% ක් ද නිෂ්පාදන නොවන අංශයේ ආදායම 1.05%ක් ද ලෙස වාර්තා වූ අතර ආනයන අංශයෙන් 0.82% ක් දළ දේශීය නිෂ්පාදිතය සඳහා වාර්තා විය. එකතු කළ අගය මත බදු ආදායමේ ශුද්ධ එකතුව 3.7 වගුව මගින් දැක්වෙන අතර එකතු කළ අගය මත බදු රැස් කිරීම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 3.6 සටහන මගින් නිරූපණය කර ඇත.

### 3.7 වගුව : එකතු කළ අගය මත බද්ද දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය ඒ ඒ අංශය අනුව විශ්ලේෂණය කිරීම

| අංශය | 2023 | | 2022 | | දළ දේශීය නිෂ්පාදිතයට එකතු කළ අගය මත බදු රැස් කිරීමේ ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ශුද්ධ එකතු කිරීම (රු.) | % | ශුද්ධ එකතු කිරීම (රු.) | % | 2023 | 2022 | 2021 | 2020 | 2019 |
| නිෂ්පාදන අංශය | 179,904,493,067 | 25.91% | 112,140,773,801 | 24.22% | 0.65% | 0.47% | 0.23% | 0.27% | 0.54% |
| නිෂ්පාදන නොවන අංශය | 289,202,932,959 | 41.64% | 179,478,446,933 | 38.76% | 1.05% | 0.75% | 0.83% | 0.67% | 1.19% |
| ආනයන මත | 225,352,803,704 | 32.45% | 171,452,438,798 | 37.03% | 0.82% | 0.71% | 0.70% | 0.56% | 1.07% |
| **එකතුව** | **694,460,229,730** | **100%** | **463,071,659,532** | **100%** | **2.51%** | **1.92%** | **1.75%** | **1.49%** | **2.79%** |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව*

### සටහන 3.6 : දළ දේශීය නිෂ්පාදිතයට එකතු කළ අගය මත බද්ද දක්වන දායකත්වය ඒ ඒ අංශය අනුව විශ්ලේෂණය කිරීම




*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**3.1.2.7 සමාජ ආරක්ෂණ දායකත්ව බදු එකතු කිරීම**

2023 වසරේ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද රැස් කිරීමේ දී බදු පරිපාලනය විසින් කැපී පෙනෙන කාර්යක්ෂමතාවක් පෙන්වා ඇත. පසුගිය වසරේ අවසන් කාර්තුවේ දී ක්‍රියාත්මක කරන ලද මෙම සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා මෙම වසරේ ඇස්තමේන්තුව වූයේ රුපියල් බිලියන 210කි. කෙසේ වුවද, එම ඉලක්කය අබිබවා යමින් මෙම වසරේ සැබෑ එකතුව රුපියල් බිලියන 216.18 දක්වා ඉහළ නැංගේය. සමාජ ආරක්ෂණ දායකත්ව බද්දේ සැබෑ රැස් කිරීම, එහි ඇස්තමේන්තු කළ අගය රුපියල් බිලියන 6.18කින් ඉක්මවා ගිය අතර එය ඉලක්කගත අගයට වඩා 2.94%ක අතිරික්තයකි. (ඇස්තමේන්තු කළ රුපියල් බිලියන 210ට සාපේක්ෂව රුපියල් බිලියන 216.18ක් එකතු කරන ලදී.)

වඩාත් පැහැදිලි පර්යා දර්ශනයක් සැපයීම පිණිස වෙනස් කෝණයකින් බැලීමේ දී, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද එකතු කරන ලද්දේ පසුගිය වසරේ එක් කාර්තුවක පමණි. එහි කාර්තුමය එකතුවේ සාමාන්‍යය දළ වශයෙන් රුපියල් බිලියන 36.11කි. මුළු වර්ෂය මුළුල්ලෙහිම සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද බලාත්මකව පවතින මෙම වසරේ කාර්තුමය වශයෙන් රැස් කළ මුදලේ සාමාන්‍යය දළ වශයෙන්

රුපියල් බිලියන 54.05 දක්වා ඉහළ නැග ඇත. මෙමගින් කාර්තුමය බදු රැස් කිරීමේ සාමාන්‍යයෙහි, ආසන්න වශයෙන් 49.66%ක වර්ධන අනුපාතිකයක් පෙන්වන අතර එය දෙපාර්තමේන්තුවේ බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා බදු රැස් කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ප්‍රදර්ශනය කරයි.

මෙවැනි ජයග්‍රහණ මගින් පිළිබිඹු වන්නේ නව අය බදු හඳුන්වා දී වේගවත්ව ස්ථාවරවීමට දෙපාර්තමේන්තුව සතු හැකියාවයි. මෙසේ බදු එකතුවෙහි අතිරික්තයක් ලැබීමෙන් සහ විශිෂ්ට වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා වීම මගින් පෙන්නුම් කරන්නේ, ඵලදායී බලාත්මක කිරීමේ සහ අනුකූලතාගත කිරීමේ යාන්ත්‍රණයි. සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සාර්ථකව ආරම්භ කර බදු එකතු කර ගැනීම, සමාජ සුභසාධන වැඩසටහන් සඳහා ශක්තිමත් මූල්‍ය පදනමක් සපයමින් සමාජ ආරක්ෂණ ක්‍රමයට සැලකිය යුතු දායකත්වයක් ලබා දේ. මෙම කාර්ය සාධනය මගින් මතු කර දක්වන්නේ උපාය මාර්ගික බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ කාර්යක්ෂම ආදායම් රැස් කිරීම තුළින් රාජ්‍ය මූල්‍ය තත්ත්වය පුළුල් කිරීමෙහිලා දෙපාර්තමේන්තුව සතු කාර්යභාරයයි.

**3.8 වගුව : සමාජ ආරක්ෂණ දායකත්ව බදු එකතු කිරීම වී වී අංශ අනුව විශ්ලේෂණය කිරීම**

| | 2023 | | 2022 | |
|---|---|---|---|---|
| | බදු රැස් කිරීම (රු.) | ප්‍රතිශතය % | බදු රැස් කිරීම (රු.) | ප්‍රතිශතය % |
| නිෂ්පාදන අංශය | 52,564,896,761 | 24.32% | 10,167,031,812 | 28.15% |
| සේවා අංශය | 112,350,531,382 | 51.97% | 13,191,134,085 | 36.53% |
| ආනයන | 51,265,118,412 | 23.71% | 12,752,864,609 | 35.32% |
| **එකතුව** | **216,180,546,555** | **100%** | **36,111,030,506** | **100%** |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 3.1.2.8 සෘජු බදු හා වක්‍ර බදු

සෘජු බදු, පුද්ගලයන් හා සංවිධාන මත සෘජුවම පනවන අතර එසේ පැනවීමට යටත් තැනැත්තා විසින් එය සෘජුවම රජයට ගෙවනු ලැබේ. පහත සඳහන් බදු වර්ග සෘජු බදු වශයෙන් සලකනු ලැබේ.

- **සංස්ථාපිත බද්ද:** ව්‍යාපාර ලාභ මත පනවනු ලබන අතර මෙහෙයුම් පිරිවැය සහ අනෙකුත් ඉඩ දිය හැකි වියදම් අඩු කිරීමෙන් පසු ගණනය කරනු ලැබේ.
- **ධන බද්ද:** දේපොළ, ආයෝජන සහ ඉතිරි කිරීම් ඇතුළු හිමි වත්කම්වල වටිනාකම මත පදනම් වේ.
- **ප්‍රාග්ධන ලාභ බද්ද:** වත්කම් හෝ ආයෝජන විකිණීමෙන් ලැබෙන ලාභයට අදාළ වේ.

සෘජු බදු සාමාන්‍යයෙන් අනුක්‍රමික බදු වන අතර එයින් අදහස් කරන්නේ ඉහළ ආදායම් ලබන්නන් අඩු ආදායම් ලබන්නන්ට සාපේක්ෂව සිය ආදායමෙන් විශාල ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවන බවයි. මෙම සෘජු බදු ආදායම් අසමානතාව අඩු කිරීම සහ බදු බර සාධාරණ ලෙස බෙදී යාම සහතික කිරීම සඳහා ඵලදායී වේ.

වක්‍ර බදු, ආදායම් හෝ ලාභයට වඩා භාණ්ඩ හා සේවා මත අය කෙරේ. ඒවා සාමාන්‍යයෙන් නිෂ්පාදනයේ මිලට ඇතුළත් කර, පාරිභෝගිකයා වෙත බද්ද යවනු ලබන විකුණුම්කරු විසින් රජයට ගෙවනු ලැබේ. පහත සඳහන් බදු වර්ග වක්‍ර බදු ලෙස සලකනු ලැබේ.

- **එකතු කළ අගය මත බද්ද:** නිෂ්පාදනයේ සහ බෙදා හැරීමේ සෑම අදියරකදීම අදාළ වන අතර, අවසාන පාරිභෝගිකයා විසින් අත්‍යන්ත බදු බර දරනු ලැබේ.
- **සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද:** සිල්ලර භාණ්ඩ හා සේවා මත විකුණුම් ස්ථානයේ දී අය කෙරේ.
- **සුරාබදු:** මත්පැන්, දුම්කොළ සහ ඉන්ධන වැනි විශේෂිත භාණ්ඩ සඳහා නිශ්චිත වූ බද්දකි.
- **රේගු තීරුබදු:** දේශීය කර්මාන්ත ආරක්ෂා කරන අතරම ආදායම් උත්පාදනය කිරීම සඳහා ආනයනික භාණ්ඩ මත අය කෙරේ.

වක්‍ර බදු සාමාන්‍යයෙන් ප්‍රතිපායන බදු වන අතර ඊට හේතුව එම බදු, ඉහළ ආදායම් ලබන පාරිභෝගිකයන් හා සැසඳීමේ දී අඩු ආදායම්ලාභී පාරිභෝගිකයන්ගේ ආදායමෙන් විශාල ප්‍රතිශතයක් ගන්නා බැවිනි. කෙසේ වුවද, එකතු කිරීම සහ අනුකූල වීම සම්බන්ධයෙන් ගත් කල්හි, ඒවා

කාර්යක්ෂම වන අතර පාරිභෝගික හැසිරීම් රටාවට බලපෑම් කිරීමට භාවිත කළ හැකිය (උදා: දුම්කොළ මත බදු පැනවීමෙන් දුම්පානය අඩු කිරීම සඳහා).

ප්‍රශස්ත බදු සංයුතියක් මගින් සෘජු සහ වක්‍ර බදු යන දෙකෙහිම ශක්තිමත්භාවයන් සහ දුර්වලතාවන් තුලනය කර ආර්ථික කාර්යක්ෂමතාව, සාධාරණත්වය සහ ආදායමේ ප්‍රමාණවත් බව ප්‍රවර්ධනය කරනු ලබයි.

- **ආර්ථික කාර්යක්ෂමතාව:** ශ්‍රම සැපයුමේ විකෘති වීම් සහ ආයෝජන තීරණවල විකෘති වීම් අවම වන පරිදි සෘජු බදු ව්‍යුහගත කළ යුතුය. ව්‍යාපාර ආයෝජන දිරිගැන්වීම සඳහා අනුක්‍රමික ආදායම් බදු වඩා අඩු සංස්ථාපිත බදු සමග තුලනය කළ හැකිය. අනුකූලතා පිරිවැය සහ ආර්ථික විකෘති වීම් අවම කිරීම සඳහා වක්‍ර බදු, අවම නිදහස් කිරීම් සහිතව පුළුල් පදනමක් මත පිහිටු විය යුතුය.
- **සාධාරණත්වය:** අනුක්‍රමික පුද්ගල ආදායම් බදු ක්‍රමයක් මගින් ආදායම් අසමානතාව අඩු කර බදු බර සාධාරණ ලෙස බෙදී යාම තහවුරු කරනු ලැබේ. අඩු ආදායම්ලාභී කුටුම්බ මත ඇති වන අධික බදු බර වළක්වා ගැනීමට හැකි වන අයුරින් වක්‍ර බදු සැලසුම් කළ යුතු අතර, ඒ සමහරවිට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සඳහා නිදහස් කිරීම් හෝ අඩු අනුපාත ලබා දීම මගිනි.
- **ආදායමේ ප්‍රමාණවත්බව:** සෘජු සහ වක්‍ර බදු සංකලනයක් මගින් ස්ථාවර ආදායම් ප්‍රවාහයක් සහතික කරයි. ආර්ථික වර්ධනයක් සිදු වන කාලපරිච්ඡේද තුළ සෘජු බදු මගින් ප්‍රමාණවත් ආදායමක් ලබා දෙන අතර, වක්‍ර බදු මගින්, වහා වෙනස් වන සුළු නොවන පරිභෝජනය හරහා සංගත ආදායමක් ලබා දෙයි.
- **ප්‍රතිපත්තිමය අරමුණු:** පාරිසරික බදු පැනවීම හරහා කාබන් විමෝචනය අඩු කිරීම හෝ හානිකර නිෂ්පාදන මත සුරාබදු පැනවීම හරහා සෞඛ්‍යයට අහිතකර හැසිරීම් රටා අධෛර්යවත් කිරීම වැනි නිශ්චිත ප්‍රතිපත්තිමය අරමුණු සාක්ෂාත් කර ගැනීමට වක්‍ර බදු භාවිත කළ හැකිය.

සාරාංශයක් ලෙස ගතහොත්, ප්‍රශස්ත බදු සංයුතියක මනාව තුලනය වූ සෘජු සහ වක්‍ර බදු සංකලනයක් ඇතුළත් වේ. මෙම තුලිත බව, පුළුල් ප්‍රතිපත්තිමය අරමුණු සාක්ෂාත් කර ගැනීමට රුකුල් දෙමින් ආර්ථික කාර්යක්ෂමතාව, සාධාරණත්වය සහ ප්‍රමාණවත් රාජ්‍ය ආදායමක් ලබා ගැනීමට හැකි වන අයුරින් ප්‍රවේශම් සහගත ලෙස සකස් කළ යුතුය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2023 දී එකතු කළ මුළු ආදායමෙන් 50.1%ක කොටසක් වාර්තා වූයේ සෘජු බදුවලිනි. සෘජු බදුවලට වක්‍ර බදු අනුපාතය 50.1 : 49.9 විය.

### 3.1.3 ආදායම පසුගිය වසර සමග සැසඳීම

පසුගිය අනුයාත වසර තුනෙහි මුළු ආදායම් එකතුව සහ 2023 වර්ෂයේ ආදායම 2022 වර්ෂයේ ආදායම සමග සැසඳීම 3.9 වගුව මගින් දැක්වේ. 3.7 සටහන මගින් පෙන්නුම් කරන්නේ 2023 වසරේ ආදායම 2022 වසරේ ආදායම සමග සංසන්දනය කිරීමකි. ඇමුණුම 06 මගින් පෙන්නුම් කරන්නේ පසුගිය අනුයාත සිව් වසර තුළ මුළු ආදායම් රැස් කිරීමය.

**3.9 වගුව : 2023 හා 2022 වර්ෂවල ආදායම සංසන්දනය කිරීම**

| බදු වර්ගය | 2022 වසරේ ආදායම් එකතු කිරීම (රු.) | 2023 වසරේ ආදායම් එකතු කිරීම (රු.) | වාර්ෂික ලක්ෂ්‍යමය වැඩිවීම/ අඩුවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ආදායම් බද්ද | 524,533,797,581 | 908,417,651,702 | 73.19% |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 5,315,389,458 | 2,679,199,097 | -49.60% |
| එකතු කළ අගය මත බද්ද | 463,071,659,532 | 694,460,229,730 | 49.97% |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 36,111,030,506 | 216,180,546,555 | 498.66% |
| ඔට්ටු හා සූදු බද්ද | 5,244,762,337 | 6,921,816,561 | 31.98% |
| කොටස් ගනුදෙනු බද්ද | 4,215,856,857 | 2,477,736,910 | -41.23% |
| විගමන බද්ද | 10,728,103 | 14,350,332 | 33.76% |
| කැසිනෝ බලපත්‍ර ගාස්තු | 2,000,000,000 | 500,000,000 | -75.00% |
| අනෙකුත් බදු* | 17,576,879,349 | 10,663,585,979 | -39.33% |
| **මුළු ආදායම් රැස් කිරීම** | **1,058,080,103,723** | **1,842,315,116,864** | **74.12%** |

*අනෙකුත් බදුවලට ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද, ණය ආපසු ගෙවීමේ බද්ද, මුද්දර ගාස්තු, ආර්ථික සේවා ගාස්තු, ජාතිය ගොඩනැගීමේ බද්ද, භාණ්ඩ හා සේවා බද්ද, පිරිවැටුම් බද්ද සහ ජාතික ආරක්ෂක බද්ද ඇතුළත් වේ

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**සටහන 3.7 : 2023 වසරේ ආදායම 2022 වසරේ ආදායම සමග සන්සන්දනය කිරීම**




*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

## 3.2 අනෙකුත් ප්‍රධාන ජයග්‍රහණ

### 3.2.1 ආදායම් රැස් කිරීම ශක්තිමත් කිරීමට ආරම්භ කළ අනෙකුත් ක්‍රියාමාර්ග

#### 3.2.1.1 බදු අභියාචනා නිරවුල් කිරීම

ගත වූ වර්ෂය තුළ නිකුත් කළ තක්සේරුවලට එරෙහිව ලැබී ඇති අභියාචනා 1,210ක් නිරවුල් කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමත් වූ අතර අභියාචනා විශ්ලේෂණය පහත පරිදි වේ.

**3.10 වගුව : ලැබුණු සහ නිරවුල් කළ අභියාචනා පිළිබඳ විශ්ලේෂණය**

| | ආ.බ. | එ.අ.බ. | උ.වි.ගෙ. | ජා.ගො.බ. | ර.ගැ.බ. | ස.ආ.දා.බ. | ණ.ආ. ගෙ.බ. | අ.බ. | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2023.01.01 දිනට ශේෂය | 430 | 1,030 | 4 | 66 | 2 | - | - | - | 1,532 |
| වසර තුළ ලියාපදිංචි කිරීම් (APL 2 ප්‍රකාරව) | 273 | 1,772 | 5 | 44 | 10 | 2 | 21 | 2 | 2,129 |
| නිරවුල් කිරීම් | 230 | 889 | 5 | 55 | 9 | - | 21 | 1 | 1,210 |
| කොමසාරිස් ජනරාල්වරයාගේ කරුණු විමසීම සඳහා ඉදිරිපත් කිරීම් | 13 | 277 | - | - | - | - | - | - | 290 |
| ප්‍රතික්ෂේප කිරීම්/ ආපසු යැවීම්/ මාරු කිරීම් | 7 | 18 | - | 1 | - | - | - | - | 26 |
| **2023.12.31 දිනට ශේෂය** | **453** | **1,618** | **4** | **54** | **3** | **2** | **-** | **1** | **2,135** |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

#### 3.2.1.2 ලියාපදිංචි බදු ගෙවන්නන්ගේ වැඩිවීම

ඉකුත් වර්ෂය හා සන්සන්දනය කිරීමේදී, බදු පදනම සැලකිය යුතු මට්ටමකට පුළුල් වී තිබේ. වර්ෂ අවසානය වන විට විවිධ බදුකරණ කාර්යයන් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ තැනැත්තන් සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

### 3.11 වගුව : ලියාපදිංචි වී ඇති බදු ගෙවන්නන් සංඛ්‍යාව

| | 2022.12.31 දිනට | | 2023.12.31 දිනට | |
|---|---|---|---|---|
| **ආදායම් බදු** | | | | |
| **සංස්ථාපිත** | | | | |
| වාසික සමාගම් / නිර්වාසික සමාගම් | 73,444 | | 82,437 | |
| **සංස්ථාපිත නොවන** | | | | |
| තනි පුද්ගල | 204,467 | | 539,862 | |
| හවුල් ව්‍යාපාර | 13,766 | | 14,800 | |
| උපයන විට ගෙවීමේ (උ.වි.ගෙ.) / අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (අ.පු.ආ.බ.) යෝජනා ක්‍රමය යටතේ ආදායම් බදු ගෙවන සේවා නියුක්තිකයන් | 41,636 | | 242,679 | |
| මුළු ආදායම් බදු ගෙවන්නන් සංඛ්‍යාව | | **333,313** | | **879,778** |
| **වෙනත් බදු ගෙවන්නන්** | | | | |
| එකතු කළ අගය මත බද්ද (එ.අ.බ.) සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 10,604 | | 13,851 | |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 258 | | 277 | |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 5,422 | | 8,107 | |
| ඔට්ටු හා සූදු බදු සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 624 | | 624 | |
| **වෙනත් බදු ගෙවන්නන්ගේ එකතුව** | | **16,908** | | **22,859** |
| උ.වි.ගෙ./අ.පු.ආ.බ. යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචිවී ඇති සේවායෝජකයන් | 34,596 | | 39,617 | |
| පොලිය මත රඳවාගැනීමේ බද්ද / අ.ආ.බ. සඳහා ලියාපදිංචි වී ඇති රඳවා ගැනීමේ බදු / අත්තිකාරම් ආදායම් බදු අනුයෝජිතයින් | 612 | | 771 | |
| විශේෂිත ගාස්තු මත රඳවාගැනීමේ බදු / අත්තිකාරම් ආදායම් බදු (අ.ආ.බ.)/ (මාසික උපලේඛන නිතිපතා එවන්නන්) | 41,897 | | 44,240 | |
| මුද්දර බද්ද (මාසික උපලේඛන නිතිපතා එවන්නන්) | 10,221 | | 10,593 | |
| | | **87,326** | | **95,221** |
| **ලියාපදිංචි වී ඇති මුළු බදු ගෙවන්නන් සංඛ්‍යාව** | | **437,547** | | **997,858** |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

#### 3.2.1.3 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරු අනුව අයවිය යුතු බදු මුදල

බදු පරිපාලකයන් විසින් නිල තක්සේරු නිකුත් කිරීමේදී ගෝලීය සන්දර්භයේදී වුවද බදු නීති විධිවිධාන යටතේ මෙම තක්සේරු සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කිරීම ඇතැම් බදු ගෙවන්නන්ට පොදු කරුණකි. මෙම අභියාචිත තක්සේරු අවසානාත්මක හා තීරණාත්මක ලෙස බදු නිරාකරණ මණ්ඩල හෝ ඉහළ අධිකරණයන් මගින් තීරණය කරන තුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට එම බදු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගත නොහැකි වීම නිසා ඒවා තවදුරටත් මතභේදාත්මක වන නිසා අත්හිටවූ බදු ලෙස හැඳින්වේ.

මතභේදයට හේතු වූ බදු අගයන් වශයෙන් හැඳින්වෙන්නේ දැනට නෛතික තර්කයන්ට යටත්ව පවතින අගයන්ය. බදු ගෙවන්නන් තක්සේරුවලට එරෙහිව අභියාචනා කර ඇති හෙයින් මෙම බදු අවසානාත්මක නොවේ. අභියාචනා ක්‍රියාවලිය අවසන් වන තුරු මෙම මෙම බදුවල තත්ත්වය අවිනිශ්චිතව පවතින අතර අදාළ නෛතික අධිකාරීන් වෙතින් තීරණ සපයනු ලැබේ. මතභේදයට හේතු වූ බදු විභේදනය කිරීම මගින් ගෙවීම සඳහා මග පෙන්වමින් මුල් තක්සේරුව සහතික කිරීම හෝ බදු බැඳියාව ඌනනය කරමින් හෝ අවලංගු කරමින් ගැළපීම් කිරීම සිදු කරනු ලබයි.

එකතු කළ යුතු හිග මුදල, බදු ගෙවන්නන් විසින් අභියාචනය නොකරන ලද හෝ අභියාචනය කරන ලද නමුත් ඒ සඳහා තීරණ ලැබී ඇති තක්සේරු හා සම්බන්ධ බදු වේ. නමුත්, මෙම තක්සේරු අවසානාත්මකව පැවතිය ද බදු නොගෙවන ලද අවස්ථා පවතී. මෙම අයවිය යුතු බදු මගින් තහවුරු කළ බැඳියාවන් දක්වන අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඒවා රැස්කිරීමට අපේක්ෂා කරයි.

සංක්ෂිප්ත වශයෙන් මතභේදයට හේතු වූ බදු, නෛතික සමාලෝචනය යටතේ පවතින අයකරගැනීමේ

විභවතාවක් පවතින ආදායම් වන අතර අය කළහැකි බදු වශයෙන් එකතුකිරීම සහතික කරන ලද ආදායම් වේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සාධනීය ක්‍රියාකාරීත්වය සඳහා මෙම අවස්ථා දෙක ම කාර්යක්ෂම ලෙස කළමනාකරණය සහ බේරුම් කිරීම අත්‍යවශ්‍ය වේ.

පැහැර හරින ලද බදු මුදල් ප්‍රමාණ, මතභේදයට ලක් වූ මුදල් ප්‍රමාණ සහ 2023 දෙසැම්බර් 31 දිනට එකතු කළ යුතු හිඟ මුදල 3.12 වගුව මගින් දැක්වේ.

**3.12 වගුව : 2023.12.31 දිනට අයවිය යුතු බදු පිළිබඳ විශ්ලේෂණය**

| බදු වර්ගය | දළ මුදල් ප්‍රමාණය (රු.'000) | | මතභේදයට හේතු වූ මුදල (අත්හිටවූ මුදල) (රු.'000) | | එකතු කළ යුතු මුදල (රු.'000) | |
|---|---|---|---|---|---|---|
| | බද්ද | දඩය හා පොළිය | බද්ද | දඩය හා පොළිය | බද්ද | දඩය හා පොළිය |
| ආදායම් බද්ද | 359,176,027 | 209,098,195 | 311,319,089 | 179,160,408 | 47,856,939 | 29,937,787 |
| ආදායම් බද්ද මත අධිභාරය | 128,716 | 84,184 | 128,716 | 84,184 | - | - |
| උ.වි.ගෙ. | 3,294,215 | 2,284,451 | 1,965,215 | 1,484,764 | 1,329,000 | 799,687 |
| උ.වි.ගෙ. - අධිභාරය | 20,891 | 13,613 | 20,891 | 13,613 | - | - |
| රඳවාගැනීමේ බද්ද | 4,157,266 | 1,863,595 | 4,003,628 | 1,795,143 | 153,638 | 68,452 |
| එකතු කළ අගය මත බද්ද | 177,089,493 | 171,219,708 | 119,602,038 | 123,367,592 | 57,487,455 | 47,852,116 |
| එකතු කළ අගය මත බද්ද - මූල්‍ය සේවා | 70,112,999 | 36,505,215 | 68,661,229 | 35,741,456 | 1,451,769 | 763,759 |
| ආර්ථික සේවා ගාස්තු | 5,560,188 | 3,322,924 | 5,560,188 | 3,322,924 | - | - |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 5,448,015 | 2,795,453 | 5,429,600 | 2,785,306 | 18,415 | 10,147 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද - මූල්‍ය සේවා | 2,744,644 | 1,361,057 | 2,591,739 | 1,284,561 | 152,905 | 76,495 |
| මුද්දර බද්ද | 9,733 | 4,866 | 9,733 | 4,866 | - | - |
| හර බද්ද | 2,215,581 | - | 2,215,581 | - | - | - |
| පිරිවැටුම් බද්ද | 605,341 | 300,595 | 605,341 | 300,595 | - | - |
| ජාතික ආරක්ෂක බද්ද | 14,601 | 4,238 | 14,601 | 4,238 | - | - |
| සමාජ වගකීම් බද්ද | 58 | - | 58 | - | - | - |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 1,105,361 | 586,874 | 1,105,361 | 545,385 | - | 41,489 |
| ඔට්ටු හා සූදු බද්ද | 3,995,786 | 1,567,758 | 3,484,140 | 1,319,623 | 511,646 | 248,135 |
| අත්තිකාරම් සමාගම් බද්ද | 76 | 24 | 76 | 24 | - | - |
| ආරක්ෂක බද්ද | 60,496 | 19,971 | 60,496 | 19,971 | - | - |
| සංයුක්ත දණ්ඩන | - | 16,819 | - | 16,819 | - | - |
| **එකතුව** | **635,739,487** | **431,049,538** | **526,777,720** | **351,251,472** | **108,961,767** | **79,798,065** |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

වර්ෂය තුළ අය කළ හැකි මුළු බදු සහ දඩ ප්‍රමාණය රුපියල් මිලියන 188,760කි.

වගුව තුළ මතභේදයට හේතු වූ බදු හා අය කළ හැකි බදු වශයෙන් දක්වන ලද අගයයන් දෙක ම 2023 දෙසැම්බර් මස 31 දිනට සමුච්චිත අගයයන් වේ. 2019 වර්ෂයේ සිට දිවයිනෙහි පවතින ව්‍යාකූල තත්ත්වය එබඳු ඉහළ සමුච්චිත අගයයන් ලැබීමට හේතු වී තිබේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිශ්චිත ඉලක්ක සකස් කරමින් පසුගිය අයවිය යුතු බදු අයකරගැනීමට වේගවත් පරිශ්‍රමයක නියැලෙමින් සිටියි.

#### 3.2.1.4 ඵලදායිතා අනුපාතය

දෙපාර්තමේන්තුවේ මුළු වියදමට සාපේක්ෂව රැස් කළ මුළු බදු ආදායම ලෙස ගණනය කරනු ලබන ඵලදායිතා අනුපාතය මගින් එහි වියදමට සාපේක්ෂව ආදායම් උත්පාදනය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව පිළිබඳ පැහැදිලි සංඥාවක් ලබා දේ. 2021, 2022 හා 2023 යන වසර තුනේ ඵලදායිතා අනුපාතයේ සවිස්තරාත්මක විශ්ලේෂණය පහත දැක්වේ.

**2021:** රැස් කළ මුළු බදු ආදායම රුපියල් මිලියන 632,830.59ක් වූ අතර මුළු වියදම රුපියල් මිලියන 4,577.00ක් විය. ඒ අනුව ඵලදායිතා අනුපාතය 138.26කි.

**2022:** රැස් කළ මුළු බදු ආදායම රුපියල් මිලියන 1,058,080.10ක් වූ අතර මුළු වියදම රුපියල් මිලියන 8,713.10ක් විය. ඒ අනුව ඵලදායිතා අනුපාතය 121.44කි. 2022 වසරේ වියදමට ඉකුත් වර්ෂ හා සම්බන්ධ ගෙවීම් (RAMIS මෘදුකාංග සැපයුම්කරුට ගෙවීමට තිබූ පසුගිය ඉන්වොයිසි සඳහා 2022 දෙසැම්බර් මාසයේ දී ගෙවීම් නිරවුල් කිරීම) ඇතුළත් තොරතුරු තාක්ෂණය (RAMIS) සඳහා වන ගෙවීම් ඇතුළත් බව සඳහන් කළ යුතුය.

**2023:** රැස් කළ මුළු බදු ආදායම රුපියල් මිලියන 1,842,315.12ක් වූ අතර මුළු වියදම රුපියල් මිලියන 7,539.50ක් විය. ඒ අනුව ඵලදායිතා අනුපාතය 244.36කි.

**පසුගිය වර්ෂ තුනේ ඵලදායිතා අනුපාතය විශ්ලේෂණය කිරීම:**

**2021:** 2021 වසර සඳහා ඵලදායිතා අනුපාතය 138.26කි. මෙම ඵලදායිතා අනුපාතය මගින් පෙන්වන්නේ දෙපාර්තමේන්තුව විසින් වියදම් කළ සෑම රුපියල් මිලියනයකටම දළ වශයෙන් රුපියල් මිලියන 138.26ක් බදු ආදායම වශයෙන් එකතු කර ඇති බවය. වෙනත් ආකාරයකට පැවසුවහොත්, ආදායම් එකතු කිරීමේ පිරිවැය අනුව, රු. 100ක් බදු ලෙස රැස් කිරීමට දෙපාර්තමේන්තුව වැය කර ඇත්තේ රු. 0.72ක් (ශත 72) පමණි. 2022 හා 2023 වර්ෂ හා සැසඳීමේ දී එකතු කර ඇති මුළු ආදායම වඩා අඩු වුව ද වඩා අඩු වියදම හේතු කොට ගෙන 2022 වසරට සාපේක්ෂව වඩා ඉහළ ඵලදායිතා අනුපාතයක් ලැබී ඇත.

**2022:** 2022 වසරේ ඵලදායිතා අනුපාතය 2021 වසරට වඩා අඩු අගයක් පෙන්වමින් දළ වශයෙන් 121.44ක් වී ඇත. මෙම ඵලදායිතා අනුපාතය මගින් පෙන්වන්නේ දෙපාර්තමේන්තුව විසින් වියදම් කළ සෑම රුපියල් මිලියනයකටම දළ වශයෙන් රුපියල් මිලියන 121.44ක් බදු ආදායම වශයෙන් එකතු කර ඇති බවය. වෙනත් ආකාරයකට පැවසුවහොත්, ආදායම් රැස් කිරීමේ පිරිවැය අනුව, රු. 100ක් බදු ලෙස රැස් කිරීමට දෙපාර්තමේන්තුව වැය කර ඇත්තේ රු. 0.82ක් (ශත 82) පමණි. මෙම පහත වැටීමට මූලික එකතුව හේතුව වූයේ තොරතුරු තාක්ෂණය සඳහා ඉහළ වියදමක් දැරීමට සිදු වීමය. එයට පසුගිය වර්ෂවල හිග ගෙවීම් ඇතුළත් විය. මෙසේ එක් වරක් පමණක් සිදු කළ වියදම, සමස්ත ඵලදායිතා අනුපාතය කෙරෙහි සෘණාත්මක බලපෑමක් එල්ල කරන ලදී.

**2023:** වර්ෂ තුන අතුරින් ඉහළම ඵලදායිතා අනුපාතය වන 244.36 වාර්තා වන්නේ 2023 වර්ෂය සඳහාය. මෙම ඵලදායිතා අනුපාතය මගින් පෙන්වන්නේ දෙපාර්තමේන්තුව විසින් වියදම් කළ සෑම රුපියල් මිලියනයකටම දළ වශයෙන් රුපියල් මිලියන 244.36ක් බදු ආදායම වශයෙන් එකතු කර ඇති බවය. වෙනත් ආකාරයකට පැවසුවහොත්, ආදායම් රැස් කිරීමේ පිරිවැය අනුව, රු. 100ක් බදු ලෙස රැස් කිරීමට දෙපාර්තමේන්තුව වැය කර ඇත්තේ රු. 0.41ක් (ශත 41) පමණි. මෙමගින් පෙන්නුම් කරන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවයේ සැලකිය යුතු වැඩි දියුණු වීමකි. ඒ සමගම වියදමේ මධ්‍යම ප්‍රමාණයේ ඉහළ යාමට සාපේක්ෂව මෙමගින් ආදායම් එකතු කිරීමේ සැහෙන වර්ධනයක් පෙන්නුම් කරයි. වර්ෂ තුන අතුරින් ඉහළම ඵලදායිතා අනුපාතය වන 244.36 වාර්තා වන්නේ 2023 වර්ෂය සඳහාය.

සාරාංශයක් ලෙස, ඵලදායිතා අනුපාතය මගින් මෙම වසර තුනක කාල සීමාව තුළ, විශේෂයෙන් ම 2023 වර්ෂයේ, දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවයේ සමස්ත වර්ධනයක් පෙන්නුම් කරයි. 2022 වර්ෂයේ

තොරතුරු තාක්ෂණ කටයුතු සඳහා ආයෝජනය කිරීමෙන් ඵලදායිතා අනුපාතය තාවකාලිකව අඩු වුව ද, 2023 වසරේ නිරීක්ෂණය කළ බදු ආදායමේ සැලකිය යුතු ඉහළ යාමට එය දායක වී ඇති බව පෙනේ. මෙම ප්‍රවණතාවයෙන් පෙන්නුම් කරන්නේ, කෙටි කාලීනව මිල අධික වුව ද, උපාය මාර්ගික ආයෝජන මගින් දීර්ඝ කාලීනව දෙපාර්තමේන්තුවේ ඵලදායිතාව හා ආදායම් උත්පාදනය කිරීමේ හැකියාවන් වර්ධනය කරන බවය.

**3.13 වගුව : ආදායම රැස් කිරීම, මුළු වියදම සහ ආදායම් රැස් කිරීමේ පිරිවැය**

රු. මිලියන

| විස්තරය | 2021 | 2022 | 2023 |
|---|---|---|---|
| ආදායම එකතු කිරීම | | | |
| ආදායම් බද්ද | 300,544.59 | 524,533.80 | 908,417.65 |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 667.88 | 5,315.39 | 2,679.20 |
| එකතු කළ අගය මත බද්ද | 308,213.04 | 463,071.66 | 694,460.23 |
| ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද | 174.62 | 3,969.89 | 11.78 |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 7.57 | 81.80 | 31.37 |
| ඔට්ටු හා සූදු බද්ද | 1,939.35 | 5,244.76 | 6,921.82 |
| කොටස් ගනුදෙනු බද්ද | 6,964.48 | 4,215.86 | 2,477.74 |
| විගමන බද්ද | 17.03 | 10.73 | 14.35 |
| මුද්දර ගාස්තු | 12,949.84 | 12,719.61 | 10,009.41 |
| ආර්ථික සේවා ගාස්තු | 728.11 | 201.75 | 246.68 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 599.13 | 585.05 | 359.35 |
| භාණ්ඩ හා සේවා බද්ද | 0.24 | - | 0.24 |
| පිරිවැටුම් බද්ද | 18.74 | 7.47 | 3.89 |
| ජාතික ආරක්ෂක බද්ද | 0.32 | 11.31 | 0.88 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 0.42 | - | - |
| ප්‍රේෂණ ගාස්තු | 5.21 | - | - |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | - | 36,111.03 | 216,180.55 |
| කැසිනෝ බලපත්‍ර ගාස්තු | - | 2,000.00 | 500.00 |
| **මුළු එකතු කිරීම** | **632,830.59** | **1,058,080.10** | **1,842,315.12** |
| වියදම | | | |
| පුනරාවර්තන වියදම | | | |
| පඩිනඩි | 2,707.27 | 2,994.54 | 2,999.20 |
| ගමන් වියදම් | 2.62 | 3.64 | 4.16 |
| සැපයුම් හා උපකරණ | 136.34 | 219.11 | 237.48 |
| නඩත්තු හා අලුත්වැඩියා | 183.54 | 203.79 | 338.27 |
| කොන්ත්‍රාත් සේවා | 584.13 | 625.17 | 816.28 |
| මාරුකිරීම් | 33.58 | 35.32 | 31.80 |
| ප්‍රාග්ධන වියදම | | | |
| ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම | 38.73 | 9.57 | 17.17 |
| අත්පත් කර ගැනීම | 50.62 | 16.90 | 18.21 |
| ධාරිතා ගොඩනැංවීම | 17.01 | 26.74 | 8.80 |
| ආයෝජන (RAMIS ව්‍යාපෘතිය) | 823.16 | 4,578.31 | 3,068.11 |
| **මුළු වියදම** | **4,577.00** | **8,713.10** | **7,539.50** |

| | | | |
|---|---|---|---|
| **රු.100 ක් රැස් කිරීම සඳහා පිරිවැය** | 0.72 | 0.82 | 0.41 |
| **රු.100 ක් රැස් කිරීම සඳහා පිරිවැය (ආනයන මත එකතු කළ අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, ආර්ථික සේවා ගාස්තු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද හැර)** | 0.90 | 1.00 | 0.48 |
| **ඵලදායිතා අනුපාතය** | **138.26** | **121.44** | **244.36** |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

## 3.3 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අභියෝග සහ අනාගත ඉලක්ක

### 3.3.1 අභියෝග

3.3.1.1 අවිධිමත් ආර්ථිකය

නියාමනය කරනු නොලැබූ සහ බදු අය කරනු නොලැබූ ආර්ථික ක්‍රියාකාරකම්වලින් සමන්විත අවිධිමත් ආර්ථිකය, සංවර්ධනය වෙමින් පවතින රටවල බදු පරිපාලනය කෙරෙහි සැලකිය යුතු අභියෝගයක් ඇති කරයි. එමගින්, රජයේ ආදායම් පදනමට හානි සිදුවීම, තරඟකාරීත්වය විකෘතිවීම සහ ආර්ථික වර්ධනයට බාධාවීම සිදුවේ. අවිධිමත් ආර්ථිකයෙහි කොටස්කරුවන් සෑමවිටම නෛතික සහ නියාමන රාමුවලින් පරිබාහිරව ක්‍රියාත්මක වන අතර, එම හේතුවෙන් බදු පරිපාලකයන්ට බදු පිළිබඳ අධීක්ෂණය කොට එය එකතු කර ගැනීමට අපහසු වේ.

ඉහත කී තත්ත්වය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ද සැබැවින්ම අභියෝගයකි. මෙම ගැටලු විසඳීම සඳහා අවිධිමත් ආර්ථිකයෙහි ප්‍රමාණය ක්‍රමිකව අඩු කිරීම සඳහා පියවර ගත යුතුය. ඒ සඳහා පළමුවෙන්ම බදු පද්ධතිය බදු නීති ආදිය සරල කිරීම තුළින්, අවිධිමත් ආර්ථික ක්‍රියාකාරකම් විධිමත් ආර්ථිකය සමග ඒකාබද්ධ කිරීම වඩා පහසු වනු ඇත. දෙවන පියවර ලෙස ඩිජිටල්කරණය මේ සඳහා උපයෝගී කර ගැනීමට හැකිය. බදු සඳහා ලියාපදිංචි වීම සහ බදු ගෙවීම සඳහා ඩිජිටල් මෙවලම් යොදා ගැනීම මගින් කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය වැඩි දියුණු කළ හැකිය. ජංගම ගෙවීම් පද්ධති සහ මාර්ගගත පහසුකම් භාවිතය තුළින් බදු බැඳීම් සමග අනුගතව ක්‍රියාත්මක වීම ව්‍යාපාර සඳහා වඩා පහසුවනු ඇත. තෙවනුව මහජන අවබෝධය පුළුල් කිරීම වැදගත් වේ. නෛතික ආරක්ෂාව සහ මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය ඇතුළු විධිමත්කරණයෙහි ප්‍රතිලාභ පිළිබඳව ව්‍යාපාර හිමිකරුවන් සහ මහජනතාව දැනුවත් කිරීම මගින් ඔවුන්ගේ ආකල්ප සහ හැසිරීම් වෙනස් කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. අවසාන වශයෙන්, බලාත්මක කිරීමේ ක්‍රමවේද වැඩි දියුණු කිරීම පිළිබඳව අවධානය යොමු කළ යුතුය. රාජ්‍ය ආයතන අතර වඩා හොඳ සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම තුළින්, සහ අවිධිමත් ආර්ථික ක්‍රියාවලීන් හඳුනා ගැනීම සඳහා දත්ත විශ්ලේෂණ යොදාගැනීම තුළින් බදුකරණ නීති සහ පද්ධතිවල ක්‍රියාකාරීත්වය බලාත්මක කළ හැකි වන අතර එමගින් බදු අනුකූලතාව පවත්වාගැනීම සහ අවිධිමත් අංශය ක්‍රමානුකූලව විධිමත් අංශයට ඇතුළත් කර ගැනීම සිදු කළ හැකි වනු ඇත.

3.3.1.2 **ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිත අනුපාතයට පහළ බදු ආදායම් දායකත්වය**

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිත අනුපාතයට සාපේක්ෂව බදු ආදායමෙහි අනුපාතය 9.84%ක් වන අතර මෙය අපේක්ෂිත බදු ආදායම් අනුපාතය වන 15%ක ප්‍රතිශතය සමග සැසඳූ විට ඉතා පහළ මට්ටමකි. ඉදිරි වසර කීපය තුළ දී එම අපේක්ෂිත බදු ආදායම් මට්ටම අත්පත් කර ගැනීමට නම් බදු එකතු කිරීම වැඩි දියුණු කිරීම, බදු පදනම පුළුල් කිරීම සහ බදු අනුකූලතාව ඉහළ නංවාලීම සඳහා විස්තීරණ හා උපායමාර්ගික බදු සංශෝධන සිදු කළ යුතුය. මෙම ඉලක්ක අත්පත් කර ගැනීමට නම් ප්‍රතිපත්තිමය සහ පරිපාලනමය යන දෙඅංශය තුළින්ම නිසි පියවර අනුගමනය කිරීම කළ යුතුය. ප්‍රතිපත්තිමය අංශය ලෙස, ඉහළ ආදායම් උපයනු ලබන කණ්ඩායම් විසින් ඔවුන්ගේ ආදායමෙන් සාධාරණ කොටසක් බදු වශයෙන් ගෙවනු ලබන බව සහතික කිරීම සඳහා ප්‍රගතිශීලී බදු ක්‍රමවේද සවිබල ගැන්වීම සහ දැනට ක්‍රියාත්මක බදු නිදහස් කිරීම් හා බදු දිරිගැන්වීම් විසින් බදු පදනමට හානියක් සිදු නොකරමින් ආර්ථික සංවර්ධනය ඉලක්ක කර ගනු ලබන බව සහතික කිරීම සඳහා එම බදු

සහන සහ දිරිගැන්වීම් සමාලෝචනය කිරීම සහ තාර්කිකකරණය කළ යුතු වන අතර බදු පරිපාලනය යන දෘෂ්ටිකෝණයෙන් සලකා බැලූවිට, බදුකරණය සරල කිරීම සඳහා පියවර ගැනීම, දත්ත විශ්ලේෂණ ක්‍රම මගින් අනුකූල නොවන බදු ගෙවන්නන් හඳුනා ගැනීම සඳහා තාක්ෂණය යොදා ගැනීම සහ බදු පැහැර හැරීම වළක්වාලීම සඳහා ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම ඉහළ නැංවීම, බදු ගොනු සැකසීමේ ක්‍රියා පටිපාටි සරල කිරීම සහ වඩා හොඳ සහායක් සැලසීම, ස්වේච්ඡා බදු අනුකූලතාව වර්ධනය කර ගැනීම සඳහා බදු ගෙවන්නන් දැනුම්වත් කිරීමට දිරිගැන්වීම, කාර්යක්ෂමතාව ඉහළ නංවා ගැනීම සහ දූෂණය අවම කර ගැනීම සඳහා දත්ත එක්රැස් කළ වහාම ඒ පිළිබඳ ඉදිරි කටයුතු කිරීම ඇතුළුව බදු පරිපාලන කටයුතු සඳහා ඩිජිටල් යටිතල පහසුකම් යොදාගැනීම සඳහා ආයෝජනය කිරීම සහ බදු නීති සඵලදායක ලෙස කළමනාකරණය කර ගැනීම සහ බලාත්මක කිරීම සඳහා බදු නිලධාරීන්ට පුහුණුව ලබාදීම සහ අවශ්‍ය මෙවලම් සහ සම්පත් ලබා දීම ආදිය කාලීනව සිදු කළ යුතු ක්‍රියාමාර්ග ලෙස දැක්විය හැකිය.

### 3.3.1.3 සෘජු බදු අනුපාතයට වක්‍ර බදු අනුපාතය

2023 වර්ෂයේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සෘජු බදු අනුපාතයට වක්‍ර බදු අනුපාතය 50.1% ට 49.9%ක් විය. මෙය ඉහත බදු දෙවර්ගයම පිළිබඳ සාධනීය තත්ත්වයකි. ඉදිරි වසර කිහිපය තුළ මෙම අනුපාතය 60:40 දක්වා විතැන් කරවීම සඳහා, ස්ථාවර සහ කාර්යක්ෂම වක්‍ර බදු පද්ධතියක් පවත්වාගෙන යන අතරතුර, සෘජු බදු ආදායම වර්ධනය කෙරෙහි ප්‍රතිපත්ති මගින් අවධානය යොමු විය යුතුය. මේ කාර්යය සඳහා බදු ප්‍රතිපත්ති සකස් කිරීමේදී පහත කරුණු කේන්ද්‍ර කරගත් බදු ප්‍රතිපත්ති වෙත අවධානය යොමු කළ යුතු වේ.

- **ප්‍රගතිශීලී බදුකරණය වැඩිදියුණු කිරීම:** ඉහළ ආදායම් උපයන්නන් සඳහා ඉහළ බදු පරාසයක් හඳුන්වාදීම තුළින් ආදායම් බදුවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ ධනවත් පිරිස් විසින් තම ආදායමෙන් සාධාරණ කොටසක් බදු වශයෙන් ගෙවනු ලබන බව සහතික කර ගැනීම
- **පුද්ගලික ආදායම් බදු පදනම පුළුල් කිරීම:** බදු නිදහස් කිරීම් සහ අඩු කිරීම් අවම කිරීම සහ ඉහළ ආදායම් ලබන පුද්ගලයන් සහ වෘත්තිකයන් හඳුනාගැනීම සහ ඔවුන්ට බදු නියම කිරීම ඉහළ නංවා ගැනීම
- **සංස්ථාපිත බදු ප්‍රතිසංස්කරණ:** සංස්ථාපිත බදු ප්‍රතිශත තරගකාරී වන බවත්, එමෙන්ම ප්‍රමාණවත් ආදායමක් උත්පාදනය කිරීම සඳහා සෑහෙන බවත් සහතික විය යුතුය. බහු ජාතික සමාගම් විසින් බදු මගහැරීම වළක්වාලීම සහ ලාභය විතැන්වීමට හේතුවන හිඩැස් වසා දැමීම සිදු කළ යුතුය.
- **ප්‍රාග්ධන ලාභ සහ ධන බදු:** ප්‍රාග්ධන ලාභ, ලාභාංශ සහ ධනය මත බදු පැනවීම සහ බදු ඉහළ නැංවීම සිදු කොට සෘජු බදු ආදායම වැඩි කළ යුතුය.
- **කාර්යක්ෂම එකතු කළ අගය මත බදු ක්‍රමයක්:** එකතු කළ අගය මත බදු පද්ධතිය කාර්යක්ෂමව, පුළුල් පදනමක් සහිතව සහ බදු නිදහස් කිරීම් අවම කර ගනිමින් පවත්වාගෙන යනු ලබන බව සහතික කළ යුතුය. අඩු ආදායම්ලාභී කුටුම්බ මත අසමානුපාතික බදු බරක් පැටවීම වළක්වාලීම සඳහා එකතු කළ අගය මත බදු අනුපාත දැඩි ලෙස ඉහළ යෑම වළක්වා ගත යුතුය.
- **නිරන්තරව ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම:** බදු ප්‍රතිපත්තිවල සඵලදායීබව නිරන්තරයෙන් අධීක්ෂණය කර ආර්ථික තත්ත්වයන් සහ ආදායම් කාර්යසාධනය පාදක කර ගනිමින් එම ප්‍රතිපත්ති අවශ්‍ය පරිදි හැඩගස්වා ගත යුතුය.

මෙම ප්‍රතිපත්ති දිශානති අනුගමනය කිරීම මගින්, තිරසාර සහ සාධාරණ ආර්ථික වර්ධනයක් පවත්වා ගනිමින් සමස්ත බදු ආදායම තුළ සෘජු බදුවල ප්‍රමාණය ක්‍රමානුකූලව ඉහළ නංවා ගැනීමට ද ඉදිරි වර්ෂ කිහිපය තුළදී අපේක්ෂිත 60:40 අනුපාතය ළඟාකර ගැනීමට ද රජයට හැකියාව ලැබෙනු ඇත.

### 3.3.2 අනාගත ඉලක්ක

පොදුවේ ගත්කළ ලොව පුරා සියලුම බදු පරිපාලකයන් විසින් තම සඵලදායීබව, කාර්යක්ෂම බව සහ පාරිසරික වශයෙන් තිරසාර බව වර්ධනය කර ගැනීම සඳහා විවිධ උපක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් සිටී. බදු පදනම, බදු අනුකූලතාව වර්ධනය කිරීම, දළ දේශීය නිෂ්පාදිතයට බදු ආදායමේ අපේක්ෂිත මට්ටම අත්කර ගැනීම සඳහා බදු ආදායම ඉහළ නංවා ගැනීම සහ කඩදාසි රහිත පරිපාලනය සඳහා දිරි දීම පිණිස විද්‍යුත් සේවාවක් උපරිමකරණය ආදිය මීට ඇතුළත් වේ. ඒ අනුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ද ඒ සම්බන්ධයෙන් ඉලක්ක කිහිපයක් සකස් කොට ඇත.

#### 3.3.2.1 බදු පදනම ඉහළ නංවාලීම

බදු බර සමස්ත සමාජය පුරා පුළුල්ව හා සාධාරණ ලෙස බෙදා හැරීම සඳහා බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව වැඩි කර ගැනීම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අනාගත බලාපොරොත්තු අතුරින් ප්‍රමුඛ එකකි.

මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන කරුණු ද ඇතුළත්ව සුදුසු පියවර ගත යුතුය.

- **දත්ත විශ්ලේෂණ භාවිත කිරීම:** දැනට බදු දැලෙන් පිටත සිටින බදු ගෙවිය යුතු පුද්ගලයන් හඳුනා ගැනීම සඳහා දත්ත විශ්ලේෂණය
- **මහජන දැනුම්වත්කිරීමේ වැඩසටහන:** තම බදු බැඳියාව සහ බදු ගෙවීමට අනුගත වීම තුළින් ලැබිය හැකි ප්‍රතිලාභ පිළිබඳව පුරවැසියන් දැනුම්වත් කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම
- **බදුකරණ ක්‍රියාවලිය සරල කිරීම:** පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට තම බදු ගොනු ලියාපදිංචිය පහසු කිරීම සඳහා බදු ගොනු කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම
- **විධිමත්කරණය සඳහා දිරිගැන්වීම් ලබාදීම:** අවිධිමත් අංශයෙහි ව්‍යාපාරවල මෙහෙයුම් විධිමත් කිරීම වෙනුවෙන් අභිප්‍රේරණ (දිරිගැන්වීම්) ලබා දීම සහ සීමිත කාල සීමා සඳහා බදු ප්‍රතිශත අඩුකිරීම් සහ බදු විරාම ලබා දීම

#### 3.3.2.2 බදු අනුකූලතා මට්ටම ඉහළ නංවා ගැනීම

වර්තමාන බදු ගෙවන්නන් බදු නීතිවලට අනුකූලව කටයුතු කරනු ලබන බව සහ ඔවුන් අදාළ බදු නිවැරදිව සහ නිසිකලට ගෙවනු ලබන බව තහවුරු කර ගැනීම ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි අනාගත ප්‍රමුඛ ඉලක්කවලින් එකකි.

- **ක්‍රියාත්මක කිරීමේ/බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම:** අනුකූල නොවීම් සඳහා දැඩි දඩුවම් ක්‍රියාත්මක කිරීම සහ විගණන විමර්ශන පැවැත්වීමේ ධාරිතාවය වර්ධනය කිරීම
- **බදු ගෙවන්නන් සඳහා සේවාවන්:** අනුකූලතාව ඉහළ නංවාගැනීම සඳහා සහාය වීම සඳහා පැහැදිලි මගපෙන්වීම්, උපකාර සේවාවන් සහ සේවාදායකයන් සඳහා ප්‍රතිචාර දක්වන පාරිභෝගික සේවා
- **අනෙකුත් ආයතන සමග සහයෝගීත්වය:** දත්ත පිළිබඳව අවශ්‍ය තොරතුරු තහවුරු කර ගැනීම සඳහා සහ අසමානතාවන් නිරීක්ෂණය කිරීම සඳහා වෙනත් මූල්‍ය ආයතන සමග සමීපව කටයුතු කිරීම

#### 3.3.2.3 දළ දේශීය නිෂ්පාදිතයට බදු ආදායම දරණ අනුපාතය අපේක්ෂිත මට්ටමට ළඟා කර ගැනීම

රජයෙහි සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි ප්‍රමුඛ ඉලක්කයක් වන්නේ රාජ්‍ය සේවාවන් සහ යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි පවත්වාගෙන යාම සඳහා මූල්‍ය පහසුකම් පවත්වාගැනීම පිණිස, දළ දේශීය නිෂ්පාදිතයට බදු ආදායම දරණ අනුපාතය අපේක්ෂිත මට්ටමට ළඟා කර ගැනීම සඳහා බදු ආදායම් ඉහළ නංවා ගැනීමයි. ඒ සඳහා බදු පදනම සහ අනුකූලතා මට්ටම පුළුල් කිරීම සිදු කළ යුතුය.

මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා, පහත උපාය මාර්ග අනුගමනය කළ යුතුවේ.

- **ප්‍රගතිශීලී බදු ප්‍රතිපත්ති:** ගෙවීම සඳහා ඉහළ හැකියාවක් ඇති පුද්ගලයන්ගෙන් බදු සඳහා දායකත්වයක් ලැබෙන බව සහතික කිරීම සඳහා ප්‍රගතිශීලී බදු ප්‍රතිපත්ති අනුගමනය කිරීම
- **ආර්ථික වර්ධන මූලාරම්භයන්:** ක්‍රමානුකූලව බදු ආදායම් ඉහළ නංවාගැනීම තුළින් ආදායමෙහි

සහ පරිභෝජනයෙහි වර්ධනයට හේතුවන ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට රජයට හැකියාව ලැබේ. අවසානයේ එමගින් බදු පදනම පුළුල් කිරීමට ද හැකියාව ලැබේ. මෙකී ආර්ථික ක්‍රියාකාරකම් ව්‍යාප්තියෙහි චක්‍රීය බලපෑම අවසානයේදී ආර්ථික සංවර්ධනය ඇතිකිරීමටත්, බදු ආදායම ඉහළ නංවාලීමටත් හේතු වේ.

- **කාර්යක්ෂම බදු පරිපාලනය :** සම්පත් වඩා හොඳින් කළමනාකරණය කරගැනීමත් තාක්ෂණික භාවිතය ඉහළ නංවා ගැනීමත් තුළින් පරිපාලන වියදම් අවම කරගනිමින් බදු එකතු කිරීමෙහි කාර්යක්ෂමතාව ඉහළ නංවා ගත හැකිය.

**3.3.2.4 කඩදාසි රහිත බදු පරිපාලනයක් සඳහා විද්‍යුත් සේවාවන් උපරිම කිරීම**

කාර්යක්ෂමතාව වැඩිදියුණු කරගනිමින්, පිරිවැය අඩුකරමින්, පාරිසරික තිරසාරත්වය අත්පත් කර ගැනීම උදෙසා පූර්ණ ඩිජිටල්කරණයකට ලක් කරනු ලැබූ බදු පරිපාලනයකට පිවිසීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දිගුකාලීන ඉලක්කයකි.

අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වනු ඇත.

- **ඩිජිටල් පහසුකම්:** බදුකරණයට අදාල සියලුම සේවාවන් සඳහා ඩිජිටල් පහසුකම් සකස් කිරීම සහ නඩත්තු කිරීම
- **ජංගම යෙදුම්:** පුද්ගලයන්ට තම අනෙකුත් කාර්යයන් අතරවාරයේදීම බදු සේවාවන්ට ප්‍රවේශවීම සඳහා ජංගම යෙදුම් නිර්මාණය කිරීම
- **ස්වයංක්‍රීයකරණය කරනු ලැබූ ක්‍රියාවලීන්:** කාර්යයන් සඳහා මානව මැදිහත්වීම් සහ දෝෂ ඇතිවීම් වළක්වාලීම සඳහා පුනර්වර්තී කාර්යයන් ස්වයංක්‍රීයකරණය කිරීම
- **සයිබර් ආරක්ෂණ පියවර:** බදු ගෙවන්නන්ගේ දත්ත ආරක්ෂා කර ගැනිම සහ ඩිජිටල් ගනුදෙනු සියල්ල ඒකාබද්ධ කර ගැනීම සඳහා ශක්තිමත් සයිබර් ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීම
- **ප්‍රවර්ධනය සහ පුහුණුව:** විද්‍යුත් සේවාවන් ප්‍රවර්ධනය සඳහා වැඩමුළු පැවැත්වීම සහ විද්‍යුත් සේවාවන් භාවිත කිරීමේදී බදු ගෙවන්නන් අපහසුතාවට පත් නොවන බව සහතික කර ගැනීම සහ ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබා දීම

මෙම අනාගත ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ, තාක්ෂණික අභිවෘද්ධිය, මහජන සහභාගීත්වය සහ ස්ථිරසාර ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද ආදියෙන් සමන්විත බහුවිධ ප්‍රවේශයක් අවශ්‍ය වන අතර, ඉහත කී අංශ කෙරෙහි අවධානය යොමු කරනු ලැබූ උපායමාර්ගික ක්‍රියාවලියක් තුළින් වඩා කාර්යක්ෂම ඉහළ අනුකූලතාවක් සහිත බදුකරණයක් ස්ථාපිත කරගැනීමටත්, අවසාන වශයෙන් ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනය සඳහා දායක වනු ලබන සවිමත් සහ නවීනතම බදු පරිපාලනයක් ක්‍රියාත්මක කිරීමටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හැකිවනු ඇත.

# 04

පරිච්ඡේදය

# අනුකූලතාව සහ බලාත්මක කිරීම



## 4.1 හැඳින්වීම

බදු අනුකූලතාව සහ බලාත්මක කිරීම මනා ක්‍රියාකාරීත්වයෙන් යුතු බදු ක්‍රමයක ප්‍රධාන සංරචක වේ. ආදායම් රැස්කිරීම් උපරිම කිරීම, සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සහ බදු ක්‍රමය තුළ නීතියේ ආධිපත්‍යය තහවුරු කරමින් මහජන විශ්වාසය පවත්වාගෙනයාම සඳහා ඵලදායී බදු අනුකූලතා සහ බලාත්මක කිරීමේ උපාය මාර්ග අත්‍යවශ්‍ය වේ.

බදු ගෙවන්නන් ස්වේච්ඡාවෙන් බදු නීති සහ රෙගුලාසිවලට අනුගත වීම බදු අනුකූලතාව වේ. බදු ගෙවීමට යටත් නම් බදු පරිපාලනය තුළ ලියාපදිංචි වීම, බදු වාර්තා නියමිත කාලයේදී ගොනු කිරීම, ආදායම් නිවැරදිව වාර්තා කිරීම සහ ගෙවිය යුතු බදු නිවැරදිව ගණනය කිරීම සහ බදු බැදියාවන් පවතී නම් නියමිත වේලාවට ගෙවීම මීට අදාළ වේ. බදු නීතිවල සංකීර්ණභාවය, බදුගෙවන්නන්ගේ දැනුම්වත්භාවය සහ අධ්‍යාපනය, බදු ක්‍රමයේ සාධාරණත්වය වටහා ගැනීම සහ අනනුකූලතාව හඳුනාගැනීමේ හැකියාව සහ අනනුකූලතාව වළකන ප්‍රතිකර්ම යෙදීම ආදී සාධක මගින් අනුකූලතාව බලපෑමට ලක්වේ.

බදු නීති සමග පවතින අනුකූලතාව තහවුරු කිරීමට බදු පරිපාලනය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග බදු බලාත්මක කිරීම හා සම්බන්ධ වේ. බදු වාර්තා ගොනු නොකරන්නන් හඳුනාගැනීම, බදු විගණන, විමර්ශන, දණ්ඩන සහ නෛතික ක්‍රියාමාර්ග හඳුනා ගැනීම මගින් අනනුකූලතාව හඳුනාගැනීම සහ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම මීට ඇතුළත් වේ. ඵලදායී බලාත්මක කිරීමේ යාන්ත්‍රණය මගින් බදු ගෙවීම පැහැර හැරීම් සහ වංචාවන් වළක්වන අතර එමගින් බදු ක්‍රමයෙහි ඒකීයභාවය ආරක්ෂා කිරීමට මෙන්ම සියලුදෙනා ස්වකීය සාධාරණ බදු කොටස ගෙවන්නේ ද යන්න තහවුරු කර ගැනිමට හැකිවේ. බදු අනුකූලතාව සහ බලගැන්වීම අතර සම්බන්ධතාව ගතික මෙන් ම ස්වාධීන වේ. බලගැන්වීමේ ප්‍රබල ක්‍රියාමාර්ග තුළින් අනනුකූලතාව වැළැක්විය හැකි අතර ඉහළ මට්ටම්වල ස්වේච්ඡා අනුකූලතාව මගින් විස්තීර්ණ බලගැන්වීම් ප්‍රයත්න අඩු කළ හැකිය. ප්‍රශස්ත ප්‍රතිඵල අත් කර ගැනීම සඳහා අධ්‍යාපනය සහ බලාත්මක කිරීම අවධාරණය කරන සමබර ප්‍රවේශයක් අවශ්‍ය වේ.
වඩාත් හොඳ බදු අනුකූලතාවක් සහතික කිරීම සඳහා පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය ලබාගතහැකි ක්‍රමයක් අවශ්‍ය වේ. වෙනත් ආකාරයෙන් දක්වන්නේ නම් බදු ප්‍රතිපත්ති සංවර්ධනයේ දී මෙන් ම ක්‍රියාත්මක කිරීමේදී බදු ගෙවන්නන්, වාණිජ මණ්ඩල සහ වෙළඳ සංගම්, වෘත්තීය සංගම් සහ වෙනත් පාර්ශ්වකරුවන් සම්බන්ධ වීමෙන් විරෝධතා සහ අනනුකූලතාව වෙනුවට වඩාත් හොඳ බදු අනුකූලතාවක් තහවුරු කිරීමට හැකිවනු ඇත.

ඉහළ මට්ටමෙන් බදු අනුකූලතාවක් ලබා ගැනීම සඳහා විවිධ ප්‍රවේශයන් අවශ්‍ය වේ. එබැවින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු අනුකූලතාව හා බලාත්මක කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදී බදු ගෙවන්නන් වෙත පැහැදිලි මගපෙන්වීමක් සහ සහයෝගයක් සැපයීම, බදු කාර්ය පටිපාටි ලිහිල් කිරීම සහ ස්වේච්ඡා අනුකූලතා සංස්කෘතියක් පෝෂණය කිරීම කළ යුතුවේ. ඊට අමතරව නවීන තාක්ෂණය වැඩි වශයෙන් භාවිත කිරීම, අනුකූල නොවන ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ ඒ සඳහා වැඩිදියුණු කළ ජාත්‍යන්තර සහයෝගීතාව සහ වඩාත් නවීන අවදානම් තක්සේරු ආකෘති හඳුනාගැනීම සහ අවධානය යොමු කිරීම සඳහා නවීන තාක්ෂණය සහ දත්ත විශ්ලේෂක වැඩි වශයෙන් භාවිත කිරීමට අපේක්ෂා කෙරේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මේ වන විට අවදානම් තක්සේරු කිරීම මත පදනම්ව විගණන සිදු කිරීමට කටයුතු කරමින් අනුකූල නොවන අවස්ථා වැඩි අංශ කෙරෙහි අවධානය යොමු කිරීමට කටයුතු සිදු කරයි. මෙම වැඩිදියුණුකිරීම් තුළින් අනුකූලතාව සහ බදු නීති බලාත්මක කිරීමට කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

මෙම පරිච්ඡේදය මගින් බදු අනුකූලතාව සහ බලාත්මක කිරීම හා සම්බන්ධයෙන් 2023 වර්ෂයේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් ලබා දේ.

## 4.2 බදු ගෙවන්නන්, බදු සම්බන්ධ වෘත්තිකයන් සහ මහජනතාව සඳහා පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන්

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේ දී බදු ගෙවන්නන්, බදු පිළිබඳ වෘත්තිකයන් සහ සාමාන්‍ය ජනතාව සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන්වලදී ප්‍රධාන වශයෙන් බදු නීතිය වෙනස් කිරීම සහ ඉලෙක්ට්‍රොනික සේවාව මගින් බදු වාර්තා ගොනු කිරීම පිළිබඳව අවධානය යොමු කරන ලදී. මෙම වැඩසටහන් මාර්ගගතව මෙන් ම භෞතික වශයෙන් පවත්වන ලදී. වැඩසටහන්වල පටිගතකිරීම් සමාජ මාධ්‍ය ඔස්සේ බෙදාහරින ලදී.

සමාජ මාධ්‍ය සහ නිල වෙබ් අඩවිය ඔස්සේ පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන්වලට අදාළ විෂය ක්ෂේත්‍ර පහත සඳහන් පරිදි වේ.

1. අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද සඳහා නව බදු සංශෝධන (සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය)
2. රඳවා ගැනීමේ බද්ද සඳහා නව බදු සංශෝධන (සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය)
3. සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය)
4. එකතු කළ අගය මත බදු වාර්තා සහ උපලේඛන ගොනු කිරීම
5. 2022/23 තක්සේරු වර්ෂය සඳහා රඳවා ගැනීමේ බදු වාර්තා ගොනු කිරීම (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය)
6. 2022/23 තක්සේරු වර්ෂය සඳහා අත්තිකාරම් පුද්ගල ආදායම් බදු වාර්තා ගොනු කිරීම (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය)
7. 2023/24 තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත බදු වාර්තා ප්‍රකාශනය (සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය)
8. මාර්ගගත ගෙවීම්
9. 2022/23 තක්සේරු වර්ෂය සඳහා තනි පුද්ගල ආදායම් බදු වාර්තා ගොනු කිරීම (සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය)
10. 2022/23 තක්සේරු වර්ෂය සඳහා හවුල් ආදායම් බදු වාර්තා ගොනු කිරීම (සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය)
11. ඉලෙක්ට්‍රොනික ගොනුකිරීම - 2022/23 තක්සේරු වර්ෂය සඳහා තනි පුද්ගල ආදායම් බදු වාර්තා ගොනු කිරීම

බදු ගෙවන්නන්, විගණන ආයතන, බදු උපදේශකයන්, සේවායෝජකයන් සහ සේවාදායකයන්, රජයේ ගණකාධිකාරීවරුන් සහ මෙම විෂය සම්බන්ධයෙන් රුචිකත්වයක් දක්වන පාර්ශ්වකරුවන් ඉහත දැනුම්වත්කිරීමේ වැඩසටහන්වල ඉලක්කගත කණ්ඩායම විය.

රාජ්‍ය වියදම් සීමා කිරීමේ රෙගුලාසි යටතේ සීමිත සම්පත් භාවිත කරමින් සාමාන්‍ය ජනතාව දැනුම්වත් කිරීමේ අරමුණින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් වසර තුළ පුද්ගලයින් 55,926 දෙනෙකු දැනුම්වත් කරන ලදී. 2023 වර්ෂයේ පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර ඇමුණුම 07 හි දක්වා ඇති අතර දැනුම්වත් කිරීමේ වැඩසටහන්වල සාරාංශය 4.1 වගුවේ දක්වා ඇත.

**4.1 වගුව : දැනුම්වත් කිරීමේ වැඩසටහන්වල සාරාංශය**

| වැඩසටහන් සංඛ්‍යාව | සහභාගීවූවන් සංඛ්‍යාව |
|---|---|
| 73 | 55,926 |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

## 4.3 වාර්තා ගොනුකිරීමේ අනුකූලතාව

2023 වර්ෂය තුළ 2022/23 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වාර්තා ගොනු කිරීම, මාසික සහ කාර්තුමය වශයෙන් එකතු කළ අගය මත බදු වාර්තා, 2022/23 තක්සේරු වර්ෂය සඳහා වාර්ෂික අත්තිකාරම් පුද්ගල ආදායම් බදු වාර්තා, 2022/23 තක්සේරු වර්ෂය සඳහා වාර්ෂික අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ප්‍රකාශය ආදිය අදාළ නීතිවල නිශ්චිතව දක්වා ඇති නියමිත දිනට භාරදිය යුතු විය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් ගණනාවක් සංවිධානය කරන ලද අතර ඒ තුළින් බදු වාර්තා ගොනු කිරීමේ අනුකූලතාව සැලකිය යුතු මට්ටමක පැවති බව නිරීක්ෂණය වේ. එක් එක් බදු වර්ග සඳහා වාර්තා ගොනු කිරීමේ අනුකූලතා වෙන වෙනම පහත දක්වා ඇත.

### 4.3.1 2022/23 වර්ෂය සඳහා සංස්ථාපිත බදු වාර්තා ගොනු කිරීම

සංස්ථාපිත ආදායම් බදු වාර්තා නියමිත දිනට සහ නියමිත දිනට මාසයකට පසු ගොනුකිරීමේ අනුකූලතාව 2022/23 තක්සේරු වර්ෂය සඳහා නීතිරීති වෙනස් වීම සහ බදු අනුප්‍රමාණ දෙයාකාරයකින් යෙදීම හේතුවෙන් තරමක් සංකීර්ණ විය. සංස්ථාපිත අංශයට පළමු මාස නවය සහ අවසාන මාස තුන සඳහා ස්වකීය ලාභය වෙන වෙනම ගණනය කර ආදායම් බදු වාර්තාවට අදාළ උපලේඛනයේ ප්‍රකාශකළ යුතුවිය. සංස්ථාපිත බදු ගෙවන්නන් සඳහා මෙම තක්සේරු වර්ෂයේ දී ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම අනිවාර්ය වූ බැවින් ඔවුන්ට කාලපරිච්ඡේද දෙකක් සඳහා වෙන වෙනම ලාභ ගණනය කිරීමට අවශ්‍ය වුවද, දී ඇති නීතිරීති යටතේ මුළු වසර සඳහාම ගෙවිය යුතු බදු ගණනය කිරීමට RAMIS පද්ධතිය පහසුකම් සලසා ඇත.

වර්ෂය තුළ නියමිත දිනට සංස්ථාපිත ආදායම් බදු වාර්තා ගොනු කිරීමේ ප්‍රතිශතය 23%ක් වූ අතර නියමිත දින සිට මාසයක් ඇතුළත එය සියලුම සංස්ථාපිත බදු ගෙවන්නන් සඳහා 34%ක් විය. සමස්ත ආදායම් බදු ආදායමෙන් විශාල කොටසකට දායක වන විශාල බදු ගෙවන්නන් සම්බන්ධයෙන් සලකා බැලීමේදී නියමිත දිනට 60%ක් සහ නියමිත දින සිට මාසයක් ඇතුළත 94%ක් විය. අනෙකුත් සංස්ථාපිත බදු ගෙවන්නන්ගේ එම ප්‍රමාණය නියමිත දිනට 22%ක් වූ අතර නියමිත දින සිට මාසයක් ඇතුළත 33%ක් විය.

පෙර වසරේ සංස්ථාපිත බදු වාර්තා ගොනු කිරීම නියමිත දිනට 32%ක් සහ නියමිත දිනට මාසයකට පසු 34%ක් විය. මෙම වසරේ සංස්ථාපිත බදු වාර්තා ගොනු කිරීම පසුගිය වසරේ ප්‍රතිශතය සමග සසඳන විට ආසන්න වශයෙන් 9%කින් පහත වැටීමක් පෙන්නුම් කරයි. 2022/23 තක්සේරු වර්ෂය සඳහා දෙයාකාරයක බදු අනුප්‍රමාණ සහ රෙගුලාසි යෙදීමෙන් ඇති වූ සංකීර්ණත්වයේ බලපෑම මෙයට හේතු වන්නට ඇත. කෙසේ වෙතත් ආදායම් බදු ආදායමෙන් වැඩි කොටසකට දායකත්වය සපයන විශාල බදු ගෙවන්නන්ගේ බදු වාර්තා ගොනු කිරීමේ ප්‍රතිශතය සතුටුදායක මට්ටමක පැවතුණි.

4.2 වගුව මගින් 2023 වර්ෂයේ දී නියමිත දිනට ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව සහ අනුකූලතා ප්‍රතිශතයත්, නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කරන ලද සංස්ථාපිත ආදායම් බදු වාර්තා සංඛ්‍යාව සහ අනුකූලතා ප්‍රතිශතයත් පෙන්නුම් කරයි.

**4.2 වගුව : 2022/23 වර්ෂය සඳහා සංස්ථාපිත ආදායම් බදු වාර්තා ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම**

| බදු වර්ගය | නියමිත කාලයේදී ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | ගොනු කිරීමට අපේක්ෂිත බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දිනට අනුකූලතාව % ලෙස | නියමිත දින සිට මසක් ඇතුළත අනුකූලතාව % ලෙස |
|---|---|---|---|---|---|
| ඉහළ සංස්ථාපිත බදු ගෙවන්නන් | 375 | 583 | 620 | 60% | 94% |
| වෙනත් සංස්ථාපිත බදු ගෙවන්නන් | 17,054 | 25,493 | 76,227 | 22% | 33% |
| මුළු සංඛ්‍යාව | 17,429 | 26,076 | 76,847 | 23% | 34% |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

#### 4.3.2 2022/23 වර්ෂය සඳහා තනි පුද්ගල ආදායම් බදු සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා ගොනු කිරීම

තනි පුද්ගල ආදායම් බදු සඳහා ද 2022/23 තක්සේරු වර්ෂයේ පළමු මාස නවය සඳහා සහ අවසන් මාස තුන සඳහා ආදායම්, ලාභ, බදු බැර සහ අනෙකුත් දීමනා වෙන වෙනම ප්‍රකාශ කිරීමට සිදු වූ බව සඳහන් කළ යුතුය. එසේම මාස නවයක් සහ මාස තුනක් සඳහා අදාළ වන බදු අනුප්‍රමාණ දෙකක් සහ විවිධ ප්‍රමාණානුකූල බදු නිදහස් දීමනා දෙකක් ද විය. ඒ අනුව තනි පුද්ගල ආදායම් බදු ගෙවන්නන් විසින් පළමු මාස නවය සහ අවසාන මාස තුන සඳහා ඔවුන්ගේ ලාභය වෙන වෙනම ගණනය කර ආදායම් බදු වාර්තාවේ උපලේඛනයේ අදාළ කොටුවල ප්‍රකාශ කිරීම අවශ්‍ය විය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙම සංකීර්ණත්වය විසඳීම සඳහා ආදායම් බදු වාර්තාවට වෙනම උපලේඛනයක් සපයා ඇති අතර RAMIS විසින් ලබා දී ඇති රීති යටතේ මුළු වසර සඳහාම ගෙවිය යුතු බදු ගණනය කිරීමේදී ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් බදු වාර්තා ගොනුකරනු ලබන බදු ගෙවන්නන් වෙත එම පහසුකම් සලසා ඇත.

අදාල වර්ෂය තුළ නියමිත දිනට තනි පුද්ගල ආදායම් බදු වාර්තා ගොනු කිරීමේ ප්‍රතිශතය 25%ක් වූ අතර නියමිත දින සිට මාසයක් ඇතුළත එම ප්‍රමාණය 37% ක් විය. පෙර වර්ෂයේ දී එනම් 2021/22 තක්සේරු වර්ෂයේ දී අදාළ ගොනු කිරීමේ ප්‍රතිශත පිළිවෙළින් 33%ක් සහ 38%ක් විය. තනි පුද්ගල බදු වාර්තා ගොනු කිරීමේ ප්‍රතිශතයන්හි මෙම අඩුවීම කෙරෙහි බදු අනුප්‍රමාණ, බදු ගෙවීමේ මට්ටම්, බදු බැර සහ සීමාවන් භාවිත කිරීමට සිදුවීම හේතු විය හැකිය. නමුත් හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා ගොනු කිරීම කෙරෙහි නෛතික වෙනස්වීම් බල නොපා ඇති බැවින් වඩා හොඳ තත්ත්වයක් පෙන්නුම් කරයි. වර්ෂය තුළදී නියමිත දිනට හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා ගොනු කිරීමේ ප්‍රතිශතය 27%ක් වූ අතර නියමිත දින සිට මාසයක් ඇතුළත එය 37% දක්වා ඉහළ ගොස් ඇත.

4.3 වගුව මගින් 2022/23 තක්සේරු වර්ෂය සඳහා නියමිත දිනට සහ නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කරන ලද තනි පුද්ගල ආදායම් බදු සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා සංඛ්‍යාව සහ අනුකූලතා ප්‍රතිශත පෙන්නුම් කරයි.

**4.3 වගුව : 2022/23 වර්ෂයේ දී තනි පුද්ගල ආදායම් බදු සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා ගොනු කිරීම**

| බදු වර්ගය | නියමිත කාලයේදී ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | ගොනු කිරීමට අපේක්ෂිත බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දිනට අනුකූලතාව % ලෙස | නියමිත දින සිට මසක් ඇතුළත අනුකූලතාව % ලෙස |
|---|---|---|---|---|---|
| තනි පුද්ගල ආදායම් බදු - ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම් | 23,709 | 30,303 | 222,761 | 11% | 14% |
| තනි පුද්ගල ආදායම් බදු - පැමිණ ගොනු කිරීම් | 32,001 | 51,734 | 222,760 | 14% | 23% |
| තනි පුද්ගල ආදායම් බදු - සමස්ත ගොනු කිරීම් | 55,710 | 82,037 | 222,761 | 25% | 37% |
| හවුල් ව්‍යාපාර ආදායම් බදු - ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම් | 1,576 | 1,964 | 14,165 | 11% | 14% |
| හවුල් ව්‍යාපාර ආදායම් බදු - පැමිණ ගොනු කිරීම් | 2,313 | 3,285 | 14,165 | 16% | 23% |
| හවුල් ව්‍යාපාර ආදායම් බදු - සමස්ත ගොනු කිරීම් | 3,889 | 5,249 | 14,165 | 27% | 37% |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 4.3.3 අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ රඳවා ගැනීමේ බදු /අත්තිකාරම් ආදායම් බදු වාර්තා ගොනු කිරීම

වර්ෂය තුළ නියමිත දිනට ලියාපදිංචි මුළු සේවායෝජකයන් විසින් අත්තිකාරම් පුද්ගල ආදායම් බදු වාර්තා ගොනු කිරීමේ ප්‍රතිශතය 25% ක් වූ අතර විශාල බදු ගෙවන්නන්ගේ කොටසෙහි සේවායෝජකයන් විසින් බදු වාර්තා ගොනු කිරීමේ ප්‍රතිශතය 91%ක් විය. විශාල බදු ගෙවන්නන් නොවන කාණ්ඩයේ සේවායෝජකයන්ගේ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු වාර්තා ගොනු කිරීමේ ප්‍රතිශතය 24% කි. කෙසේ නමුත් පෙර වර්ෂය සමග සසඳන විට සමස්ත අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (එවකට උ.වි.ගෙ. ලෙස හඳුන්වන ලද) බදු වාර්තා ගොනු කිරීමේ ප්‍රතිශතය 11%ක් වන අතර මෙම වර්ෂයේ දී එය සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කර තිබේ.

වර්ෂය තුළ නියමිත දිනට ලියාපදිංචි මුළු බදු ගෙවන්නන් විසින් අත්තිකාරම් ආදායම් බදු (එවකට රඳවා ගැනීමේ බදු ලෙස හඳුන්වන ලද) වාර්තා ගොනු කිරීමේ ප්‍රතිශතය 63%ක් වූ අතර විශාල බදු ගෙවන්නන්ගේ කාණ්ඩයෙහි අත්තිකාරම් ආදායම් බදු නියෝජිතයන් ලෙස ලියාපදිංචි වී ඇති බදු ගෙවන්නන් 86%ක් විය. 2023 වර්ෂය තුළදී අත්තිකාරම් ආදායම් බද්ද (රඳවා ගැනීමේ බද්ද) නැවත හඳුන්වා දුන් බැවින් ගොනු කිරීමේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක පවතී.

පහත 4.4 වගුව 2023 වර්ෂයේ දී ගොනු කරන ලද අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ අත්තිකාරම් ආදායම් බදු වාර්තා සංඛ්‍යාව සහ 2023 වර්ෂයේ වාර්තා අනුකූලතා ප්‍රතිශතය නිරූපණය කරයි.

**4.4 වගුව : 2023 වර්ෂයේ දී අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ අත්තිකාරම් ආදායම් බදු වාර්තා ගොනු කිරීම**

| රඳවා ගැනීමේ බදු වර්ගය | නියමිත වේලාවට ගොනු කරන ලද වාර්තා සංඛ්‍යාව | ගොනු කිරීමට අපේක්ෂිත බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දිනට අනුකූලතාව ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|
| අ.පු.ආ.බ. - විශාල බදු ගෙවන්නන් - ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම් | 319 | 604 | 53% |
| අ.පු.ආ.බ. - විශාල බදු ගෙවන්නන් - පැමිණ ගොනු කිරීම් | 231 | 604 | 38% |
| අ.පු.ආ.බ. - විශාල බදු ගෙවන්නන් - සමස්ත ගොනු කිරීම් | 550 | 604 | 91% |
| අ.පු.ආ.බ. - වෙනත් බදු ගෙවන්නන් - ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම් | 3,467 | 34,179 | 10% |
| අ.පු.ආ.බ. - වෙනත් බදු ගෙවන්නන් - පැමිණ ගොනු කිරීම් | 4,625 | 34,179 | 14% |
| අ.පු.ආ.බ. - වෙනත් බදු ගෙවන්නන් - සමස්ත ගොනු කිරීම් | 8,092 | 34,179 | 24% |
| අ.පු.ආ.බ. - සියලුම බදු ගෙවන්නන් - ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම් | 3,786 | 34,783 | 11% |
| අ.පු.ආ.බ.- සියලුම බදු ගෙවන්නන් - පැමිණ ගොනු කිරීම් | 4,856 | 34,783 | 14% |
| අ.පු.ආ.බ.- සියලුම බදු ගෙවන්නන් - සමස්ත ගොනු කිරීම් | 8,642 | 34,783 | 25% |
| අ.ආ.බ. - විශාල බදු ගෙවන්නන් - ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම් | 357 | 530 | 67% |
| අ.ආ.බ. - විශාල බදු ගෙවන්නන් - පැමිණ ගොනු කිරීම් | 101 | 530 | 19% |
| අ.ආ.බ. - විශාල බදු ගෙවන්නන් - සමස්ත ගොනු කිරීම් | 458 | 530 | 86% |
| අ.ආ.බ. - වෙනත් බදු ගෙවන්නන් - ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම් | 1,658 | 4,265 | 39% |
| අ.ආ.බ. - වෙනත් බදු ගෙවන්නන් - පැමිණ ගොනු කිරීම් | 896 | 4,265 | 21% |
| අ.ආ.බ. - වෙනත් බදු ගෙවන්නන් - සමස්ත ගොනු කිරීම් | 2,554 | 4,265 | 60% |
| අ.ආ.බ. - සියලුම බදු ගෙවන්නන් - ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම් | 2,015 | 4,795 | 42% |
| අ.ආ.බ. - සියලුම බදු ගෙවන්නන් - පැමිණ ගොනු කිරීම් | 997 | 4,795 | 21% |
| අ.ආ.බ. - සියලුම බදු ගෙවන්නන් - සමස්ත ගොනු කිරීම් | 3,012 | 4,795 | 63% |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 4.3.4 2023 වර්ෂයේ එකතු කළ අගය මත බදු වාර්තා ගොනුකිරීමේ අනුකූලතාව

4.3.4.1 විශාල බදු ගෙවන්නන් විසින් එකතු කළ අගය මත බදු වාර්තා ගොනුකිරීම

4.5 වගුව මගින් විශාල බදු ගෙවන්නන් සඳහා 2023 වර්ෂයේ දී එකතු කළ අගය මත බදු වාර්තා සම්බන්ධයෙන් නියමිත දිනට සහ නියමිත දින සිට මසක් ඇතුළත බදු අනුකූලතාව පෙන්නුම් කරයි.

**4.5 වගුව : විශාල බදුගෙවන්නන් සඳහා නියමිත කාලයේදී එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කිරීම**

| මාසය | නියමිත කාලයේදී ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | ගොනු කිරීමට අපේක්ෂිත බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දිනට අනුකූලතාව % ලෙස | නියමිත දින සිට මසක් ඇතුළත අනුකූලතාව % ලෙස |
|---|---|---|---|---|---|
| ජනවාරි | 416 | 489 | 532 | 78% | 92% |
| පෙබරවාරි | 151 | 173 | 189 | 80% | 92% |
| මාර්තු | 153 | 177 | 189 | 81% | 94% |
| අප්‍රේල් | 459 | 501 | 544 | 84% | 92% |
| මැයි | 150 | 173 | 189 | 79% | 92% |
| ජූනි | 150 | 167 | 189 | 79% | 88% |
| ජූලි | 460 | 501 | 545 | 84% | 92% |
| අගෝස්තු | 153 | 165 | 188 | 81% | 88% |
| සැප්තැම්බර් | 152 | 163 | 188 | 81% | 87% |
| ඔක්තෝබර් | 474 | 492 | 546 | 87% | 90% |
| නොවැම්බර් | 148 | 157 | 190 | 78% | 83% |
| දෙසැම්බර් | 149 | 154 | 190 | 78% | 81% |
| **එකතුව** | **3,015** | **3,312** | **3,679** | **82%** | **90%** |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කිරීමේ ආකාර දෙකකි. 0% නිමැවුම් බදු අනුප්‍රමාණයට අඩු එකතු කළ අගය මත බදු ලියාපදිංචි පුද්ගලයින් ඔවුන්ගේ බදු වාර්තා මාසිකව ගොනු කරන අතර අනෙක් පුද්ගලයන් කාර්තුමය වශයෙන් ගොනු කරයි. 2023 වර්ෂය තුළ විශාල බදු ගෙවන්නන්ගේ කාණ්ඩයේ එකතු කළ අගය මත බදු ලියාපදිංචි පුද්ගලයින් නියමිත දිනට බදු වාර්තා ගොනු කිරීමේ අනුකූලතා ප්‍රතිශතය 82%කි. නියමිත දින සිට මාසයකට පසු බදු වාර්තා ගොනු කිරීමේ අනුකූලතා ප්‍රතිශතය 90%කි. විශාල බදු ගෙවන්නන්ගේ අංශයට අදාළ නොවන බදු ගෙවන්නන් වශයෙන් ලියාපදිංචි බදු ගෙවන්නන් විසින් 2023 වර්ෂයේ දී නියමිත දිනට එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කරන ලද ප්‍රමාණය 46%ක් වූ අතර ඊට මසකට පසු ගොනු කරන ලද අනුප්‍රමාණය 59%ක් විය.

4.6 වගුව මගින් 2023 වර්ෂයේදී විශාල බදු ගෙවන්නා විසින් අංශයට අදාළ නොවන බදු ගෙවන්නන්ගේ එකතු කළ අගය මත බදු වාර්තාවල සමස්ත ගොනු කිරීම් සංඛ්‍යාව පෙන්නුම් කරයි.

4.6 වගුව : විශාල බදු ගෙවන්නන්ගේ අංශයට අදාළ නොවන වෙනත් ලියාපදිංචි බදු ගෙවන්නන් එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කිරීම

| මාසය | නියමිත කාලයේදී ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | ගොනු කිරීමට අපේක්ෂිත බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දිනට අනුකූලතාව % ලෙස | නියමිත දින සිට මසක් ඇතුළත අනුකූලතාව % ලෙස |
|---|---|---|---|---|---|
| ජනවාරි | 4,504 | 5,830 | 9,872 | 46% | 59% |
| පෙබරවාරි | 783 | 1,048 | 1,693 | 46% | 62% |
| මාර්තු | 829 | 1,024 | 1,701 | 49% | 60% |
| අප්‍රේල් | 5,029 | 6,600 | 11,328 | 44% | 58% |
| මැයි | 810 | 1,046 | 1,729 | 47% | 60% |
| ජුනි | 820 | 1,069 | 1,734 | 47% | 62% |
| ජූලි | 5,545 | 6,988 | 11,945 | 46% | 59% |
| අගෝස්තු | 798 | 1,027 | 1,737 | 46% | 59% |
| සැප්තැම්බර් | 761 | 1,067 | 1,743 | 44% | 61% |
| ඔක්තෝබර් | 5,820 | 7,319 | 12,540 | 46% | 58% |
| නොවැම්බර් | 793 | 1,034 | 1,749 | 45% | 59% |
| දෙසැම්බර් | 766 | 1,069 | 1,756 | 44% | 61% |
| **එකතුව** | **27,258** | **35,121** | **59,527** | **46%** | **59%** |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

විශාල බදු ගෙවන්නන්ගේ කාණ්ඩයේ සහ අනෙකුත් සියලුම කාණ්ඩවල එකතු කළ අගය මත බදු ලියාපදිංචි බදු ගෙවන්නන් සමස්තයක් ලෙස සැලකූ විට ගොනු කිරීමට බලාපොරොත්තු වූ බදු වාර්තා 63,206න් නියමිත දිනට ගොනු කර තිබුණේ බදු වාර්තා 30,273ක් පමණක් වන අතර එහි සාමාන්‍ය අනුකූලතා ප්‍රතිශතය 48%කි. නියමිත දින සිට මාසයකට පසු 61%ක අනුකූලතා ප්‍රතිශතයක් පෙන්නුම් කරමින් බදු වාර්තා 38,433ක් ඉදිරිපත් කර තිබුණි. පෙර වසරේ මෙම අනුකූලතා ප්‍රතිශතය 46% කි. පෙර වසර සමග සසඳන විට 2023 වර්ෂයේදී එ.අ.බ. වාර්තා බදු ගොනු කිරීමේ සැලකිය යුතු වර්ධනයක් නිරීක්ෂණය කළ හැකිය.

## 4.4 බලාත්මක කිරීම

### 4.4.1 විගණන

ව්‍යාපාර ක්‍රියාකාරකම්, ව්‍යාපාර වර්ගය සහ ව්‍යාපාරයේ ප්‍රමාණය අනුව සියලූ බදු ගෙවන්නන් ආවරණය වන පරිදි 2023 වසරේ විගණන සහ විමර්ශන කටයුතු සිදු කරන ලදී. ඒ අනුව, වසර තුළ විගණන 10,875ක් ආරම්භ කර 10,153ක් නිම කිරීමට හැකි වී ඇත. ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සිදු කරන ලද විගණන සංඛ්‍යාවේ සහ තක්සේරු තුළින් රැස් කර ගන්නා ලද ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරයි. විගණන තොරතුරු හා විගණන මගින් රැස් කළ ආදායම පිළිබඳ තොරතුරු 4.7 සහ 4.8 වගු මගින් දැක්වේ.

4.7 වගුව : විගණන පිළිබඳ විස්තර

| | ආදායම් බද්ද | එ.අ.බ. | උපයන විට ගෙවීම් බද්ද | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|
| වර්ෂය තුළ තක්සේරු කළ මුළු අතිරේක බදු ප්‍රමාණය (රු. මිලියන) | 23,784 | 10,600 | 140 | 7,015 | 41,539 |
| වර්ෂය තුළ රැස් කළ මුළු අතිරේක බදු ප්‍රමාණය (රු. මිලියන) | 11,678 | 3,600 | 88 | 5,532 | 20,899 |
| වර්ෂය තුළ ආරම්භ කළ විගණන පරීක්ෂණ සංඛ්‍යාව | 10,875 | | | | |
| වර්ෂය තුළ නිම කළ විගණන පරීක්ෂණ සංඛ්‍යාව | 10,153 | | | | |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

4.8 වගුව : සංස්ථාපිත සහ වෙනත් අංශ මගින් රැස් කරන ලද අතිරේක බදු වර්ගීකරණය

| විස්තරය | තක්සේරු කළ හා එකඟ වූ අතිරේක ආදායම/පිරිවැටුම (රු. මිලියන) | තක්සේරු කළ හා එකඟ වූ අතිරේක බදු (රු. මිලියන) | | | | එකතු කළ අතිරේක බදු (රු. මිලියන) |
|---|---|---|---|---|---|---|
| | | සංස්ථාපිත - විශාල බදු අංශය | සංස්ථාපිත - වෙනත් | වෙනත් අංශ | එකතුව | |
| ආදායම් බද්ද | 396,162 | 11,856 | 7,236 | 4,693 | 23,784 | 11,678 |
| එකතු කළ අගය මත බද්ද | 67,980 | 1,113 | 2,865 | 6,662 | 10,640 | 3,600 |
| උපයන විට ගෙවීමේ බද්ද | 5,068 | 44 | 39 | 57 | 140 | 88 |
| අනෙකුත් | 167,017 | 4,041 | 1,084 | 4,848 | 9,973 | 5,532 |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 4.4.2 අධිකරණ කටයුතු

4.10 වගුව මගින් 2023 වර්ෂය තුළ ගෙවීම් පැහැර හැර ඇති බදු එකතු කිරීම සඳහා ගොනු කර ඇති නඩු සංඛ්‍යාව පෙන්නුම් කරයි.

4.9 වගුව : ගෙවීම් පැහැර හැර ඇති බදු එකතු කිරීම සඳහා ගොනු කර ඇති නඩු

| උසාවියේ නම | 2023.01.01 දිනට විභාග වන නඩු සංඛ්‍යාව | වර්ෂය තුළ ගොනු කරන ලද නඩු සංඛ්‍යාව | වර්ෂය තුළ අවසන් කරන ලද නඩු සංඛ්‍යාව | 2023.12.31 දිනට විභාග වන නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මහේස්ත්‍රාත් අධිකරණය* | 401 | 66 | 141 | 326 |
| දිසා අධිකරණය* | 272 | - | 67 | 205 |
| මහාධිකරණය** | 40 | 16 | 2 | 54 |
| අභියාචනාධිකරණය** | 297 | 154 | 47 | 404 |
| ශ්‍රේෂ්ඨාධිකරණය** | 93 | 44 | 5 | 132 |
| **එකතුව** | **1,103** | **280** | **262** | **1,121** |

*මහේස්ත්‍රාත් අධිකරණ නඩු සහ දිසා අධිකරණ නඩු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ගොනු කරනු ලැබේ.

**මහාධිකරණ නඩු, අභියාචනාධිකරණ නඩු සහ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු දෙපාර්ශ්වය විසින් ගොනු කරනු ලැබේ. (දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හෝ බදු ගෙවන්නා)

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 4.4.3 බදු ගෙවීම මගහැරීම අවම කිරීම සඳහා ගත් පියවර

බදු ගෙවීම මග හැරීම සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීම සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ හෝ භෞතිකව හෝ රහසිගතව ක්‍රමවේදයන් පවතී. එසේ සපයන ලද තොරතුරු පදනම් කර ගනිමින් බදු රැස් කර ගත් විට එම තොරතුරු සැපයූ තැනැත්තන්ට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 101 වන වගන්තිය යටතේ සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 72 වන වගන්තිය යටතේ ත්‍යාග හිමිවේ (එකතු කරනු ලද ආදායමෙන් 15% ක් දක්වා).

05

පරිච්ඡේදය

# තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල් පරිවර්තනය



## 5.1 හැඳින්වීම

බදුකරණයෙහි කාර්යක්ෂමතාව, නිවැරදි බව සහ බදු ගෙවන්නන්ගේ තෘප්තිමත්භාවය අභිවර්ධනයට හේතු වෙමින් තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල් පරිවර්තනය විසින් බදු පරිපාලනය තුළ විප්ලවීය වෙනසක් ඇති කොට තිබේ. එබැවින් බදු පරිපාලනය විසින් එකී ඩිජිටල්කරණය සමග නිරන්තරව සම්බන්ධවීම තුළින්, දිනෙන් දින වෙනස් වන ආර්ථිකමය පරිසරයන් සමග අනුගතවීමටත්, එමගින් බදු ගෙවන්නන්ගේ සහ අදාළ පාර්ශ්වයන්ගේ අභිමතාර්ථයන් සපුරාලිය හැකි ආකාරයට කටයුතු කිරීමට බදු පරිපාලකයන්ට ඉඩහසර ලැබේ. රාජ්‍ය ආයතන මෙන්ම රාජ්‍ය නොවන ආයතන තුළද භාවිත වන නවීන තොරතුරු තාක්ෂණ පද්ධතීන් හරහා බදු පරිපාලකයන්ට අදාළ පද්ධති ස්වයංක්‍රීයකරණයට ලක්කිරීම, දත්ත විශ්ලේෂණය වැඩි දියුණු කිරීම සහ අනුකූලතා අධීක්ෂණය ඉහළ නංවා ගැනීමට පහසුකම් සැලසේ. එමෙන්ම මෙම ඩිජිටල්කරණ සේවාවන් තුළින් බදු ගෙවන්නාටද පද්ධතීන් වෙත වඩාත් පහසුවෙන් ප්‍රවේශවීමට හැකිවන අතර මාර්ගගතව වාර්තා ගොනු කිරීම, ගෙවීම් කිරීමේ පහසුව සහ අදාළ බදු නිලධාරීන් සමග හොඳින් සන්නිවේදනය කිරීම සඳහා අවස්ථාව සැලසේ. එබැවින් මෙම ඩිජිටල්කරණය මගින් ආයතනය තුළ අභ්‍යන්තර ක්‍රියාවලීන් විධිමත්වීම පමණක් නොව, බදු පරිපාලනය සහ මහජනයා අතර විනිවිදභාවය සහ විශ්වාසයද ඉමහත් ලෙස ප්‍රවර්ධනය කරනු ලැබේ. ඩිජිටල්කරණයේ තවත් ප්‍රතිඵලයක් ලෙස, බදු පරිපාලකයන්හට වඩා විශාල දත්ත ප්‍රමාණයක් හසුරුවා ගැනීම, දෝෂයන් අවම කර ගැනීම, කඩිනමින් ප්‍රතිචාර දැක්වීම ආදී කාර්යයන් සඳහා අවස්ථාව සහ පහසුකම් සැලසෙන අතර අවසාන වශයෙන්, එම තත්ත්වය වඩා ඵලදායී සහ සාධාරණ බදු පද්ධතීන් නිර්මාණය කිරීමෙහිලා හේතු වේ.

එබැවින් නූතන රාජ්‍ය සේවා ක්‍රියාවලිය තුළ තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල්කරණය ඒකාබද්ධ කර ගනිමින් කටයුතු කිරීම, බදුකරණය තුළ කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි බව යන කරුණු වැඩිදියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මනා ලෙස හඳුනාගෙන ඇත.

ඒ අනුව ක්‍රියාවලීන් වඩා විධිමත් කිරීම, වැඩි දියුණු කරනු ලැබූ සේවාවන් ලබා දීම සහ අනුකූලතාව වර්ධනය කිරීම ආදිය සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීමේදී භාවිත කළ ක්‍රමෝපායන් සහ ලබා ගනු ලැබූ ජයග්‍රහණ පිළිබඳව මෙම පරිච්ඡේදය තුළින් සාකච්ඡා කරනු ලැබේ.

ඉහත කී ඩිජිටල් තාක්ෂණික සම්බන්ධතාවන් වැළඳගනිමින් දෙපාර්තමේන්තුවෙහි පද්ධතීන් සහ ක්‍රියාවලින් නවීකරණය කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් මූලික ප්‍රයත්නයන් දරා තිබේ.

- බදු ගෙවන්නන් සඳහා විද්‍යුත් සේවා සැපයීම, බදු වාර්තා ක්‍රියාවලීන් විධිමත් කිරීම, නිරීක්ෂණ සහ විශ්ලේෂණ ක්‍රියාවලීන් සඳහා පහසුකම් සලසනු ලබන අතරතුර, බදු ගෙවන්නන්ගේ දත්ත ඒකරාශි කොට පවත්වා ගැනීම සඳහා 2016 වසරේදී ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු තාක්ෂණ පද්ධතියක් (RAMIS) ස්ථාපිත කිරීම
- කාර්යක්ෂමතාව පවත්වාගැනීම සඳහා සියලුම නිලධාරීන් සඳහා පරිගණක, ජාලගත කරනු ලැබූ මුද්‍රණ යන්ත්‍ර සහ ස්කෑනර් යන්ත්‍ර සඳහා ප්‍රවේශය සැලසීම
- බදු තොරතුරු, ආකෘති පත්‍ර, ලියාපදිංචිය වැනි සේවාවන්, ඉලෙක්ට්‍රොනික බදු වාර්තා ගොනු කිරීම, බදු ආපසු ගෙවීම පිළිබඳව ඉල්ලීම් ගොනු කිරීම, අභියාචනා ඉදිරිපත් කිරීම/ පරිපාලන සමාලෝචන ඉල්ලීම්, නිෂ්කාශන සඳහා ඉල්ලීම් වැනි සේවාවන් ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා බදු ගෙවන්නන් සඳහා විද්‍යුත් පිවිසුමක් ඇති කිරීම (www.ird.gov.lk) සහ එමගින් බදු ගෙවන්නන්හට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත පැමිණීමට සිදුවිය හැකි වාර ගණන අවම කිරීම
- දත්ත ඇතුළත් කිරීම, ලේඛන සැකසුම් කිරීම, බදු මුදල් ගෙවීම් සකස් කිරීම, බදු ගෙවන්නන්ට අදාළ මූල්‍යයනය ආදී දෛනික කටයුතු තොරතුරු තාක්ෂණය

හරහා සිදු කිරීම සහ බදු ගෙවන්නන් හා සන්නිවේදනය පවත්වාගැනීම සඳහා විද්‍යුත් තැපැල, කෙටි පණිවිඩ ආදී සේවාවන් යොදා ගැනීම

- සුවිශේෂ ඇමතුම් මධ්‍යස්ථානයක් (1944) ස්ථාපිත කොට සාමාන්‍ය රාජකාරි වේලාවෙන් බැහැර කාල සීමාව තුළදී ද වෘත්තීමය දුරකථන ඇමතුම් මධ්‍යස්ථාන නිලධාරීන් වෙතින් භාෂා ත්‍රිත්වයෙන්ම, තොරතුරු ලබා ගැනීමේ පහසුකම් ලබා දීම

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි සේවාවන් ස්වාධීනව ක්‍රියාත්මක කිරීම සහ දත්ත සුරක්ෂිතව පවත්වා ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අයත්, දත්ත මධ්‍යස්ථානයක් සහ ආපදා මගින් දත්තවලට සිදුවන බලපෑම යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා දත්ත ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම

- සයිබර් ප්‍රහාර සහ තර්ජනවලින් ආරක්ෂා වීම සඳහා සහ බදු ගෙවන්නන්ගේ දත්ත සුරක්ෂිත කර ගැනීම සඳහා සයිබර් ආරක්ෂණ පියවර සවිබල ගැන්වීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගනු ලබන RAMIS පද්ධතිය පූර්ණ පරිගණකගත ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ මෘදුකාංග පද්ධතියකි. එමගින්, බදු ගෙවන්නන්ගේ තොරතුරු කළමනාකරණය, බදු වාර්තා ගොනුකරණය සහ ක්‍රියාවලිකරණය, ගෙවීම් පිළිබඳව සොයා ගැනීම, බදු නීති ක්‍රියාත්මක කිරීම සහ අනුකූලතාව ඇති කිරීමට සිදු කරනු ලබයි. එමෙන්ම මෙම පද්ධතිය දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් විධිමත් කිරීම සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා විවිධ කාර්යයන් සහ දත්ත මූලාශ්‍ර ඒකාබද්ධ කර ගනිමින් ආදායම් එකතු කර ගැනීම සහ බදු පරිපාලනය සඳහා වූ විස්තීරණ වේදිකාවක් වශයෙන් ද ක්‍රියාත්මක වේ. RAMIS පද්ධතියේ ප්‍රමුඛ ලක්ෂණ අතරට පහත කරුණු ඇතුළත් වේ.

- **බදු ගෙවන්නන් ලියාපදිංචිය සහ හඳුනා ගැනීම:** බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීම, බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංක ලබා දීම, බදු ගෙවන්නන්ගේ තොරතුරු, ව්‍යාපාර තොරතුරු සහ බදු බැඳියාව (ලියාපදිංචි වී ඇති බදු පිළිබඳව තොරතුරු) ඇතුළත්ව බදු ගෙවන්නන්ගේ විස්තර පිළිබඳ නිවැරදි තොරතුරු පවත්වා ගෙන යාම සඳහා RAMIS පද්ධතිය මගින් පහසුකම් සැලසේ.

- **බදු ගොනුකරණය සහ ගෙවීම් ක්‍රියාවලිය:** RAMIS පද්ධතිය විසින් බදු ගෙවන්නා වෙත බදු වාර්තා මාර්ගගත ද්වාරය ඔස්සේ ඉලෙක්ට්‍රොනිකව ගොනු කිරීමේ හැකියාව සලසා තිබේ. එමගින් බදු වාර්තා සම්බන්ධයෙන් අදාළ කටයුතු සිදු කිරීම, බදු බැඳියාවන් ගණනය කිරීම ස්වයංක්‍රීයව මෙහෙයවනු ලබන අතර, බදු ගෙවීම් ගනුදෙනු ඇතුළත්ව බදු ගෙවන්නන්ගේ ලෙජරය පවත්වාගැනීමට පහසුකම් සලසයි.

- **දත්ත කළමනාකරණය සහ ඒකාබද්ධතාව:** RAMIS පද්ධතිය විවිධ මූලාශ්‍ර වෙතින් දත්ත එක්රැස් කර කේන්ද්‍රීය දත්ත සංචිතයකට යොමු කරනු ලබන අතර එමගින් දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙත බදු ගෙවන්නනාගේ අනුකූලතාව මූල්‍ය ගනුදෙනු සහ බලාත්මක කිරීමේ කාර්යයන් ආදිය පිළිබඳ විස්තරාත්මක තොරතුරු වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසයි. මෙම කාර්යයයේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, ලංකා බැංකුව, මහජන බැංකුව, ලංකා ක්ලියර් (පුද්) සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය සහ සුරාබදු දෙපාර්තමේන්තුව සමග මේ වන විටත් සම්බන්ධ වී සිටියි.

- **අනුකූලතාව අධීක්ෂණය කිරීම සහ බලාත්මක කිරීම:** බදුගෙවන්නාගේ අනුකූලතාව නිරීක්ෂණය කිරීම, බදු වාර්තා ගොනු නොකරන්නන් හඳුනා ගැනීම සහ නිරන්තරයෙන් බදු වාර්තා ගොනු නොකරන්නන් සම්බන්ධයෙන් නිලධාරීන් විසින් සුදුසු පියවර ගැනීම සඳහා RAMIS පද්ධතිය විසින් යාන්ත්‍රණයක් සපයනු

ලැබේ. බදු නීති රෙගුලාසි පිළිපැදීම තහවුරු කර ගැනීම සඳහා විගණන හෝ විමර්ශන සිදු කිරීමට RAMIS පද්ධතිය පහසුකම් සලසයි. එය බදු තක්සේරු කිරීම්, දඩ නියම කිරීම්, ප්‍රමාද වූ ගෙවීම් සඳහා පොලී අයකිරීම් සහ එකතු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම ආදී බලාත්මක කිරීමේ කාර්යයන් සඳහා උපකාරී වේ.

- **වාර්තාකරණය සහ විශ්ලේෂණය:** ආදායම් ප්‍රවණතා, ලියාපදිංචි බදුගෙවන්නන්ගේ, පළාත්, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමෙන් භූගෝලීය වශයෙන් ව්‍යාප්ත වීම සම්බන්ධයෙන් ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට RAMIS පද්ධතිය වාර්තා සහ විශ්ලේෂණාත්මක පුවරු නිර්මාණය කරනු ලැබේ. එමෙන්ම අනුකූලතා මට්ටම්, නිලධාරීන්ගේ මෙහෙයුම් කාර්යසාධන දර්ශක පිළිබඳ මනා අවබෝධයක් ලබා දෙයි. අවදානම් මට්ටම් හඳුනා ගැනීම සඳහා සහයෝගය දැක්වීමට සමාන කර්මාන්තවල නියැලෙන බදුගෙවන්නන් විසින් වාර්තා කිරීමේ විෂමතාවන් පිළිබඳව විශ්ලේෂණ මගින් දක්වනු ලැබේ. මෙමගින් දත්ත පදනම් කරගෙන තීරණ ගැනීම සහ ක්‍රමෝපායික සැලසුම්කරණය සඳහා පහසුකම් සලසයි.

- **ආරක්ෂාව සහ විශ්වාසවන්තභාවය:** බදු ගෙවන්නාගේ සංවේදී තොරතුරු ආරක්ෂා කිරීමට සහ අනවසර ප්‍රවේශ හෝ අයුතු ලෙස දත්ත පරිශීලනය වැළැක්වීමට RAMIS පද්ධතිය විසින් දැඩි ආරක්ෂිත ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් නීති සංස්ථාපනය කර තිබේ. පෞද්ගලිකත්වය සහ විශ්වාසවන්තභාවය ආරක්ෂා කිරීමට දත්ත ආරක්ෂණ ප්‍රමිතීන් සමග අනුකූල වේ.

- **ගැටලු විසඳීම සඳහා පරිශීලකයින්ට සහයෝගය දැක්වීම:** RAMIS පද්ධතිය සිය උපකාරක පද්ධතිය භාවිතයෙන් පරිශීලක උපකාරක සේවා සපයනු ලබන අතර බදු නිලධාරීන්ට ඵලදායී ලෙස පද්ධතිය භාවිත කිරීමට සහයෝගය දක්වයි. මෙම සේවය මගින් RAMIS පද්ධතිය මෘදු සහ පහසු ආකාරයෙන් පරිශීලනය කිරීම තහවුරු කිරීමට සහතික කිරීමට බදු ගෙවන්නන්/බාහිර පරිශීලකයින් සඳහා ක්ෂණික මාර්ගෝපදේශක සපයනු ලබයි.

සමස්තයක් වශයෙන් ගත් කළ අනුකූලතාව සඳහා වන ප්‍රයත්නයන් වර්ධනය කර ගැනීමට සහ බදු ගෙවන්නා සඳහා වන සේවා සැපයුම වැඩිදියුණු කර ගැනීමට RAMIS පද්ධතිය බදු මෙහෙයුම් කටයුතුවලදී ඉතා වැදගත් මෙවලමක් වශයෙන් සේවය සලසයි. තාක්ෂණය සහ ස්වයංක්‍රියකරණය උපයෝගී කර ගැනීම තුළින් RAMIS පද්ධතිය, වඩාත් කාර්යක්ෂම සහ සඵලදායී ලෙස බදු රැස්කිරීමේ ඉලක්ක කරා ළඟාවීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත සහාය දක්වයි.

## 5.2 ජයග්‍රහණ සහ සන්ධිස්ථාන

2023 වර්ෂයේදී, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සේවය සැපයීම සහ මෙහෙයුම් සඵලදායීතාව ඉහළ නංවා ගැනීමට තාක්ෂණය උපරිම වශයෙන් යොදා ගනිමින් සුවිශේෂී ඉදිරි පියවරක් තැබීය. එහිදී ලබා ගත් සුවිශේෂී ජයග්‍රහණ කිහිපයක් පහත සඳහන් පරිදි වේ.

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පාලනයෙන් තොරව විවිධ හේතූන් මත වසර ගණනාවක් ප්‍රමාද වූ RAMIS 2.0 ක්‍රියාත්මක කිරීම මගින් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙහි කාර්යය ඉටු කිරීම
- බදු ගොනුකරණය සහ ගෙවීම් සිදුකිරීම ඉහළ නැංවීම මගින් කෙටි කාලයක් තුළ වඩාත් ශීඝ්‍රයෙන් කාර්යයන් ඉටු කිරීම සහ බදු ගෙවන්නන් සහ බදු නිලධාරීන් මුහුණ දෙන පරිපාලන ගැටලු අවම කිරීම
- බදු ගෙවන්නන් සඳහා මාර්ගගතව බදු ගෙවීමේ පහසුකම සලසන වාණිජ බැංකු සංඛ්‍යාව වැඩි කිරීම

- විශේෂයෙන්ම, විෂමතා හඳුනාගැනීම් වාර්තාකරණය සහ ඉලක්කගත බලාත්මක කිරීමේ කටයුතු වඩාත් සඵලදායීව සිදු කිරීම සඳහා බදු අනුකූලතා අවදානම් හඳුනාගැනීමේ දත්ත විශ්ලේෂණ මෙවලම් භාවිත කිරීම

- ඩිජිටල් භාවිතය සහ මාර්ගගත බදු සේවා උපදේශනය වැඩි දියුණු කිරීමට බදු ගෙවන්නන් සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- දත්ත හුවමාරු කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන වැඩි ප්‍රමාණයක් සමග ඒකාබද්ධව ක්‍රියාත්මකවීම ආරම්භ කිරීම සහ ඩිජිටල්කරණය කළ බදු පරිපාලන ක්‍රියාවලි තුළ, තෙවන පාර්ශ්වයක තොරතුරු භාවිතය පිළිබඳ ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ තොරතුරු දැනගැනීම සඳහා ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ආයතන සමග කටයුතු කිරීම

- 2023 වසරේ සිදුවූ තවත් වැදගත් සිදුවීමක් ලෙස, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ ඉල්ලීම පරිදි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් RAMIS පද්ධතිය පිළිබඳව 2023 මාර්තු මස පවත්වන ලද ඇගයුම හඳුනාගත හැකිය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂඥයන් විසින් RAMIS පද්ධතිය පිළිබඳව නිකුත් කරනු ලැබූ නිර්දේශ එම පද්ධතියෙහි අනාගත ක්‍රියාකාරීත්වය සඳහා මාර්ගෝපදේශයක් සපයනු ඇත.

## 5.3 අනාගත මෙහෙයුම් සහ ක්‍රමෝපායන අරමුණු

ඉදිරි අනාගතය පිළිබඳ දැක්මෙන් යුතුව නව්‍යකරණයෙහි නියැලීමට සහ ප්‍රතිඵල ඉහළ නංවා ගැනීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තාක්ෂණික ශක්තියෙන් සන්නද්ධ වීමට කැපවීමෙන් කටයුතු කරයි. තොරතුරු තාක්ෂණ හා ඩිජිටල්කරණ ක්ෂේත්‍රය තුළ අපගේ අනාගත මෙහෙයුම් සහ ක්‍රමෝපායන අරමුණු පහත සඳහන් පරිදි වේ.

- විශ්වසනීයත්වය සහ ප්‍රත්‍යස්ථිතිය සහතික කිරීම සඳහා අපගේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ පද්ධති අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහ ප්‍රශස්තකරණය කිරීම

- දැනට පවතින දත්ත මධ්‍යස්ථානය අතිනවීන තාක්ෂණයෙන් යුතු තෙවන මට්ටමේ දත්ත මධ්‍යස්ථානයක් බවට සංවර්ධනය කිරීම

- බදු ගෙවන්නාගේ පහසුව සහ ප්‍රවේශ හැකියාව තවදුරටත් ඉහළ නැංවීම සඳහා මාර්ගගත සේවා සැපයීම සහ ඩිජිටල් ක්‍රම භාවිතය පුළුල් කිරීම

- මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල, ආගමන විගමන දෙපාර්තමේන්තුව ආදී ආයතන සමග ඒකාබද්ධව කටයුතු කිරීම

- නව දෘෂ්ටීන් විවර කර ගැනීම සඳහා යාන්ත්‍රික ඉගෙනුම් සහ දත්ත විශ්ලේෂණ වැනි නව තාක්ෂණික ක්‍රම සම්බන්ධ කර ගැනීම, විගණන සහ ආපසු ගෙවීම්වලදී අවදානම් පදනම් කරගෙන තීරණ ගැනීම වැඩි දියුණු කිරීම සහ අනුකූලතා ශක්‍යතා ඉහළ නැංවීම

- තාක්ෂණය ඵලදායී ලෙස භාවිත කිරීමට සහ ක්‍රමිකව විකාශනය වන තොරතුරු තාක්ෂණ ප්‍රවණතා සහ අභියෝගවලට අනුවර්තනය වීමට අවශ්‍ය කුසලතා සහ දැනුමෙන් කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම සඳහා පුහුණු සහ ධාරිතා සංවර්ධන නව ක්‍රම සඳහා ආයෝජනය කිරීම

- නවීන වාණිජ ලෝකයෙහි වෙනස්කම් සහ බදු ප්‍රතිපත්තිවල වෙනස්කම් නවීන තාක්ෂණයෙහි අභිවෘද්ධීන් හා එක්ව ගමන් කළ හැකි මීළග පරපුරෙහි බදුකරණ ක්‍රියාවලිය සඳහා යෝග්‍යතම මෘදුකාංගය ලෙස RAMIS පද්ධතිය සංවර්ධනය කිරීම

- දත්ත ආරක්ෂාව, දත්තවල පෞද්ගලිකභාවය සුරක්ෂිත කිරීම සඳහා දත්ත පාලන ප්‍රතිපත්තියක් සකස් කිරීම

- ඉදිරි වර්ෂ 03 සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ ක්‍රමෝපාය සැලසුම සකස් කිරීම - ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙම තොරතුරු තාක්ෂණ ක්‍රමෝපාය සැලැස්ම සකස් කරනු ලබන අතර 2025 වසරේදී එය ක්‍රියාත්මක කිරීම ආරම්භ කොට 2027 වසර අවසානයේදී නිම කිරීමට අපේක්ෂා කරයි.

අවසාන වශයෙන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එහි ක්‍රියාකාරීත්වය නවීකරණය කිරීමේ අරමුණ කේන්ද්‍ර කර ගනිමින් තොරතුරු තාක්ෂණමය පහසුකම් සහ ඩිජිටල්කරණයෙහි ප්‍රතිලාභ තම කාර්යයභාරය තුළට ඒකාබද්ධ කරගනු ලබන බවත්, මෙම නවීන තාක්ෂණයේ වැළඳගැනීම තුළින් අඛණ්ඩ අභිවෘද්ධිය ඉලක්ක කරගත් වැඩ පරිසරයක් ප්‍රවර්ධනය කර ගනිමින්, පවතින ඩිජිටල් යුගයට ගැළපෙන සේ වඩා වඩා කාර්යක්ෂම සේවාවක් සැපයීමට කැපවී සිටින බව ප්‍රකාශ කළ හැකිය.

06

පරිච්ඡේදය

# ආයතනික කාර්ය සාධනය



## 6.1 හැඳින්වීම

විස්තීර්ණ අරමුදල් පහසුකම (EFF) යටතේ ඉටු කිරීමට පවරන ලද ව්‍යුහාත්මක මිනුම්වලට සමගාමීව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් කරන ලද මගපෙන්වීමට අනුකූලව සහ සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් (DPO - 2) යටතේ ලෝක බැංකුව විසින් පවරන ලද කාර්යයන්ට අනුකූලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2023 වර්ෂයේ දී සිය මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා පරිවර්තනීය ගමනක් ආරම්භ කළේය. බදු නිලධාරීන්ගේ අවංකභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් පුළුල් ආචාර ධර්ම පද්ධතියක් යාවත්කාලීන කර ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමත් සමගම මෙම වසර ආයතනික කාර්ය සාධනයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. මීට අමතරව, බදු ගෙවන්නන්ගේ ප්‍රඥප්තියේ කටයුතු නිම කර ප්‍රකාශයට පත් කිරීම මගින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සිය කටයුතුවල විනිවිදභාවය සහ බදු ගෙවන්නන්ගේ අයිතිවාසිකම් කෙරෙහි දෙපාර්තමේන්තුව දක්වන කැපවීම අවධාරණයට ලක් කරන ලදී. අනාගත මුලපිරීම් සඳහා පැහැදිලි පෙර දැක්මක් සකස් කරමින් දෙපාර්තමේන්තුව 2024-26 කාලසීමාව සඳහා උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලිය ද සම්පූර්ණ කළේය. වඩාත් ඉලක්කගත මෙන්ම කාර්යක්ෂම මෙහෙයුම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම තහවුරු කරමින් විශාල බදු ගෙවන්නන්ගේ පරිපාලනය පිළිබඳ සංවිධානාත්මක තාර්කිකකරණය සමග ව්‍යුහාත්මක වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී. අනුකූලතා අවදානම් කළමනාකරණය තුළ සිදු කරන ලද ප්‍රධාන වැඩි දියුණු කිරීම් සහ ඉහළ වත්කම් සහිත පුද්ගල (HWI) අංශයක් ස්ථාපනය කිරීම හේතු කොට ගෙන බදු අනුකූලතාව සහ සාධාරණත්වය ආමන්ත්‍රණය කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතු හැකියාව තවදුරටත් වැඩි දියුණු විය. හඳුන්වා දෙන ලද ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) දෙපාර්තමේන්තුව වසර පුරා අත් කර ගනු ලබන ප්‍රගතිය සහ ජයග්‍රහණ තක්සේරු කිරීමේ මිනුම්දඬු විය. එපමණක් නොව, මෙම ප්‍රයත්න, රටේ සංවර්ධනයට මෙන්ම රාජ්‍ය මූල්‍ය ස්ථායීතාව ඇති කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරය විදහා දක්වමින් තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීමේ පුළුල් පරමාර්ථය සඳහා සැලකිය යුතු ලෙස දායක විය.

මෙම පරිච්ඡේදයේ ඉදිරි ඡේද යටතේ ඉහත සඳහන් කළ කාර්යයන්හි ප්‍රගතිය කෙටියෙන් විස්තර කෙරේ.

### 6.1.1 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නව ආචාර ධර්ම සංග්‍රහය (COC) ක්‍රියාත්මක කිරීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතුවල අවංකබව ශක්තිමත් කිරීමට මෙන්ම දූෂණ සිදුවීමේ අවදානම ආමන්ත්‍රණය කිරීම පිණිස යාවත්කාලීන කරන ලද ආචාර ධර්ම සංග්‍රහයක් සකස් කර ක්‍රියාත්මක කරන ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2023 වසරේ ජූලි මස නිකුත් කළ පාලන විනිශ්චය තක්සේරුව මගින් නිර්දේශ කර ඇත. එබැවින් පවත්නා ආචාර ධර්ම සංග්‍රහය ජාත්‍යන්තර ප්‍රශස්ත ව්‍යවහාර පිළිබිඹු වන අයුරින් සරල කර යාවත්කාලීන කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පියවර ගත්තේය.

නිලධාරීන්ගේ හැසිරීම රජය, බදු ගෙවන මහජනතාව, විදේශීය ආයෝජකයින්, එක්ව වැඩ කරන සේවක පිරිස, සුපරීක්ෂකයන්, නිලධාරීන් සහ යටත් නිලධාරීන් ඇතුළු පාර්ශ්වකරුවන් වෙත බලපෑමක් ඇති කරයි. බදු ගෙවන්නන් සමග රාජකාරි කටයුතු කිරීමේ දී නිලධාරීන් හැසිරෙන අන්දම දෙපාර්තමේන්තුව කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කිරීමෙහිලා බෙහෙවින් වැදගත් වේ. එවැනි පැහැදීමක් නොමැතිව, ඵලදායී බදු පරිපාලනයක් කෙරෙහි විශ්වාසය ඇති කළත් එය ඉතාමත්ම දුෂ්කර කාර්යයක් වනු ඇත. ආචාර ධර්ම සංග්‍රහයක් මගින් නිලධාරීන් වෙත සම්මත චර්යා ධර්ම රාමුවක් ලබා දෙන අතර එමගින් යහපත් සහ ඵලදායී බදු පරිපාලනයක් තුළ අවංකභාවයේ වැදගත්කම ප්‍රවර්ධනය කරනු ලබයි.

තවද, නිලධාරීන් සේවයෙහි යෙදී සිටින සෑම මොහොතක දී ම මෙන්ම සෑම අවස්ථාවකදීම රජය කෙරෙහි අඛණ්ඩ පක්ෂපාතිත්වයකින් යුතුව කටයුතු කරනු ඇතැයි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි. එවන් සේවාවක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වටිනාකම් හා කැපවීම්

පිළිබිඹු කරයි. එමෙන්ම බදු ගෙවන්නන් වෙත එවන් සේවාවක් ලැබෙන විට දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතුවලට එරෙහිව එල්ලවන බලපෑම සහ අනවශ්‍ය ඉහළ පිරිවැය අඩු වී එය දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතුවල ඍජුභාවය ශක්තිමත් කිරීමට ඉවහල් වේ.

නව ආචාර ධර්ම සංග්‍රහය ජාත්‍යන්තර ප්‍රශස්ත ව්‍යවහාර සැළකිල්ලට ගනිමින් සකස් කර ඇති අතර එය දෙපාර්තමේන්තුවේ කිසිසේත්ම දූෂණය නොඉවසීමේ ප්‍රතිපත්තිය තහවුරු කරයි. එයට විශේෂයෙන් පහත සඳහන් කරුණු ඇතුළත් වේ.

1. ආචාර ධර්ම සංග්‍රහයේ අරමුණු
2. එහි යෙදවුම් විෂය පථය
3. වගකීම සහ ආචාර ධර්ම සංග්‍රහයට දක්වන අනුකූලතාව
4. බදු නිලධාරීන්ගේ හැසිරීම නියාමනය කරනු ලබන මූලධර්ම
5. අනනුකූලතා අවස්ථා සහ ගත යුතු ක්‍රියාමාර්ග

මෙම නව ආචාර ධර්ම සංග්‍රහය පිළිබඳව මෙන්ම එහි සඳහන් මූලධර්ම, අපේක්ෂිත චර්යාවන් සහ ආචාර ධර්ම සංග්‍රහයේ ප්‍රධාන අංශ පිළිබඳ කාර්ය මණ්ඩලයේ දැනුම්වත්භාවය ඉහළ නැංවීම පිණිස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබන වසරේ පුළුල් ආරම්භක පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කඩිනමින් පියවර ගනු ඇත. අවංක හැසිරීම ආයතනගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ කාර්ය මණ්ඩලයේ දැනුම්වත්භාවය සහ අවබෝධය පරීක්ෂා කිරීම පිණිස මෙන්ම ආචාර ධර්ම සංග්‍රහයට සිදු කරන ලද වෙනස්කම් වරින් වර යළි සවි ගැන්වීමට දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇත. තවද, මානව සම්පත් අංශය විසින් කාර්ය මණ්ඩලය නිතිපතා අධීක්ෂණයට ලක් කර ආචාර ධර්ම සංග්‍රහය උල්ලංඝනය කරනු ලබන නිලධාරීන්ට එරෙහිව පියවර ගනු ලැබේ.

### 6.1.2 බදු ගෙවන්නන්ගේ ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කිරීම

විනිවිදභාවය, සාධාරණත්වය හා බදුගෙවන්නා කේන්ද්‍ර කරගත් ප්‍රවේශයක් වෙත කැපවී කටයුතු කිරීමේ වැදගත්කම විදහා දක්වමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2023 වසරේදී සිය බදු ගෙවන්නන්ගේ ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කළේය. දෙපාර්තමේන්තුවට ඉතා වැදගත් වූ මෙම බදු ගෙවන්නන්ගේ ප්‍රඥප්තිය තුළින් යම් උත්සාහයක කූටප්‍රාප්තිය නියෝජනය වනවා පමණක් නොව එය බදු ගෙවන්නන් වෙත වැඩිදියුණු කළ සේවාවක් ලබා දීමට සහ දෙපාර්තමේන්තුවට බදු ගෙවන්නන් සමග සබඳතා ශක්තිමත් කර ගැනීමට මග පෙන්වන පහන් කණුවක් ද වේ.

බදු ගෙවන්නන්ගේ ප්‍රඥප්තිය, බදු ගෙවන්නන් හා දෙපාර්තමේන්තුව අතර වන අන්තර් සබඳතා පාලනය කරන මූලධර්ම සහ අයිතිවාසිකම් දක්වා ඇති නියත ලියවිල්ලක් ලෙස ක්‍රියා කරන අතර එය සෑම බදු ගෙවන්නෙකුටම සාධාරණව සහ ගෞරවනීය අයුරින් සලකන බව සහතික කරමින් තමන් ලබා දෙන සේවාව හා සම්බන්ධයෙන් ඉතාම ඉහළ මට්ටමේ ප්‍රමිතියක් ආරක්ෂා කර ගැනීමට දෙපාර්තමේන්තුව දෙන ප්‍රතිඥාවට සාක්ෂියක් ලෙස පවතී.

ප්‍රඥප්තියට කේන්ද්‍රීය වන්නේ බදු ගෙවන්නන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් විස්තර කිරීම, බදු ගෙවන්නන්ට දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂා කළ හැකි දේ පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා දීම සහ අනෙක් අතට, දෙපාර්තමේන්තුව විසින් බදු ගෙවන්නන්ගෙන් අපේක්ෂා කරන්නේ කුමක්ද යන වග පැහැදිලි කිරීමයි. මෙම විනිවිදභාවය මගින් හිතකර බදු පරිසරයක් පෝෂණය කිරීමෙහි ලා අත්‍යවශ්‍ය අංග වන අන්‍යෝන්‍ය විශ්වාසය සහ වගවීම පිළිබඳ හැඟීමක් ඇති කරයි.

තව ද, ප්‍රඥප්තිය මගින් දෙපාර්තමේන්තුව සහ බදු ගෙවන්නන් අතර සහයෝගීතාව ඇති කිරීමට සහ ප්‍රයෝජනවත් අයුරින් ප්‍රතිචාර දැක්වීමට දිරිමත්වන පරිසරයක් නිර්මාණය කරමින් විවෘත සංවාදයක් සඳහා පදනම සකස් කරයි. බදු ගෙවන්නන්ගෙන් සක්‍රියව අදහස් ලබා ගනිමින් සිය සේවාව අඛණ්ඩව වැඩිදියුණු කිරීම දෙපාර්තමේන්තුවේ ඉලක්කයයි. මේ අතරම ක්‍රමයෙන් විකසනය වන අවශ්‍යතාවන්ට සහ අපේක්ෂාවන්ට ද දිගටම ප්‍රතිචාර දැක්වීම තහවුරු කිරීමට දෙපාර්තමේන්තුව සමත් වී ඇත.

බදු ගෙවන්නන්ගේ ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කිරීම හුදු නිලධාරිවාදී ව්‍යායාමයක් නොව එය බදු ගෙවන්නන් වෙත බදුකරණය සඳහා වඩාත් සංයුක්ත වූ මෙන්ම සහභාගීත්වයක් ලබාදෙන්නා වූ ප්‍රවේශයක් වෙත මූලික වශයෙන් සම්ප්‍රාප්ත වීමක් සනිටුහන් කරයි. තවද මෙම ප්‍රඥප්තිය මගින් බදු ගෙවන්නන්ට දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී හඬක් නැගීමට අවස්ථාවක් සහ වේදිකාවක් ලබාදෙමින් බදු ගෙවන්නන් සවිබල ගන්වයි. තවද ඒ හරහා ඔවුන්ට බදු ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි විශෝධනය කිරීමේ දැනට ක්‍රියාත්මක වන්නා වූ ක්‍රියාදාමයට ද දායකවීමේ අවස්ථාව සැලසේ.

එමෙන්ම මෙම ප්‍රඥප්තිය, බදු ගෙවන්නන්ගේ සුභසිද්ධිය තකා සේවය කිරීමෙහිලා මෙන්ම දෙපාර්තමේන්තුව හා බදුගෙවන්නන් අතර අන්‍යෝන්‍ය ගෞරවය සහ සහයෝගීතාවය ගැබ් වූ සංස්කෘතියක් පෝෂණය කිරීමෙහිලා දෙපාර්තමේන්තුව දක්වන නොසැලෙන කැපවීමට සාක්ෂියක් ද වේ.

### 6.1.3 2024 - 2026 සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තු උපායමාර්ගික සැලැස්ම සම්පාදනය කිරීම

ශ්‍රී ලංකාව සිය ඉතිහාසයේ මුහුණ දුන් දරුණුතම ආර්ථික අර්බුදයෙන් ක්‍රමක්‍රමයෙන් ගොඩ එමින් සිටී. මෙසේ රට යළි ප්‍රකෘතිමත්භාවයට පත්වන්නේ රජයේ ණය බැඳීම් තවදුරටත් ඉටු කළ නොහැකි තරම් පහළ මට්ටමකට රට වැටී සිටි 2022 වසරේ සිට ය. මෙම තත්ත්වය ඇතිවීම ද ඉතිහාසයේ එකතු කරන ලද අඩුම රාජ්‍ය ආදායම එකතු කිරීමට සිදුවීම ද එකවිට සිදු විය. මෙසේ අඩුම රාජ්‍ය ආදායමක් එකතු කිරීමට සිදු වූයේ එවකට දුර්වලවෙමින් පැවති ආර්ථික තත්ත්වය හේතුවෙන් වඩවඩාත් උග්‍ර වූ 2019 වසරේ සිදු කළ ප්‍රතිපත්තිමය වෙනස්කම්වල සහ COVID-19 වසංගතයේ ප්‍රතිඵලයක් වශයෙනි.

2024 වසරේ සිට 2026 දක්වා වූ උපායමාර්ගික සැලැස්මේ තුන් අවුරුදු කාලසීමාව තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ යුතු වූ සිය ආදායම් තර කිරීමේ ප්‍රයත්න මත දැඩි ලෙස විශ්වාසය තබමින් යළි ප්‍රකෘතිමත් තත්ත්වයට ළගාවීමට අභියෝගාත්මක මාවතක් සැලසුම් කර ඇත.

මෙසේ දැඩි අවශ්‍යතාවක් වූ රාජ්‍ය ආදායම සාධාරණව, කාර්යක්ෂමව සහ විනිවිද පෙනෙන අයුරින් උත්පාදනය කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රජයේ සහය සහ සම්පත් ද, හවුල්කරුවන්ගේ උපකාරය සහ උපදෙස් ද ඇතිව ආයතනික පරිවර්තනයක් සිදු කිරීම සඳහා දැනටමත් කටයුතු ආරම්භ කර ඇත. මෙහි අරමුණ වන්නේ, මෑත කාලීන පාලන විනිශ්චය තක්සේරුව මගින් මෙන්ම අභ්‍යන්තරිකව සිදු කළ ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළබඳ විශ්ලේෂණය මගින් හඳුනාගත් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාවලිය තුළ පවත්නා හිඩැස් සහ අඩුපාඩු ආමන්ත්‍රණය කරමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඵලදායී බදු පරිපාලනය තුළ ලෝකයේ පිළිගත් තැනකට ඔසවා තැබීමයි.

ආයතනික පරිවර්තනය සිදු කර මෙහෙයුම් ප්‍රතිඵල වැඩිදියුණු කිරීමට සහ බදු ගෙවන්නන්ට මෙන්ම සමාජයට ද වඩාත් ඵලදායී සේවාවක් ලබා දීම පිණිස ද ජාත්‍යන්තර ප්‍රශස්ත පරිචයන්ට අනුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සිය දැක්ම, මෙහෙවර ප්‍රකාශය, මූලික වටිනාකම් සහ උපායමාර්ගික අරමුණු යාවත්කාලීන කළේය.

### 6.1.4 විශාල බදු පරිපාලනය පිළිබඳ ආයතනික සාධාරණකරණය

විශාල බදු ගෙවන්නන්ගේ කාර්යාලය (LTO) විශාල සංස්ථාපිත අස්තිත්වයන්හි බදු කටයුතු කළමනාකරණය කිරීමෙහිලා වගකීම දරනු ලැබේ. එසේම, බදු ආදායමට විශාල වශයෙන් දායක වන ඉහළ වත්කම් සහිත පුද්ගලයන් ද විශාල බදු ගෙවන්නන්ගේ කාර්යාලයේ විෂය පථයට අයත් වේ. විශාල බදු ගෙවන්නන්ගේ කාර්යාලය තුළ දී බදු ගෙවන්නන් මූල්‍ය, නිෂ්පාදන, සේවා, තොග සහ සිල්ලර ලෙස ප්‍රධාන අංශවලට වර්ගීකරණය කර ඇති අතර ඒ එක් එක් අංශය තුළ සිටින බදු ගෙවන්නන් සංඛ්‍යාව මත පදනම්ව ඒකක වෙන් කර ඇත. තවද, මෙම වාර්තාකරණ ව්‍යුහය මගින් කොටස්වලට වෙන් කරන ලද විශාල බදු ගෙවන්නන්

සඳහා විශේෂයෙන් නිර්මිත අභියාචනා, පැහැර හරින ලද බදු එකතු කිරීම සහ ආපසු ගෙවීමේ ඒකක ආවරණය කරයි.

### 6.1.5 අනුකූලතා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම

අනුකූලතා අවදානම් කළමනාකරණය යනු අපගේ බදු පදනමට ඇති ඉහළම අනුකූලතා අවදානම තීරණය කර තිරසාර ස්වේච්ඡා අනුකූලතාව ඉහළ නැංවීම සඳහා පිරිවැය අතින් ඵලදායී විකල්ප පිළියම් තෝරා ගැනීමේ ක්‍රියාවලියකි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතු සම්පත් සීමිත බැවින් විශිෂ්ට ප්‍රතිඵල ලබා ගැනීම සඳහා අප මෙම සම්පත් ඵලදායීව සහ කාර්යක්ෂමව භාවිත කළ යුතුය. අනුකූලතා අවදානම් කළමනාකරණයේ දී සිදුවන්නේ තුන්වන පාර්ශ්වයක මූලාශ්‍රවලින් ලබාගත් දත්ත සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතු දත්ත විශ්ලේෂණය කිරීමෙන් අවදානම තීරණය කිරීමයි.

අනුකූලතාව හා සම්බන්ධ ගැටලු පිළිබඳව කටයුතු කිරීම සඳහා අනුකූලතා අවදානම් කළමනාකරණය මගින් ශක්තිමත් මෙන්ම ප්‍රශස්ත භාවිතය සහිත ප්‍රවේශයක් සපයයි. අනුකූලතා අවදානම් කළමනාකරණයේ දී සාමාන්‍ය අවදානම් කළමනාකරණය සඳහා ජාත්‍යන්තර සම්මතයන් භාවිත කරයි. කීර්තිමත් ජාත්‍යන්තර සංවිධාන විසින් සකස් කරන ලද අනුකූලතා අවදානම් කළමනාකරණ ක්‍රම මගින් බදු හැසිරවීම සහ බදු ගෙවන්නන්ගේ අනුකූලතාව සහතික කිරීම සඳහා නිශ්චිත උපාය මාර්ග ලබා දේ.

අවදානම් කළමනාකරණ කමිටුවක් පිහිටුවා ඇත. එය අවදානම් අත්පොතක් නිර්මාණය කිරීම සහ විගණන සිද්ධි තෝරාගැනීම සඳහා අවදානම් නිර්ණායක ක්‍රමානුකූලව හඳුන්වා දීම මගින් මනා ප්‍රගතියක් ලබා ඇත. එම කමිටුව, සිය හැකියාව සහ පළපුරුද්ද අනුව ඉහළ ප්‍රමුඛතා අවදානම් තක්සේරු කිරීම, අනුමත කිරීම සහ ඒ සම්බන්ධ කටයුතු ඉටු කිරීම සිදු කරනු ඇත. ලියාපදිංචිය, ගොනු කිරීම, ගෙවීම සහ වාර්තා කිරීම යන සිව්වැදෑරුම් අනුකූලතා අංග අතරින් එක් එක් අනුකූලතා අංගයට අදාළ අවදානම් හඳුනාගෙන ඇගයීම සඳහා එම කමිටුව විසින් වඩාත්ම වැදගත් කර්මාන්ත අංශ හඳුනාගෙන පර්යේෂණ සිදු කරනු ඇත.

අනුකූලතා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය මත පදනම්ව විගණන සිද්ධි තෝරා ගනු ලබන අතර මෙම විගණනය කළ යුතු සිද්ධිවලට අදාළ වැඩ ප්‍රමාණය කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ වැඩ ප්‍රමාණය සහ මෙම විගණන සිදු කරගෙන යාමට නිලධාරීන් සතු නිපුණතා පදනම් කොට ගෙන ඉදිරියේ දී ලැබේයැයි උපකල්පනය කළ හැකි ආදායම් ලැබීම් (තක්සේරු කළ ඉහළම අවදානම්) අනුව වෙන් කර දෙනු ලැබේ.

අවදානම් කළමනාකරණ කමිටුව විසින් නියම කරන පරිදි පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා අවදානම් කළමනාකරණ අංශයක් ද පිහිටුවා ඇති අතර, එහි ශක්‍යතාව ගොඩනංවමින් පවතී. මෙම ඒකකය මගින් මූලික වශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ මධ්‍ය පරිමාණ සහ විශාල බදු ගෙවන්නන්ගේ අංශවල ඉදිකිරීම්, හෝටල් සහ සංචාරක කර්මාන්තය, සහ බැංකු සහ මූල්‍ය සේවා අංශවල පර්යේෂණ සහ අවදානම් හඳුනාගැනීම් කෙරෙහි ය.

අවදානම්-පාදක විශ්ලේෂණය මත පදනම්ව අනුකූලතා වැඩිදියුණු කිරීමේ සැලසුම් සකස් කරමින් පවතී. අවදානම් කළමනාකරණ අංශයෙහි ප්‍රමුඛතාව වන්නේ නිෂ්පාදන සහ සේවා අංශයන්ගෙන් ආරම්භ කර එක් එක් විශාල බදු ගෙවන්නන්ගේ අංශ සඳහා අනුකූලතා වැඩිදියුණු කිරීමේ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමයි. කාලයත් සමග අනුකූලතා අවදානම් කළමනාකරණ හැකියාව තවදුරටත් ගොඩනැංවීම සඳහා, අවදානම් කළමනාකරණ අංශය විසින් බදු ගෙවන ජනගහනයේ අනෙකුත් කොටස් සඳහා ද අතිරේක අනුකූලතා වැඩිදියුණු කිරීමේ සැලසුම් සම්පාදනය කරනු ඇත.

### 6.1.6 ඉහළ වත්කම් සහිත පුද්ගල අංශයක් ස්ථාපනය කිරීම

ඉහළ වත්කම් සහිත පුද්ගලයන් අධීක්ෂණය කිරීමේ දී සිදුවන අඩුපාඩු හඳුනා ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2023 වසරේ

දෙසැම්බර් මාසයේදී විශාල බදු ගෙවන්නන්ගේ කාර්යාලය තුළ ඉහළ වත්කම් සහිත පුද්ගල අංශයක් පිහිටුවන ලදී. මෙම උපායමාර්ගික මුලපිරීම මගින් මෙම අධිඅවදානම් ජනකොටස හා සම්බන්ධ බදු අනුකූලතාව පිළිබඳ අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් ලද මගපෙන්වීම ආමන්ත්‍රණය කරනු ලැබේ. වැඩිදියුණු කළ සම්පත් සහ විශේෂිත විශේෂඥතාවන්ගෙන් හෙබි ඉහළ වත්කම් සහිත පුද්ගල අංශය මගින්, ප්‍රගාමී නියැලීම තුළින් නිසි වේලාවට නිවැරදි බදු ගොනු කිරීම සඳහා පහසුකම් සලසමින්, ඉහළින්ම සිටින ඉහළ වත්කම් සහිත පුද්ගලයින් 100 දෙනාට ප්‍රමුඛත්වය ලබා දෙයි. ඊට අමතරව, ධනවත් බදුගෙවන්නන් හා බැඳී පවත්නා බදු අවදානම හඳුනාගෙන අඩු කිරීම සඳහා අවදානම් තක්සේරු කිරීමේ හා පූර්ව ගොනු කිරීමේ පූර්ණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරනු ඇත. නවීනතම දත්ත විශ්ලේෂණ ක්‍රම භාවිතය තුළින් විනිවිදභාවයට කැපවෙමින්, ඉහළ වත්කම් සහිත පුද්ගල අංශයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාව තුළ ශක්තිමත් මෙන්ම කාර්යක්ෂම බදු ක්‍රමයක් ඇති කරමින් සාධාරණ හා පාරදෘශ්‍ය බදු සංස්කෘතියක් ඇති කිරීම ය. සෞඛ්‍යය හා අධ්‍යාපනය වැනි අත්‍යවශ්‍ය පොදු සේවා සඳහා ආයෝජනය කිරීමට අවස්ථාව සලසමින්, වැඩි දියුණු කරන ලද ඉහළ වත්කම් සහිත පුද්ගල අනුකූලතාව මගින් රජයට සැලකිය යුතු තරමේ අතිරේක ආදායමක් උපයා දෙනු ලැබේ.

## 6.2 ප්‍රධාන කාර්යසාධන දර්ශක සහ ජයග්‍රහණ

### 6.2.1 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යසාධන දර්ශක

ප්‍රධාන කාර්ය සාධන දර්ශක යනු යම් සංවිධානයක් විසින් අත්කර ගැනීමට අපේක්ෂිත ප්‍රතිඵලවල ප්‍රගතිය දැක්වෙන තීරණාත්මක ප්‍රමාණාත්මක දර්ශක වේ. මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශක මගින් එම සංවිධානයේ උපාය මාර්ගික හා මෙහෙයුම් අභිවෘද්ධිය උදෙසා අවධානය යොමු කිරීම, තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා විශ්ලේෂණාත්මක පදනමක් සැපයීම මෙන්ම වඩාත්ම වැදගත් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමට සහාය වේ. ඒ අනුව, ප්‍රධාන කාර්ය සාධන දර්ශක මගින් සංවිධානයේ උපායමාර්ගික ඉලක්ක අත්කර ගැනීමේ ප්‍රගතිය මැන බැලීම සිදු කරයි.

#### 6.2.1.1 ආදායම් එකතු කිරීම

රුපියල් බිලියන 1,842.32ක මුළු බදු ආදායමක් එකතු කරමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2023 වසරේ දී ආදායම් එකතු කිරීම තුළ සුභවාදී වර්ධනයක් වාර්තා කළේය. එක් එක් බදු වර්ග යටතේ ඇති ආදායම ඊට අනුරූප ඇස්තමේන්තු සමග සසඳන විට මුළු ආදායම් එකතුව 105%ක ජයග්‍රාහී අගයක් පෙන්නුම් කරයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් එකතු කිරීම වත්මන් මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට 2023 වසරේ දී 6.67%කි. පෙර වසරට සාපේක්ෂව බදු ආදායමේ වර්ධනය 74.12% ක් වූ අතර රජයේ බදු ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය 67.72%කි.

#### 6.2.1.2 දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා සම්බන්ධිත පාර්ශ්වයන්ගේ දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පුළුල් ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව, බදු ප්‍රතිපත්ති වෙනස්වීම්, ඉලෙක්ට්‍රොනිකව වාර්තා ගොනු කිරීම් යනාදිය සම්බන්ධයෙන් ඔවුන් දැනුම්වත් කිරීම සඳහා වැඩසටහන් පවත්වා ඇත. වැඩසටහන් බොහොමයක් භෞතිකව පවත්වන ලද අතර වැඩි පිරිසකට සම්බන්ධ විය හැකි බැවින් සමහර වැඩසටහන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ද පවත්වන ලදී. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ වැඩසටහන් පැවැත්වීම නිසා භෞතිකව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ පිරිවැය ද අවම කර ගැනීමට හැකි විය. එමෙන්ම, දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා භෞතිකව සහභාගී විය නොහැකි බදු ගෙවන්නන්ට මෙම මාර්ගගත වැඩසටහන් සඳහා ඵලදායී ලෙස සම්බන්ධවීමට හැකි විය.

#### 6.2.1.3 බදු ලිපිගොනු විවෘත කිරීම

බදු ආදායම ඉහළ නැංවීම සඳහා, බදු පදනම පුළුල් කිරීම අත්‍යාවශ්‍ය ය. ඒ අනුව, තනි පුද්ගල ආදායම් බදු සඳහා ලියාපදිංචි කිරීමේ අවම සීමාව වර්ෂයකට රුපියල් මිලියන 3 සිට රුපියල් මිලියන 1.2 දක්වා

පහත දමන ලදී. කෙසේ වුවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් වසර තුළදී සියලුම බදු වර්ග යටතේ නව බදු ගෙවන්නන් 368,455ක් ලියාපදිංචි කර ඇත.

### 6.2.1.4 ඵලදායිතා අනුපාතය සහ බදු රැස් කිරීමේ පිරිවැය

බදු රැස් කිරීමේ පිරිවැය අවම කිරීම, අයවැය ප්‍රතිපත්තියෙහි වැදගත් පරමාර්ථයක් විය යුතු ය. බදු රැස් කිරීමේ පිරිවැය, ප්‍රාග්ධන පිරිවැය සහ පුනරාවර්තන පිරිවැය වශයෙන් ප්‍රභේද දෙකකට වෙන් කරනු ලැබේ. අත්‍යාවශ්‍ය ප්‍රාග්ධන පිරිවැය පමණක් දරන ලෙස රජය මගින් කළ දැනුම්දීම මත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන පිරිවැය සීමා කරන ලදී. කෙසේ වුවද, RAMIS 2.0 පද්ධතිය සඳහා කළ ගෙවීම හේතුවෙන් RAMIS ව්‍යාපෘතිය සඳහා දැරූ පිරිවැය රුපියල් බිලියන 3.1ක් විය. 2023 වර්ෂයේ ඵලදායිතා අනුපාතය 1:244ක් වූ අතර එයින් අදහස්වන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රුපියල් මිලියනයක් වියදම් කරන විට රුපියල් මිලියන 244ක බදු ආදායමක් රැස් කරන බවය. අනෙක් අතට, රුපියල් සියයක බදු ආදායමක් එකතු කිරීම සඳහා දළ වශයෙන් ශත 41ක පිරිවැයක් දැරීම මගින් 2023 වසරේ දී ආදායම එකතු කිරීමේ පිරිවැය අවම මට්ටමක පවත්වා ගැනීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හැකි වී ඇති බවය.

නිපැයුම්, හඳුනාගත් ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රතිශතයක් ලෙස 6.1 වගුවෙහි දැක්වේ.

**6.1 වගුව : 2023 වර්ෂයේ නිශ්චිත කාර්ය සාධන දර්ශක**

| සුවිශේෂී දර්ශක | සත්‍ය ප්‍රතිදානය අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස | | | |
|---|---|---|---|---|
| | >100% | 100%-90% | 75%-89% | 50%-74% |
| ආදායම් එකතු කිරීම | 105% | | | |
| දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 109% | | | |
| බදු ලිපිගොනු විවෘත කිරීම | 119% | | | |
| ඵලදායිතා අනුපාතය | 244% | | | |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශකවල සාරාංශය 6.2 වගුවේ දක්වා ඇත.

**6.2 වගුව : දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශකවල සාරාංශය**

| කාර්ය සාධන දර්ශකය | වටිනාකම |
|---|---|
| එකතු කරන ලද මුළු බදු ආදායම | රුපියල් බිලියන 1,842.32 |
| ආදායම් ඉලක්කයට සාපේක්ෂව ආදායම එකතු කිරීම | 105% (ඉලක්කය රුපියල් බිලියන 1,761.98කි) |
| බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 6.67% (රටේ දළ දේශීය නිෂ්පාදිතයට බදු අනුපාතය 9.84%) |
| බදු ආදායමේ වර්ධනය | 74.12% (ඉකුත් වර්ෂයේ රුපියල් බිලියන 1,058.08කි) |
| රජයේ බදු ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය | 67.72% (දේ.ආ.දෙ. රුපියල් ට්‍රිලියන 1.84, එකතුව රුපියල් ට්‍රිලියන 2.72කි) |
| වාර්තා අනුකූලතාව - සංස්ථාපිත ආදායම් බදු සඳහා ඉලෙක්ට්‍රොනිකව ගොනු කිරීමේ අනුපාතය (නියමිත දිනට) | 60% (විශාල සංස්ථාපිත බදු ගෙවන්නන්) |
| වාර්තා අනුකූලතාව - සංස්ථාපිත ආදායම් බදු සඳහා ඉලෙක්ට්‍රොනිකව ගොනු කිරීමේ අනුපාතය (නියමිත දින සිට මසක් ඇතුළත) | 94% (විශාල සංස්ථාපිත බදු ගෙවන්නන්) |
| වාර්තා අනුකූලතාව - සංස්ථාපිත ආදායම් බදු සඳහා ඉලෙක්ට්‍රොනිකව ගොනු කිරීමේ අනුපාතය (නියමිත දිනට) | 22% (වෙනත් සංස්ථාපිත බදු ගෙවන්නන්) |
| වාර්තා අනුකූලතාව - සංස්ථාපිත ආදායම් බදු සඳහා ඉලෙක්ට්‍රොනිකව ගොනු කිරීමේ අනුපාතය (නියමිත දින සිට මසක් ඇතුළත) | 33% (වෙනත් සංස්ථාපිත බදු ගෙවන්නන්) |
| වාර්තා අනුකූලතාව - තනි පුද්ගල ආදායම් බදු සඳහා ඉලෙක්ට්‍රොනිකව ගොනු කිරීමේ අනුපාතය (නියමිත දිනට) | 11% (තනි පුද්ගල බදු ගෙවන්නන්) |
| වාර්තා අනුකූලතාව - තනි පුද්ගල ආදායම් බදු සඳහා ඉලෙක්ට්‍රොනිකව ගොනු කිරීමේ අනුපාතය (නියමිත දින සිට මසක් ඇතුළත) | 14% (තනි පුද්ගල බදු ගෙවන්නන්) |

| | |
|---|---|
| වාර්තා අනුකූලතාව - තනි පුද්ගල ආදායම් බදු සඳහා සමස්ත ගොනු කිරීමේ අනුපාතය (නියමිත දිනට) | 25% (තනි පුද්ගල බදු ගෙවන්නන්) |
| වාර්තා අනුකූලතාව - තනි පුද්ගල ආදායම් බදු සඳහා සමස්ත ගොනු කිරීමේ අනුපාතය (නියමිත දින සිට මසක් ඇතුළත) | 37% (තනි පුද්ගල බදු ගෙවන්නන්) |
| ආයෝජන ප්‍රතිලාභය හෝ ඵලදායිතා අනුපාතය | 244 |
| ආදායම එකතු කිරීමේ පිරිවැය | රු. 100ට ශත 41ක් බැගින් |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

## 6.3 තිරසාර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය

දරිද්‍රතාවය මුලිනුපුටා දැමීම, පෘථිවිය ආරක්ෂා කිරීම හා සමතුලිත සමාජ, ආර්ථික සහ පාරිසරික තිරසරභාවය තුළින් 2030 වන විට සියලුම ලෝවැසි ජනතාවට සාමය හා සෞභාග්‍යය භුක්ති විඳීම තහවුරු කිරීම යන්න අරමුණු කර ගනිමින් වර්ෂ 2015 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දුන් තිරසාර සංවර්ධන අරමුණු නොහොත් ගෝලීය අරමුණු සියලුම සාමාජික රටවල් විසින් එම වසරේදීම පිළිගන්නා ලදී. සෑම සන්දර්භයක් තුළින්ම තිරසාර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා නිර්මාණශීලීත්වය, දැනුම, තාක්ෂණය සහ මූල්‍ය සම්පත් යනාදිය අත්‍යවශ්‍ය වේ.

සංවර්ධනය වෙමින් පවතින රටවල තිරසාර සංවර්ධන අභිමතාර්ථ කිහිපයක් සාක්ෂාත් කර ගැනීම සඳහා එම රටවල බදු පරිපාලනය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය සම්පත් එක් රැස් කර ගැනීම, අසමානතාව අවම කිරීම සහ ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ඵලදායී බදු ක්‍රම අත්‍යවශ්‍ය වේ.

2017 අංක 19 දරන තිරසාර සංවර්ධන අභිමතාර්ථ ඉලක්ක පනත ප්‍රකාරව රජයේ සියලුම පරිපාලන අස්ථිතීන් විසින් තිරසාර සංවර්ධන ඉලක්ක පවත්වාගෙන යා යුතුය.

වර්ෂය සඳහා ඉලක්කගත තිරසාර සංවර්ධන අභිමතාර්ථ 6.3 වන වගුවේ දක්වා ඇත.

**6.3 වගුව : තිරසාර සංවර්ධන අභිමතාර්ථ පදනම් කර ගත් දේශීය ආදායම් දෙපාර්තමේන්තු ක්‍රියාකාරකම්**

| අරමුණ / අභිමතාර්ථ | ඉලක්කය | අරමුණ සාක්ෂාත් කර ගැනීමේ දර්ශක | මේ දක්වා අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය (%) | | |
|---|---|---|---|---|---|
| | | | **0-49** | **50-74** | **75-100** |
| **ති.සං.අ. 01: සියලු ආකාරයේ දිළිඳු බව, සියලු තැන්හි ම දුරු කිරීම** | සියලුම මානයන්හි දරිද්‍රතාවය අවසන් කිරීම පිණිස වැඩසටහන් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ මූලාශ්‍රවලින් සැලකිය යුතු ලෙස සම්පත් එක් රැස් කිරීම සහතික කිරීම | දිළිඳුකම අවම කිරීමේ වැඩසටහන් සඳහා සෘජුවම රජය විසින් වෙන් කරන ලද දේශීය වශයෙන් ජනනය කරන ලද සම්පත්වල අනුපාතය | | | |
| | | අත්‍යවශ්‍ය සේවා (අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණය) සඳහා රජයේ මුළු වියදම්වල අනුපාතය | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **ති.සං.අ. 03: සෑම වයසකම සියලු දෙනාටම, සෞඛ්‍ය සම්පන්න දිවියක් තහවුරු කරන අතර යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම** | මත්ද්‍රව්‍ය අනිසි ලෙස භාවිත කිරීම සහ හානිකර මත්පැන් භාවිතය වැළැක්වීම සහ ප්‍රතිකාර කිරීම ශක්තිමත් කිරීම මෙන්ම යෝග්‍ය පරිදි සියලුම රටවල දුම්කොළ පාලනය පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ සම්මුතිය ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම | දුම්කොළ සහ මද්‍යසාර සඳහා ඉහළ බදු | | | |
| **ති.සං.අ. 05: ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කරමින් සියලු කාන්තාවන් හා ගැහැණු ළමුන් සවිබල ගැන්වීම** | ස්වාභාවික නීතිවලට අනුකූලව කාන්තාවන්ට ඉඩම් සහ අනෙකුත් දේපළ, මූල්‍ය සේවා, උරුමය සහ ස්වාභාවික සම්පත් පිළිබඳ අයිතිය සහ පාලනය සඳහා ප්‍රවේශය ලබා දීම මෙන්ම ආර්ථික සම්පත් සඳහා සමාන අයිතිවාසිකම් ලබා දීම සඳහා ප්‍රතිසංස්කරණ සිදු කිරීම | දේශීය ආදායම් පනතේ 52 වගන්තියේ දක්වා ඇති පරිදි බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේදී ලබා දුන් අඩු කළ හැකි සුදුසුකම් ලත් ගෙවීමක් | | | |
| **ති.සං.අ. 07: දැරිය හැකි, විශ්වසනීය, තිරසාර හා නවීන බලශක්ති ප්‍රවේශය සියලු දෙනා සඳහා තහවුරු කිරීම** | 2030 වන විට දැරිය හැකි මිලකට, විශ්වසනීය සහ නවීන බලශක්ති සේවාවන් සඳහා විශ්වීය ප්‍රවේශය සහතික කිරීම | පිරිසිදු බලශක්ති ආයෝජන දිරිගැන්වීම සඳහා ලබා දී ඇති බදු සහන | | | |
| **ති.සං.අ. 10: රටවල් තුළ හා රටවල් අතර අසමානතාව අවම කිරීම** | ලෝක වෙළඳ සංවිධානයේ ගිවිසුම්වලට අනුකූලව සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්, විශේෂයෙන් ම අවම සංවර්ධිත ආර්ථිකයන්, සඳහා විශේෂ මෙන්ම නා නා වෙනස්කම් සහිත විශේෂ සැලකීමේ මූලධර්මය ක්‍රියාත්මක කිරීම | උතුරු පළාතේ භාවිත වන ක්ෂය කළ හැකි වත්කම් සඳහා 200%ක වැඩි කළ ප්‍රාග්ධන දීමනා ලබා දීම | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **ති.සං.අ. 16: තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියලු දෙනා ඇතුළත් වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියළු දෙනාට ම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම සහ ඵලදායී, වගකීමක් සහිත හා පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම** | සෑම මට්ටමකදීම ඵලදායී, වගකියන සහ විනිවිද පෙනෙන ආයතන ඇති කිරීම | නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීම සහතික කිරීම සඳහා බදු පරිපාලනයේ සියලුම කාර්යයන් ස්වයංක්‍රීය කිරීම | | | |
| | | බදු පැහැර හරින්නන් සොයා දැන ගැනීමට සහ බදු පැහැර හරින්නන් එසේ කිරීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම පිණිස තුන්වන පාර්ශ්වයක දත්ත හුවමාරු කර ගැනීම සහ දත්ත විශ්ලේෂණ භාවිත කිරීම | | | |
| **ති.සං.අ. 17: තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය සහයෝගීතාව ක්‍රියාත්මක කළ හැකි විධික්‍රම හා නව පණගැන්වීම් ශක්තිමත් කිරීම** | බදු සහ අනෙකුත් ආදායම් එකතු කිරීම සඳහා වන දේශීය හැකියාව වැඩි දියුණු කිරීම සඳහා දේශීය සම්පත් එක් රැස් කර යෙදවීම ශක්තිමත් කිරීම | මුළු රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස | | | |
| | | දේශීය බදු මගින් අරමුදල් සපයන දේශීය අයවැයේ අනුපාතය | | | |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*



දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (වැඩ බලන)

07

පරිච්ඡේදය

# වසරේ මූල්‍ය කාර්ය සාධනය සහ අනුකූලතා වාර්තාව



# 7.1 මූල්‍ය කාර්ය සාධනය

ඒසීඒ-එෆ්

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු. | | සටහන | තත්‍ය 2023 රු. | 2022 රු. | |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | | |
| 863,500,000,000 | ආදායම් බදු | 1 | 911,355,309,961 | 534,020,830,117 | ඒසීඒ-1 |
| 897,984,000,000 | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | 920,919,135,824 | 509,168,047,125 | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| 500,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | 2,000,000,000 | |
| **1,761,984,000,000** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **1,832,274,445,785** | **1,045,188,877,242** | |
| | **ආදායම් නොවන ලැබීම්** | | **-** | - | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 14,702,732,880 | 16,558,013,981 | ඒසීඒ-3 |
| | තැන්පතු | | 11,245,307,443 | 10,942,129,319 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගිණුම් | | 162,790,739 | 138,262,302 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **26,110,831,061** | **27,638,405,602** | |
| | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,858,385,276,846** | **1,072,827,282,844** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 5,938,349,497 | 6,507,962,948 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **1,852,446,927,350** | **1,066,319,319,896** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | **-** | - | ඒසීඒ-2(ii) |
| 3,016,500,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 2,999,199,295 | 2,994,539,601 | ඒසීඒ-2(ii) |
| 1,656,800,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 1,396,201,293 | 1,051,713,428 | ඒසීඒ-2(ii) |
| 40,000,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 31,803,200 | 35,316,987 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **4,713,300,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **4,427,203,789** | **4,081,570,016** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **මූලධන වියදම්** | | | | |
| | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා | | | | |
| 352,000,000 | වැඩිදියුණු කිරීම් | **10** | 17,174,880 | 9,573,506 | |
| 9,453,400,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 3,086,317,455 | 4,595,212,844 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | - | **එසීඑ-2(ii)** |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| | හැකියා වර්ධනය | **14** | 8,801,269 | 26,738,852 | |
| 450,000,000 | | | | | |
| - | වෙනත් මූලධන වියදම් | **15** | - | - | |
| **10,255,400,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **3,112,293,604** | **4,631,525,202** | |
| | තැන්පතු ගෙවීම් | | 11,425,945,127 | 11,126,719,852 | **එසීඑ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 133,500,259 | 122,552,016 | **එසීඑ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **11,559,445,386** | **11,249,271,867** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **19,098,942,779** | **19,962,367,085** | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **1,833,347,984,571** | **1,046,356,952,810** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | 1,833,347,984,571 | 1,046,356,952,810 | **එසීඑ-7** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | **එසීඑ-3** |
| | | | **1,833,347,984,571** | **1,046,356,952,810** | |

## 7.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

ඒසීඒ-සී

**2023 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | | තතය | |
|---|---|---|---|
| | සටහන | 2023 | 2022 |
| | | රු. | රු. |
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 14,516,094,750 | 11,352,890,073 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 302,906,844 | 332,197,324 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **14,819,001,594** | **11,685,087,396** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (402,468,526) | (570,821,878) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 14,516,094,750 | 11,352,890,073 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | - |
| **<u>ජංගම නොවන වගකීම්</u>** | | | |
| මූල්‍ය කල්බදු | | 12,523,832 | 29,529,980 |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 692,851,537 | 873,489,222 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **14,819,001,594** | **11,685,087,396** |

පිටු අංක 07 සිට 43 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 44 සිට 56 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

............................................
කේ.එම්.මහින්ද සිරිවර්ධන

ලේකම් / ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දිනය : 27/02/24

කේ.එම්.එම්. සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

............................................
ඩබ්.ඒ.එස්.චන්ද්‍රසේකර

කොමසාරිස් ජනරාල්/ ගණන්දීමේ නිලධාරී

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

දිනය : 2024.02.21

ඩබ්.ඒ. සේපාලිකා චන්ද්‍රසේකර
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත
කොළඹ-02.

............................................
කේ.වී.එස්.ද සිල්වා

ප්‍රධාන මූල්‍ය නිලධාරී

දේශීය ආදායම්
දෙපාර්තමේන්තුව

දිනය : 2024/02/21

කේ.වී.එස්.ද සිල්වා
ප්‍රධාන මූල්‍ය නිලධාරී
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
කොළඹ - 02

## 7.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ඒසීඒ-සී

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | තතය | |
|---|---|---|
| | **2023**<br>රු. | **2022**<br>රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | - |
| මුළු බදු ලැබීම් | 1,553,438,481,285 | 861,264,646,244 |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 115,679,808 | 164,398,821 |
| අග්‍රිම ලැබීම් | 14,702,732,880 | 16,558,013,981 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 169,868,549 | 145,939,795 |
| තැන්පතු ලැබීම් | 10,773,803,452 | 10,287,570,619 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **1,579,200,565,973** | **888,420,569,460** |
| | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 4,382,996,844 | 4,039,481,294 |
| සහනාධාර සහ මාරුකිරීම් | 31,803,200 | 35,316,987 |
| බදු ආපසු ගෙවීම් එකතුව | 1,554,174,797,289 | 861,954,824,804 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 9,911,813 | 7,093,593 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 5,938,349,497 | 6,507,962,948 |
| අත්තිකාරම් ගෙවීම් | 132,238,742 | 123,729,792 |
| තැන්පතු ගෙවීම් | 11,425,940,069 | 11,126,526,363 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **1,576,096,037,453** | **883,794,935,781** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **3,104,528,520** | **4,625,633,678** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **-** | **-** |

| | | |
|---|---|---|
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| මූලධන වියදම් | 3,104,528,520 | 4,625,633,678 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **3,104,528,520** | **4,625,633,678** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(3,104,528,520)** | **(4,625,633,678)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඈ) + (ඊ)** | **(0)** | **0** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

## 7.4 මූල්‍ය ප්‍රකාශන සටහන්

**ඇමුණුම - (i)**

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

**(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)**

**වියදම් ශීර්ෂ අංකය:246** අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන**

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

| අගය | | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|---|
| රු | 25,000.00 | අඩු | | |
| රු | 25,000.01 | වැඩි | | |
| | එකතුව | | නැත | |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| එකතුව | නැත | |

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය

| අගය | | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|---|
| රු | 25,000.00 | අඩු | | |
| රු | 25,000.01 | වැඩි | | |
| | එකතුව | | නැත | |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| එකතුව | නැත | |

(ii) අනුව කාල විශ්ලේෂණය

| | | |
|---|---|---|
| වසර 5 ට අඩු | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | රු |
| වසර 5-10 | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | රු |
| වසර 10 ට වැඩි | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | රු |

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

**ඇමුණුම - (ii)**

<u>පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනය</u>

**වියදම් ශීර්ෂ අංකය : 246** අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය: **01** මෙහෙයුම් වැඩසටහන

1 **<u>වර්ෂය තුළ සිදුවූ මූ.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය</u>**

| | | සිද්ධි සංඛ්‍යාව | වටිනාකම (රු) |
|---|---|---|---|
| (i) | රු.25,000.00 අඩු | 2 | 32,600 |
| (ii) | රු.25,000.00 වැඩි | 5 | 670,121 |
| | එකතුව | **7** | **702,721** |

2 **<u>වර්ෂය තුළ මූ.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය</u>**

| | අලාභයේ ස්වභාවය | ආරම්භක කපා නොහල ශේෂය රු. | අලාභයේ වටිනාකම රු. | අයකර ගැනීම් රු. | පොතෙන් කපා හල අගය රු. | කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු. | පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය |
|---|---|---|---|---|---|---|---|
| **2019 වර්ෂයේ සිදු වූ අලාභ** | | | | | | | |
| 1 | CAD-0159 වාහන අනතුර | 1,676 | 1,676 | - | 1,676 | - | 2023.08.18 දින පොතෙන් කපා හැරීම සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලැබී ඇත. (IR/PAM/09/02/08/2019) |
| 2 | CAD-0046 වාහන අනතුර | 11,726 | 11,726 | - | 11,726 | - | 2023.07.21 දින පොතෙන් කපා හැරීම සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලැබී ඇත.(IR/PAM/09/02/15/2019) |
| 3 | CAC-9954 වාහන අනතුර | 838 | 838 | - | 838 | - | 2023.03.27 දින පොතෙන් කපා හැරීම සඳහා දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලැබී ඇත.(IR/PAM/09/02/19/2019) |
| 4 | CAD-0165 වාහන අනතුර | 15,636 | 15,636 | - | - | 15,636 | පොතෙන් කපා හැරීම සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇත.(IR/PAM/09/02/20/2019) |
| එකතුව | | **29,876** | **29,876** | **-** | **14,240** | **15,636** | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **2020 වර්ෂයේ සිදු වූ අලාභ** | | | | | | | |
| 5 | CAC-9941 වාහන අනතුර | 34,691 | 34,691 | - | 34,691 | - | 2023.03.10 දින පොතෙන් කපා හැරීම සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලැබී ඇත. (IR/PAM/09/02/08/2020) |
| එකතුව | | **34,691** | **34,691** | **-** | **34,691** | **-** | |
| **2022 වර්ෂයේ සිදු වූ අලාභ** | | | | | | | |
| 6 | CAD-0165 විශාල වාහන අනතුරු අලාභය | 3,475,000 | 3,475,000 | - | - | 3,475,000 | රක්ෂණ හිමිකම යටතේ අළුත්වැඩියාවන් අවසන් කර ගෙවීම් සඳහා යොමුකර ඇත.(IR/PAM/09/02/11/2021) |
| 7 | CAC-9951 වාහන අනතුර | 15,000 | 15,000 | - | - | 15,000 | අනතුර පිළිබඳ මූලික පරීක්ෂණය සිදු කෙරෙමින් පවතින අතර රක්ෂණාවරණය යටතේ අළුත්වැඩියාව සඳහා යොමුකර ඇත.(IR/PAM/09/02/08/2020) |
| 8 | CAC-9946 විශාල වාහන අනතුර | 4,346,250 | 4,346,250 | - | | 4,346,250 | අනතුර පිළිබඳ අවසන් පරීක්ෂණය සිදු කෙරෙමින් පවතින අතර රක්ෂණාවරණය යටතේ අළුත්වැඩියාව සඳහා දෙපාර්තමේන්තු අනුමැතිය ලැබී නොමැත. (IR/PAM/09/02/09/2022) |
| 9 | කුරුණෑගල ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථානයේ UPS උපකරණයක් ගින්නකින් දැවීයාමෙන් අලාභ හානි වීම | 1,000,000 | 1,000,000 | | | 1,000,000 | අනතුර පිළිබඳව අවසන් පරීක්ෂණය සිදු කෙරෙමින් පවතී. |
| එකතුව | | **8,836,250** | **8,836,250** | **-** | **-** | **8,836,250** | |
| **2023 වර්ෂයේ සිදු වූ අලාභ** | | | | | | | |
| 10 | CBI-0495 මෝටර් කාර් රථය අනතුරට පත්වීම. | - | 178,055 | 178,055 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ.(IR/PAM/09/02/01/2023) |
| 11 | 54-8662 මෝටර් වෑන් රථය අනතුරට පත්වීම. | - | 96,100 | 96,100 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ.(IR/PAM/09/02/02/2023) |
| 12 | NA-5667 මෝටර් වෑන් රථය අනතුරට පත්වීම. | - | 76,620 | 76,620 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ.(IR/PAM/09/02/03/2023) |
| 13 | CAD-0054 මෝටර් කාර් රථය අනතුරට පත්වීම. | - | 12,000 | 12,000 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ.(IR/PAM/09/02/05/2023) |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 14 | CBI-0493 මෝටර් කාර් රථය අනතුරට පත්වීම. | - | 83,950 | 83,950 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ.(IR/PAM/09/02/06/2023) |
| 15 | CBI-0487 මෝටර් කාර් රථය අනතුරට පත්වීම. | - | 20,600 | 20,600 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ.(IR/PAM/09/02/07/2023) |
| 16 | CBI-0486 මෝටර් කාර් රථය අනතුරට පත්වීම. | - | 235,396 | 235,396 | - | - | මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ.(IR/PAM/09/02/08/2023) |
| **එකතුව** | | - | **702,721** | **702,721** | - | - | |
| **මුළු එකතුව** | | **8,900,817** | **9,603,538** | **702,721** | **48,930** | **8,851,886** | |

සටහන - සටහන **(I)** හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

ඇමුණුම - (iv)

<u>බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (i)</u>

**මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනය**

**අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

**වියදම් ශීර්ෂ අංකය: 246**
**වැඩසටහන් අංකය හා නාමය: 01 මෙහෙයුම් වැඩසටහන**

| පුද්ගලයාගේ/ආයතනයේ නම | බැඳීම් පිළිබඳ විස්තරය | ව්‍යාපෘතිය | උප ව්‍යාපෘතිය | වැය විෂය සංකේතය | මූල්‍යකරණ සංකේතය | මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.) | මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.) | බැඳීම් හා බැරකම් වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| 1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු | | | | | | | | |
| එකතුව | | | | | | | | - |
| 2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල | | | | | | | | |
| එකතුව | | | | | | | | - |
| 3. වෙනත් (පෞද්ගලික අංශය) | | | | | | | | |
| Redwind International (PVT) Ltd. | Envelope | 1 | 1 | 1201 | 11 | 42,794,500 | 2,442,600 | 2,442,600 |
| Redwind International (PVT) Ltd. | Envelope | 1 | 1 | | 11 | | 6,416,250 | 6,416,250 |
| John Keells Office Automation (PVT) Ltd. | Service Agreement | 1 | 1 | 1302 | 11 | 72,919,167 | 1,500,630 | 1,500,630 |
| Apogee | PABX - H/O & R/O | 1 | 1 | | 11 | | 62,170,773 | 62,170,773 |
| Base HP | Hardware Items - FMRP | 1 | 1 | | 11 | | 41,166,253 | 41,166,253 |
| Arctic | AC - DC & DR | 1 | 1 | | 11 | | 522,646 | 530,921 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| Certis Lanka | CC TV - DC & DR | 1 | 1 | | 11 | | 492,718 | 492,718 |
| Techno E Solution | Access Control System - DC & DR | 1 | 1 | | 11 | | 1,181,694 | 393,898 |
| Tech one Global Lanka | Servers - DC & DR | 1 | 1 | | 11 | | 9,912,000 | 5,034,844 |
| Techno E Solution | Finger Print Machine Maintenance | 1 | 1 | | 11 | | 2,637,902 | 3,129,887 |
| CIVIMECH (PVT) Ltd | Central AC Maintenance - H/O | 1 | 1 | | 11 | | 4,444,524 | 440,000 |
| AG Melco | Passenger Elevators Maintenance - H/O | 1 | 1 | | 11 | | 1,152,446 | 1,018,833 |
| Trade Promoters | Generators Maintenance - H/O | 1 | 1 | | 11 | | 1,638,560 | 1,110,269 |
| Techno E Solution | PA System Maintenance - H/O & Scout Building | 1 | 1 | | 11 | | 162,000 | 81,000 |
| Open | Kitchen Equipment Maintenance - H/O | 1 | 1 | | 11 | | 2,220,000 | 2,220,000 |
| Jefco Centi (pvt) Ltd | AC Maintenance - Nawam Mawatha | 1 | 1 | | 11 | | 317,460 | 158,730 |
| Techno E Solution | Cabling & Accessories Maintenance & Repairs - Gampaha | 1 | 1 | | 11 | | 460,200 | 460,200 |
| Techno E Solution | Cabling & Accessories Maintenance & Repairs - Jaffna | 1 | 1 | | 11 | | 324,224 | 640,204 |
| n-eble | RAMIS Call Center | 1 | 1 | | 11 | | 45,253,000 | 45,253,000 |
| Finco Technologies | Maintenance (Lenovo 36551,Hp Compaq Elite 8300mt, Dell Optiptlex 990, Dell Optiptlex 5040) | 1 | 1 | | 11 | | 10,062,150 | 8,895,569 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| Base HP | Maintenance of Desktop (NEC MB-H) | 1 | 1 | | 11 | | 7,169,950 | 2,112,600 |
| Base HP | Maintenance of Desktop (NEC Power Mate) | 1 | 1 | | 11 | | 3,190,650 | 940,245 |
| Tech one Globale Lanka | E-mail Security Gateway | 1 | 1 | | 11 | | 7,329,636 | 9,820,101 |
| Sunil Weerasekara | Rent - Dambulla | 1 | 1 | 1404 | 11 | 55,092,333 | 11,280,000 | 2,820,000 |
| Fairway Development | Rent - Scout building | 1 | 1 | | 11 | | 80,388,000 | 6,699,000 |
| Orient Finance Plc | Rent - Kaluthara | 1 | 1 | | 11 | | 8,718,750 | 2,950,000 |
| U.C.Pathirana | Rent - Rathnapura | 1 | 1 | | 11 | | 12,600,000 | 3,850,000 |
| B.Sakuntaladevi | Rent - Jaffna | 1 | 1 | | 11 | | 4,500,000 | 125,000 |
| Rakna Arakshaka Lanka | Security Service | 1 | 1 | 1409 (037) | 11 | 25,765,000 | 75,919,378 | 17,707,885 |
| එකතුව | | | | | | | | **230,581,411** |
| **මුළු එකතුව** | | | | | | | | **230,581,411** |

ඇමුණුම - (v)

## බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (ii)

### මු.රෙ.215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන

**අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

**වියදම් ශීර්ෂ අංකය: 246**

**වැඩසටහන් අංකය හා නාමය: 01 මෙහෙයුම් වැඩසටහන**

| පුද්ගලයාගේ/ආයතනයේ නම* (ප්‍රතිපාදන මාරු කරන විට හඳුනාගෙන තිබිය යුතුය) | වගකීම් පිළිබඳ විස්තරය | ණයවර ලිපි අංක ආදිය | ප්‍රතිපාදන මාරු කරනු ලැබුවේ කුමන වැය ශීර්ෂයකින්ද | | | | තැන්පතු ගිණුම් අංකය | මාරුකරන ලද මුදල රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ව්‍යාපෘතිය | උප ව්‍යාපෘතිය | වැය විෂය සංකේතය | මූල්‍යකරණ සංකේතය | | |
| 1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු | | | | | | | | |
| .................................. | | | | | | | | XX |
| .................................. | | | | | | | | XX |
| එකතුව | නැත | | | | | | | |
| 2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල | | | | | | | | |
| .................................. | | | | | | | | XX |
| .................................. | | | | | | | | XX |
| එකතුව | නැත | | | | | | | |
| 3. වෙනත් (පෞද්ගලික අංශය) | | | | | | | | |
| .................................. | | | | | | | | XX |
| .................................. | | | | | | | | XX |
| එකතුව | නැත | | | | | | | |
| **මුළු එකතුව** | | | | | | | | |

ඇමුණුම – (vi)

<u>ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශනය</u>

**අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

**වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන**

| | | රු. |
|---|---|---|
| (1) | ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර යටතේ, පරිපූරක වෙන්කිරීම්ද ඇතුළුව 2023 ඇස්තමේන්තුගත වෙන්කිරීම් | නැත |
| (2) | ඉහත (1) ට අදාළ 2023 වර්ෂය තුළදී දරන ලද මුළු වියදම | ............................. |
| (3) | 2023 ජනවාරි 01 දිනට ලැබීමට නියමිත තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව | ............................. |
| (4) | 2022 හා ඊට පෙර වර්ෂවලට අදාළව, 2023 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව (ඇත්නම්) | ............................. |
| (5) | 2023 වර්ෂය සම්බන්ධයෙන් 2023 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව | ............................. |
| (6) | 2022 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් වූ හිමිකම්පෑම් සම්බන්ධයෙන් 2023 වර්ෂයේදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පෑම්වල එකතුව | ............................. |
| (7) | 2023 වර්ෂය සම්බන්ධයෙන් 2023 වර්ෂය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පෑම්වල එකතුව | ............................. |
| (8) | 2022 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් 2023 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල මුළු එකතුව | ............................. |
| (9) | 2023 වර්ෂය වෙනුවෙන් 2023 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල එකතුව | ............................. |
| (10) | 2023 දෙසැම්බර් 31 දිනට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව<br>{ (3+4+5) - (6+7) - (8+9) } | ............................. |
| (11) | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2023 වර්ෂය සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 31 දිනෙන් පසුව කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව | ............................. |
| (12) | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2023 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබුණු ප්‍රතිපූරණවල එකතුව | ............................. |
| (13) | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කරන ලද දිනට ලැබීමට නියමිතව ඇති ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව<br>(10 + 11 - 12) | ............................. |

ඇමුණුම - (vii)

## අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශනය

**අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

**වියදම් ශීර්ෂ අංකය: 246**

**වැඩසටහන් අංකය හා නාමය: 01 මෙහෙයුම් වැඩසටහන**

| දිනය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීමේ ස්වභාවය | ගණන (රු) |
|---|---|---|---|---|
| | | නැත | | |

**ඇමුණුම - (viii)**

**2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි**

**උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ**

**2023.12.31 දිනට තත්ත්ව වාර්තාව**

වියදම් ශීර්ෂ අංකය: 246

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

| අනු අංකය | බැංකුවේ නම | ගිණුම් අංකය | 2023.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.) | 2023.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.) | 2023.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්) | අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය |
|---|---|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | 7041552 | 94,623,502 | 0 | නැත | 2023 දෙසැම්බර් |
| 2 | ලංකා බැංකුව | 7041554 | 28,582,753 | 0 | නැත | 2023 දෙසැම්බර් |
| 3 | ලංකා බැංකුව | 7041561 | 435,100 | 0 | නැත | 2023 දෙසැම්බර් |
| 4 | ලංකා බැංකුව | 7041588 | 46,673,868 | 0 | නැත | 2023 දෙසැම්බර් |
| 5 | මහ බැංකුව | 50526 | 10,055,501 | 0 | නැත | 2023 දෙසැම්බර් |
| 6 | මහ බැංකුව | 50504 | 1,434,188 | 0 | නැත | 2023 දෙසැම්බර් |

## 7.5 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| ආදායම් කේතය | ආදායම් කේතය පිළිබඳ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | රැස් කළ ආදායම | |
|---|---|---|---|---|---|
| | | මූලික (රු. '000) | අවසාන (රු. '000) | ප්‍රමාණය (රු. '000) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| | ආදායම් බද්ද | | | | |
| **10.04.01.01** | ආදායම් බද්ද | **597,000,000** | **513,500,000** | **555,304,409** | **108%** |
| **10.04.01.02** | ලාභාංශ බද්ද | **2,000,000** | **2,000,000** | **46,887** | **2%** |
| **10.04.01.03** | ප්‍රේෂණ බද්ද | **4,000,000** | **4,060,000** | **1,667,666** | **42%** |
| **10.04.02.01** | උ.වි.ගෙ. | **100,000,000** | **150,000,000** | **144,954,799** | **97%** |
| **10.04.02.99** | වෙනත් | **115,000,000** | **40,000,000** | **48,533,060** | **121%** |
| **10.04.03.00** | රඳවා ගැනීමේ බද්ද | **90,000,000** | **150,000,000** | **157,910,831** | **105%** |
| 10.04.03.01 | පොලිය මත | 55,000,000 | 64,500,000 | 72,218,111 | 112% |
| 10.04.03.99 | ගාස්තු සහ වෙනත් මත | 35,000,000 | 85,500,000 | 85,692,720 | 100% |
| **10.04.04.00** | ආර්ථික සේවා ගාස්තු | | | **246,675** | |
| 10.04.04.01 | දේශීය | | | 234,523 | |
| 10.04.04.02 | ආනයන | | | 12,152 | |
| **10.04.05.00** | ප්‍රාග්ධන ලාභ බද්ද | **4,000,000** | **4,000,000** | **2,679,199** | **67%** |
| **10.04.06.00** | ස්වේච්ඡාවෙන් හෙළි දරවු කිරීම මත බද්ද | | | **11,784** | |
| | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | | | | |
| **10.02.01.00** | එකතු කළ අගය මත බද්ද | **908,000,000** | **680,500,000** | **694,460,230** | **102%** |
| 10.02.01.01 | මූල්‍ය සේවා | 85,000,000 | 88,000,000 | 88,528,787 | 101% |
| 10.02.01.02 | වෙනත් සේවා | 290,000,000 | 228,000,000 | 200,674,146 | 88% |
| 10.02.01.03 | නිෂ්පාදන | 178,000,000 | 144,000,000 | 179,904,493 | 125% |
| 10.02.01.04 | ආනයන | 355,000,000 | 220,500,000 | 225,352,804 | 102% |
| **10.02.02.00** | භාණ්ඩ හා සේවා බද්ද | | | **238** | |
| 10.02.02.01 | සේවා | | | 238 | |
| 10.02.02.02 | නිෂ්පාදන | | | | |
| 10.02.02.03 | ආනයන | | | | |
| **10.02.03.00** | ජාතික ආරක්ෂක බද්ද | | | **880** | |
| 10.02.03.01 | සේවා | | | 880 | |
| 10.02.03.02 | නිෂ්පාදන | | | | |
| 10.02.03.03 | ආනයන | | | | |
| **10.02.07.00** | මුද්දර ගාස්තු | | | | |
| **10.02.08.00** | හර බද්ද | | | | |
| **10.02.09.00** | පිරිවැටුම් බද්ද | | | **3,885** | |
| **10.02.12.00** | ජාතිය ගොඩනැගීමේ බද්ද | | | **328,082** | |
| 10.02.12.01 | සේවා | | | 44,176 | |
| 10.02.12.02 | නිෂ්පාදන | | | 23,940 | |
| 10.02.12.03 | ආනයන | | | 259,966 | |
| **10.02.16.00** | සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | **250,000,000** | **210,000,000** | **216,180,547** | **103%** |
| 10.02.16.01 | සේවා | 141,000,000 | 117,000,000 | 112,350,531 | 96% |
| 10.02.16.02 | නිෂ්පාදන | 45,000,000 | 45,000,000 | 52,564,897 | 117% |
| 10.02.16.03 | ආනයන | 64,000,000 | 48,000,000 | 51,265,118 | 107% |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **බලපත්‍ර බදු සහ වෙනත්** | | | | |
| 10.03.03.00 | ඔට්ටු හා සූදු බද්ද | 10,000,000 | 5,500,000 | 6,921,817 | **126%** |
| 10.03.04.00 | කොටස් ගනුදෙනු බද්ද | 6,000,000 | 1,980,000 | 2,477,737 | **125%** |
| 10.03.05.00 | ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | | | | |
| **10.03.07.00** | වෙනත් බලපත්‍ර | | | | |
| 10.03.07.11 | ණය ආපසු ගෙවීමේ බද්ද | | | 31,370 | |
| 10.03.09.00 | විදේශිකයන් සඳහා කල්බදු ලබා දී ඇති ඉඩම් මත බද්ද | | | | |
| 10.03.10.00 | විගමන බද්ද | 12,000 | 4,000 | 14,350 | **359%** |
| 10.03.11.00 | ප්‍රේෂණ ගාස්තුව | 1,000 | | | |
| 20.03.02.23 | කැසිනෝ බලපත්‍ර ගාස්තුව | | 500,000 | 500,000 | **100%** |
| | මුළු ආදායම | **2,086,013,,000** | **1,761,984,000** | **1,832,274,446** | **104%** |

* පළාත් සභා වෙත සම්පූර්ණයෙන් පැවරූ මුද්දර ගාස්තු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද යටතේ එකතු කර පළාත් සභාව වෙත පැවරූ 1/3 ක කොටස හැර

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

## 7.6 වෙන්කිරීම් ප්‍රයෝජනයට ගැනීමේ කාර්ය සාධනය

| වෙන්කිරීම් වර්ගය | වෙන්කිරීම් (රු. '000) | සත්‍ය වියදම (රු. '000) | වෙන්කිරීම් ප්‍රයෝජනයට ගැනීම අවසාන වෙන් කිරීමේ % ක් ලෙස |
|---|---|---|---|
| පුනරාවර්තන | 4,713,300 | 4,427,204 | 94% |
| ප්‍රාග්ධන | 10,255,400 | 3,112,294 | 30% |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

## 7.7 මු.රෙ. 208 ප්‍රකාරව අනෙකුත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවේ වැය සඳහා වන වෙන්කිරීම් ප්‍රදාන

| අනුක්‍රමික අංකය | වෙන්කිරීම් ලැබුනේ කුමන අමාත්‍යාංශයෙන්ද / දෙපාර්තමේන්තුවෙන්ද යන වග | වෙන්කිරීම් වල අරමුණු | වෙන්කිරීම් (රු. '000) | | සත්‍ය වියදම (රු. '000) | වෙන්කිරීම් ප්‍රයෝජනයට ගැනීම අවසාන වෙන් කිරීමේ % ක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මූලික | අවසාන | | |
| අදාළ නොවේ | | | | | | |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

## 7.8 මූල්‍ය - නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | සමීක්ෂණ මණ්ඩල වාර්තාව පරිදි 31.12.2023 වන දිනට ශේෂය (රු. '000) | මූල්‍ය තත්ව වාර්තාව අනුව 31.12.2023 වන දිනට ශේෂය (රු. '000) | ගිණුම්ගත කළ යුතු | වාර්තා කිරීමේ ප්‍රගතිය % ලෙස |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 2,765,390 | 2,765,390 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ සහ උපාංග | 633,662 | 633,662 | - | |
| 9153 | ඉඩම් | 2,081,300 | 2,081,300 | - | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 8,962,223 | 8,962,223 | - | |
| 9155 | ජෛව විද්‍යාත්මක වත්කම් | - | - | - | |
| 9160 | දැනට වැඩ කටයුතු කෙරීගෙන යන | - | - | - | |
| 9180 | කල්බදු වත්කම් | 73,520 | 73,520 | - | |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

## 7.9 විගණකාධිපති වාර්තාව

ඇමුණුම 08

## 7.10 අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ වන අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ / නොවේ) | අනුකූලතාවය නොදැක්වීම පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් | අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා යෝජිත නිරවද්‍ය කිරීමේ ක්‍රියාවන් |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර ඇත.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශය | අනුකූල වේ | | |
| 1.2 | රජයේ නිලධාරීන්ගේ ගිණුම සඳහා වන අත්තිකාරම් | අනුකූල වේ | | |
| 1.3 | වෙළඳ සහ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අනුකූල වේ | | |
| **2** | **පොත් සහ රෙජිස්ටර් නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 267/2018 ප්‍රකාරව ස්ථාවර වත්කම් රෙජිස්ටරය නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම . | අනුකූල වේ | | |
| 2.2 | පෞද්ගලික පඩිනඩි රෙජිස්ටරය / පෞද්ගලික පඩිනඩි කාඩ්පත් නිසි පරිදි නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.5 | සියළු මාසික ගිණුම් සාරාංශ (CIGAS) සකස් කර නියමිත දිනට භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් සහ මුදල් ඇණවුම් රෙජිස්ටරය නිසි පරිදි නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 2.7 | බඩු ලේඛන පොත් රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 2.8 | තොග රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 2.9 | අලාභ රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 2.10 | බැඳීම් රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් රෙජිස්ටරය (GA-N20) නඩත්තු කර යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| **3** | **මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පවරා දීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය අධිකාර බලය පවරා දීම. | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය අධිකාර බලය පවරා දීම පිළිබඳව ආයතනය තුළ සන්නිවේදනය කිරීම. | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා යන පරිදි මූල්‍ය අධිකාර බලය පවරා දීම. | අනුකූල වේ | | |
| 3.4 | අංක 171/2004 දරණ 2014.05.11 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, රජයේ පඩි සැකසීමේ මෘදුකාංග පැකේජය යොදා ගැනීමේදී ගණකාධිකාරිවරු විසින් මෙම අධිකාරි බලය පිළිපැදීම. | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සැකසීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලසුම සැකසීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම සැකසීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම සැකසීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකසා NBD වෙත නියමිත දිනට ඉදිරිපත් කිරිම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහයන්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත නියමිත වෙලාවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර ඇති සියළු විගණන විමසුම් සඳහා විශේෂිත කාල සීමාවක් තුළ පිළිතුරු සැපයීම. | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණන** | | | |
| 6.1 | මුදල් රෙගුලාසි 134(2) DMA /1-2019 ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ උපදේශනයන් ලබා ගැනීමෙන් අනතුරුව වර්ෂය ආරම්භයේදී අභ්‍යන්තර විගණන සැලසුම සැකසීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.2 | සියළුම අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මසක් ඇතුළත පිළිතුරු ලබා දීම. | අනුකූලවේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ (4)40 උපවගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටුව** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 ප්‍රකාරව වර්ෂය තුළ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් 04ක් වත් පැවැත්වීම. | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන ඡේදය ප්‍රකාරව මිලදී ගන්නා ලද සහ අපහරණය කරන ලද වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත භාර දීම. | අනුකූල වේ | | |
| 8.2 | ඉහත කී චක්‍රලේඛයේ 13 වන ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සුදුසු සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කිරීම. | අනුකූල වේ | | |
| 8.3 | අංක 05/2016 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පවත්වා අදාළ වාර්තා විගණකාධිපතිවරයා වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 8.4 | චක්‍රලේඛයේ විශේෂයෙන් දක්වා ඇති පරිදි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල හරහා අතිරික්ත හෝ අඩුපාඩු නිරාවරණය කර ගැනීම සහ කාලසීමාව තුළ ඒ හා සම්බන්ධ අනෙකුත් නිර්දේශ, ක්‍රියාකාරකම් | අනුකූල වේ | | |
| 8.5 | මු.රෙ.772 ප්‍රකාරව, පාවිච්චියට නුසුදුසු භාණ්ඩ ව්‍යාපහරණය කිරීම. | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | දෛනික ධාවන සටහන සහ සංචිත වාහන පිළිබඳ සාරාංශ සකස් කර විගණකාධිපතිවරයා වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 9.2 | පාවිච්චියට නුසුදුසු බව නිර්දේශ කිරීමෙන් පසු මාස හයකට අඩු කාල සීමාවක් තුළ පාවිච්චියට නුසුදුසු වාහන ව්‍යාපහරණය කිරීම. | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් නඩත්තු කිරීම සහ යාවත් කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104, 109 සහ 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 9.5 | අංක 30/2016 දරණ 2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ විධිවිධානයන් ප්‍රකාරව වාහන වල තෙල් පරිභෝජනය නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | | |
| 9.6 | කල් බදු කාල සීමාවෙන් පසු කල් බදු වාහන ලොග් පොත් වල අත්‍යන්ත හිමිකාරීත්වය පැවරීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳීම් ප්‍රකාශ සකස් කර , සහතික කර විගණනය සඳහා සූදානම් කරවීම. | අනුකූල වේ | | |
| 10.2 | සලකන ලද වර්ෂය යටතේ හෝ පෙර වර්ෂ වල පැවති නිෂ්ක්‍රීය ගිණුම් නිරවුල් කිරීම. | අදාළ නොවේ | | |
| 10.3 | ගැලපුම් සිදු කළ යුතු සහ මාසයක් තුළ එකී ශේෂ නිරවුල් කළ යුතු, බැංකු සැසඳීම් ප්‍රකාශයන් හරහා නිරාවරණය කරගත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගැනීම.** | | | |
| 11.1 | වෙන්කර ඇති ප්‍රතිපාදන සීමාව නොඉක්මවා වියදම් කිරීම. | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව වර්ෂය අවසානයේ ඉතුරු ප්‍රතිපාදන නොඉක්මවන බැරකම් | අනුකූල වේ | | |
| **12** | **රාජ්‍ය නිලධාරීන්ගේ ගිණුමට අත්තිකාරම්** | | | |
| 12.1 | සීමාවට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟ ණය සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් සිදු කිරීම. | අනුකූල වේ | | |
| 12.3 | එක් වසරකට වැඩි හිඟ ණය ශේෂ නිරවුල් කිරීම. | අනුකූල වේ | | |
| **13** | **පොදු තැන්පතු ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු ව්‍යාපහරණය සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතුව සහ පාලන රෙජිස්ටරය යාවත්කාලීන කර නඩත්තු කර ඇත. | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයෙහි මුදල් පොතේ ශේෂය TOD වෙත ප්‍රේෂණය කිරීම | අනුකූල වේ | | |
| 14.2 | කාර්යය සම්පූර්ණ කිරීමේ සිට මාසයක් ඇතුළත මු.රෙ. 371 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවීමේදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත් සමග මාසිකව සැසඳීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | රෙගුලාසි ප්‍රකාරව ආදායම් මහින් ආපසු ගෙවීම | අනුකූල වේ | | |
| 15.2 | එකතු කල ආදායම තැන්පතු ගිණුමට බැර නොකරමින්, සෘජුවම ආදායම් ගිණුමට බැර කිරීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ.176 ප්‍රකාරව ආපසු ලැබෙන හිඟ ආදායම් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 16.1 | අනුමත කාර්ය මණ්ඩලය ඇතුළත කාර්ය මණ්ඩලයට පඩි ගෙවීම | අනුකූල වේ | | |
| 16.2 | සෑම කාර්ය මණ්ඩල සාමාජිකයෙකුටම ලිඛිත රාජකාරි ලැයිස්තුවක් ලබා දීම | අනුකූල වේ | | |
| 16.3 | සෑම වාර්තාවක්ම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත, ඔවුන්ගේ අංක 04/2017 දරණ 2017.09.20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව භාර දීම. | අනුකූල වේ | | |
| **17** | **මහජනතාව වෙත තොරතුරු ලබා දීම.** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කිරීම සහ නිසි තොරතුරු රෙජිස්ටරයක් නඩත්තු කිරීම හා යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු වෙබ් අඩවි හෝ විකල්ප ක්‍රියා මාර්ග මඟින් මහජනතාව වෙත ලබා දීම සහ මෙම වෙබ් අඩවි හෝ විකල්ප ක්‍රියා මාර්ග මඟින් රාජ්‍ය අධිකාරියට එදිරිව මහජනයාට පැමිණිලි ඉදිරිපත් කිරීමට / ගුණාත්මකභාවය ඇගයීමට ඉඩ ප්‍රස්ථා ලබා දීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන සහ 10 වන වගන්තිය ප්‍රකාරව අර්ධ වාර්ෂික හෝ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 05/2008 සහ 05/2018(1) ප්‍රකාරව ආයතනය විසින් පුරවැසි ප්‍රඥප්තියක් / පුරවැසි සේවාලාභියාගේ ප්‍රඥප්තියක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම. | අනුකූල වේ | | |
| 18.2 | චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තිය / පුරවැසි සේවාලාභියාගේ ප්‍රඥප්තියක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමෝපායක් සකස් කිරීම. | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලසුම සැකසීම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 වන ඇමුණුමේ ආකෘතිය ප්‍රකාරව මානව සම්පත් සැලසුමක් සකස් කිරීම. | අනුකූල වේ | | |
| 19.2 | ඉහත කී මානව සම්පත් සැලසුම මඟින් කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම අවම ලෙස වසරට පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවන් සඳහා යොමු කිරීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත කී චක්‍රලේඛයේ ඇමුණුම 01 හි ආකෘතිය පදනම් කර ගනිමින් සමස්ථ කාර්ය මණ්ඩලයට වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් සඳහා අත්සන් කිරීම. | අනුකූල වේ | | |
| 19.4 | ඉහත කී චක්‍රලේඛයේ ඡේද අංක 6.5 ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කිරීම සහ මානව සම්පත් සංවර්ධන සැලසුම, ධාරිතා ඉහළ නැංවීමේ වැඩ සටහන් සංවිධාන කිරීම හා නිපුණතා සංවර්ධන වැඩසටහන් පවත්වාගෙන යාමේ වගකීම පැවරීම. | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද සඳහා ප්‍රතිචාර දැක්වීම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 20.1 | පෙර වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේදයන්හි පෙන්වා දී ඇති අඩුලුහුඩුකම් නිවැරදි කිරීම. | අනුකූල වේ | | |

08

පරිච්ඡේදය

# මානව සම්පත් පැතිකඩ



## 8.1 ශ්‍රම බලකාය පිළිබඳ විශ්ලේෂණය

ඕනෑම කාර්යක්ෂම හා ඵලදායී බදු පරිපාලනයක කොඳු නාරටිය මානව සම්පතයි. ගුණාත්මක සේවාවක් සැපයීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලය, නිසි පුහුණුව සහ පළපුරුදු පිරිස් රඳවා තබා ගැනීම ඉතා වැදගත් වේ. කෙසේ වෙතත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් සැලකිය යුතු අභියෝගවලට මුහුණ දෙයි. මෙම ගැටලුවල බලපෑම් විශ්ලේෂණය කිරීමෙන් වත්මන් කාර්ය මණ්ඩල හිඟය, පුහුණුව නොමැතිකම සහ වාර්ෂික ඉලක්ක සපුරා ගැනීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මුහුණ දෙන බාධාවන් පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා දෙයි.

2023 දෙසැම්බර් මස 31 දිනට පැවති තත්ත්වය අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විවිධ මට්ටම්වල නිලධාරීන්ගේ සැලකියයුතු හිඟය හමුවේ දුෂ්කරතාවන්ට මුහුණ දෙමින් සිටියි. අනුමත 1,229ක දේශීය ආදායම් සේවා නිලධාරී සංඛ්‍යාවෙන් තනතුරු 281ක හිඟයක් පවතී. එම පුරප්පාඩු ප්‍රමාණය ආසන්න වශයෙන් 23%ක් වේ. මෙම සේවක හිඟය හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පූර්ණ ධාරිතාවයෙන් යුතුව කාර්යයන් ඉටු කිරීමට සහ ස්වකීය වැඩ ප්‍රමාණය කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට බාධාවක් වේ. ඒකාබද්ධ සේවයට අයත් කාර්ය මණ්ඩලය පිළිබඳව සලකා බැලීමේ දී ද තත්ත්වය අභියෝගාත්මක වේ. ඒකාබද්ධ සේවයේ අනුමත 1,448ක සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු 176ක හිඟයක් පවතී. එම පුරප්පාඩු සංඛ්‍යාව ආසන්න වශයෙන් 12%කි. දෛනික බදු පරිපාලන කාර්යයන් සුමට ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා වැදගත් වන විවිධ සහායක කාර්යයන් කෙරෙහි මෙම හිඟය බලපායි.

නූතන බදු පරිපාලනයේ ඉතා වැදගත් සංරචකයක් වන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශය ද දුර්වල තත්ත්වයක පවතියි. මෙම අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 170ක් වන අතර එයින් සේවකයින් 42ක හිඟයක් පවතින අතර එය ආසන්න වශයෙන් 25%කි. මෙම හිඟයද ඵලදායී ලෙස බදු රැස්කිරීම සහ පරිපාලනය සඳහා තාක්ෂණය වැඩි වශයෙන් භාවිත කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පවතින හැකියාව කෙරෙහි බලපායි.

මීට අමතරව, මෑතකාලීනව පළපුරුදු නිලධාරීන් විශ්‍රාමයාම හේතුවෙන් සේවක හිඟය තවත් උග්‍ර වී තිබේ. ඔවුන්ගේ විශේෂඥ මෙන් ම ආයතනික දැනුම නායකත්වයේ මෙන් ම මගපෙන්වීමේ සැලකියයුතු අන්තරයක් නිර්මාණය කරයි. තවද, නඩත්තුව සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය කෙරෙහි දැඩි ලෙස බලපෑම් කරමින් සිවිල් ඉංජිනේරු තනතුර දීර්ඝකාලීනව පුරප්පාඩු තත්ත්වයේ පවතියි. මෙම පුරප්පාඩුව අත්‍යවශ්‍ය යටිතල පහසුකම් ව්‍යාපෘති සහ ප්‍රසම්පාදන කටයුතුවලට බාධා පමුණුවන අතර එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය කෙරෙහි බරපතළ ලෙස බලපායි.

එමෙන්ම, වර්තමාන කාර්ය මණ්ඩලය සඳහා පුහුණු අවස්ථා අඩුවීම මානව සම්පත් සංවර්ධනය සඳහා විශාල බාධාවකි. අඛණ්ඩ පුහුණුව, වෘත්තීය සංවර්ධනය, විකාශනය වන බදු ප්‍රතිපත්ති, තාක්ෂණික වැඩිදියුණුකිරීම් සහ බදු පරිපාලනයේ විශිෂ්ට භාවිතයන් ඉදිරියට පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ. ප්‍රමාණවත් පුහුණුවෙන් තොරව සංකීර්ණ බදු කටයුතු හැසිරවීම මගින් උසස් තත්ත්වයේ සේවයක් ලබාදීම සීමා වේ. එබැවින් මානව සම්පත් හිඟය සහ පුහුණු අවශ්‍යතා වැඩිදියුණු කිරීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සහ එහි උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කරගැනීම සම්බන්ධයෙන් අතිශයින් වැදගත් වේ.

## 8.2 කාර්යමණ්ඩල කළමනාකරණය

### 8.2.1 මුළු සේවක සංඛ්‍යාව

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය, තනතුරු දරණ සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව පහත වගුව මගින් දැක්වේ.

**8.1 වගුව : 2023.12.31 දිනට කාර්ය මණ්ඩලය**

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තනතුර දරන සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| **දේශීය ආදායම් සේවය** | **1,229** | **948** | **281** |
| කොමසාරිස් ජනරාල් | 1 | 0 | 1 |
| නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 9 | 5 | 4 |
| ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 22 | 11 | 11 |
| කොමසාරිස් | 90 | 33 | 57 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්/ නියෝජ්‍ය කොමසාරිස්/සහකාර කොමසාරිස් | 1,107 | 899 | 208 |

| | | | |
|---|---|---|---|
| **වෙනත් සේවා** | **1,639** | **1,414** | **225** |
| **ඒකාබද්ධ සේවය** | **1,448** | **1,272** | **176** |
| ප්‍රධාන මූල්‍ය නිලධාරී | 1 | 1 | 0 |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | 0 |
| අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| අධ්‍යක්ෂ (පරිපාලන) | 1 | 1 | 0 |
| ගණකාධිකාරී | 5 | 5 | 0 |
| පරිපාලන නිලධාරී | 3 | 2 | 1 |
| භාෂා පරිවර්තක | 9 | 9 | 0 |
| සංවර්ධන නිලධාරී | 7 | 7 | 0 |
| පුස්තකාලයාධිපති | 1 | 1 | 0 |
| සහකාර පුස්තකාලයාධිපති | 1 | 1 | 0 |
| කළමනාකරණ සේවා නිලධාරී | 925 | 854 | 71 |
| රියදුරු | 96 | 80 | 16 |
| කාර්යාල සේවක සේවය | 397 | 309 | 88 |
| **තොරතුරු තාක්ෂණ සේවය** | **170** | **128** | **42** |
| අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 2 | 2 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 16 | 9 | 7 |
| නිලධාරී (තොරතුරු තාක්ෂණ) | 47 | 20 | 27 |
| සහායක (තොරතුරු තාක්ෂණ) | 105 | 97 | 8 |
| **දෙපාර්තමේන්තු සේවය** | **20** | **14** | **6** |
| තාක්ෂණ නිලධාරී | 2 | 0 | 2 |
| ප්‍රවාහන නිලධාරී | 1 | 1 | 0 |
| පිළිගැනීමේ නිලධාරී | 4 | 3 | 1 |
| පර්යේෂණ සහකාර | 10 | 9 | 1 |
| ගොඩනැගිලි අධීක්ෂක | 1 | 0 | 1 |
| වඩු කාර්මික | 1 | 1 | 0 |
| සංචාරක බංගලා භාරකරු | 1 | 0 | 1 |
| **වෙනත්** | **1** | **0** | **1** |
| ඉංජිනේරු | 1 | 0 | 1 |
| **එකතුව** | **2,868** | **2,362** | **506** |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 8.2.2 පරිපාලන අභියෝග

බඳු පරිපාලනයේ ව්‍යාකූලතා ඇති කරමින් ප්‍රධාන තනතුරුවල පුරප්පාඩු පිරවීමේ ප්‍රමාදවීම් හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සැලකියයුතු පරිපාලන අභියෝගවලට මුහුණ පා තිබේ. 2023 අගෝස්තු මස 27 වන දින දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් බී.ආර්.එස්. හපුආරච්චි මහතා විශ්‍රාම යාමෙන් අනතුරුව 2023 අගෝස්තු මස 28 වන දින සිට 2023 දෙසැම්බර් මස 31 වන දින දක්වා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයෙකු වැඩබලන කොමසාරිස් ජනරාල්වරයා වශයෙන් පත්විය. නායකත්ව තනතුරුවල ස්ථාවරත්වයේ සහ නිශ්චිතභාවයේ ඌනතාව, උපාමාර්ගික තීරණ ගැනීමේ සහ මෙහෙයුම් ඵලදායීතාවට බාධාවක් වේ.

මීට අමතරව, මූලික වශයෙන් ප්‍රධාන පුරප්පාඩු පිරවීමේ ප්‍රමාද සහ ජ්‍යෝෂ්ඨ රජයේ නිලධාරීන්ට යම් විශේෂ දීමනා ගෙවීම සම්බන්ධයෙන් අදාළ කරගනු ලබන චක්‍රලේඛ අදාළ කරගැනීම සම්බන්ධයෙන් පවතින ව්‍යාකූලතා හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මානව සම්පත් කළමනාකරණයේ දී පරිපාලන අභියෝග රැසකට නිරන්තරයෙන් මුහුණු පා තිබේ. 2023 වර්ෂය අවසානයේ දී ජ්‍යෝෂ්ඨ කොමසාරිස්වරුන් සිව් දෙනෙකු නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් තනතුරේ ද , කොමසාරිස්වරුන් එකොළොස් දෙනෙකු ජ්‍යෝෂ්ඨ කොමසාරිස් තනතුරේ ද, ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරුන් පනස් හත් දෙනෙක් කොමසාරිස් තනතුරේ ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව වැඩ බලන ලදී. මෙම වැඩබලන තනතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අඛණ්ඩ ක්‍රියාකාරීත්වය තහවුරු කිරීමට අත්‍යවශ්‍ය විය. කෙසේනමුත්, මෙම තනතුරුවල වැඩබලන ලද නිලධාරීන්ට අදාළ තනතුරුවලට නියමිත සමහර දීමනා නොලැබුණ අතර ඒ හේතුවෙන් එම නිලධාරීන් තුළ අසතුටුබවක් නිර්මාණය විය.

අදාළ ප්‍රතිලාභ නොලැබ දීර්ඝකාලීනව තනතුරුවල වැඩබැලීම සේවක අභිප්‍රේරණය කෙරෙහි ඍණාත්මක ලෙස බලපා තිබේ. වැඩබලන තනතුරුවල පූර්ණ කාලීන රාජකාරිවල නිරත නිලධාරීන් වැඩබලන තනතුරු සඳහා අදාළ චක්‍රලේඛ අදාළ කර ගැනීමේ ව්‍යාකූලතාවන් හේතුවෙන් මෙම වැඩබලන භූමිකාවන්හි පූර්ණ කාලීන රාජකාරි කරන නිලධාරීන්ට නිත්‍ය තනතුරුවලට අදාළ වරප්‍රසාද ලැබී නොමැත. මෙම තත්ත්වය කාර්ය මණ්ඩලය අතර අපේක්ෂා විරහිත බවක් සහ අභිප්‍රේරණය හීන වීමක් සිදු වීමට බලපා ඇති අතර ඔවුන්ට ස්වකීය ප්‍රයත්න ප්‍රමාණවත් ලෙස පිළිගැනීම හෝ ගෙවීම් කිරීම සිදුනොවන බව හැඟේ. මෙම ගැටලුව දිගුකාලීනව පවතින අතර ගෙවුණු කාලය තුළ නිලධාරීන් විශ්‍රාම ගැනීමෙන් පසුව වුවද සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවූ අවස්ථාද තිබිණි. මේ අනුව විශේෂයෙන්ම ජ්‍යෝෂ්ඨ කළමනාකාරීත්ව මට්ටම්වල පත්වීම් විධිමත් කිරීමේ ප්‍රමාදවීම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යක්ෂමතාවට අහිතකර බලපෑමක් ඇති කරයි.

ඉහත සඳහන් තත්ත්වයන් තුළ බදු පරිපාලනයේ සාධනීය ක්‍රියාකාරිත්වය උදෙසා කාලීනව අවශ්‍ය පත්වීම් ලබා දීම ඉතා වැදගත් වේ. ප්‍රධාන තනතුරු කඩිනමින් පුරවා ඇති බව සහතික කිරීම මෙහෙයුම් කටයුතුවලට බාධා ඇතිවීම වලක්වන අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවා කාර්යක්ෂමව සිදු කිරීමට ඇති හැකියාව ඉහළ නංවයි. පත්වීම් විධිමත් කිරීම සහ වැඩබලන භූමිකාවන්හි නිරත නිලධාරීන්ට සුදුසු දීමනා සහ ප්‍රතිලාභ ලබා දීම චිත්ත ධෛර්යය සහ අභිප්‍රේරණය ඉහළ නැංවීමට පමණක් නොව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පළපුරුදු සහ දක්ෂ නිලධාරීන් රඳවා තබා ගැනීමට හැකි බව සහතික කරයි. පුරප්පාඩු පිරවීමේ ප්‍රමාදවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ ස්ථාන මාරු සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යක්ෂමතාව සහ සඵලතාව වැඩිදියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය පියවර වේ.

එබැවින්, සේවක අභිප්‍රේරණය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු පිරවීමේ පරිපාලන දුෂ්කරතා සහ ප්‍රමාදයන් සම්න්ධයෙන් නිසි පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ. අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම, නියමිත වේලාවට පත්වීම් ලබාදීම සහතික කිරීම සහ අදාළ චක්‍රලේඛ උපයෝගී කරගැනීම පැහැදිලි කිරීම වැඩබලන නිලධාරීන්ගේ උත්සාහය නිසි ලෙස හඳුනා ගැනීමට උපකාරී වේ. තවද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ස්ථාන මාරු සම්බන්ධ ගැටලු විසඳීම දෙපාර්තමේන්තුව තුළ අඛණ්ඩතාව සහ විශේෂඥතාව පවත්වා ගැනීම සඳහා ඉතා වැදගත් වේ. මෙම පියවර මනා ලෙස අභිප්‍රේරණය වූ ශ්‍රම බලකායක් සහ වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී දෙපාර්තමේන්තුවක් සඳහා දායක වී අවසානයේ දී රටේ බදු පරිපාලනය ශක්තිමත් කරනු ඇත.

**8.2 වගුව : 2023.12.31 දිනට කාර්ය මණ්ඩල සාරාංශය**

| සේවා මට්ටම | අනුමත කාර්ය මණ්ඩලය | සේවයේ නිරත සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 1,257 | 968 | 289 |
| තෘතීයක | 60 | 32 | 28 |
| ද්විතීයක | 1,055 | 972 | 83 |
| ප්‍රාථමික | 496 | 390 | 106 |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

ඉහත වර්ගීකරණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/2017ට අනුකූල වන අතර බැලූ බැල්මට එමගින් ලබාදෙන රූපය විකෘති ආකාරයේ වේ. කෙසේ නමුත් කළමනාකරණ දෘෂ්ටිකෝණයෙන් බලන කළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය කොමසාරිස් ජනරාල්, නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරුන් සහ ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරුන්ගෙන් සමන්විත වේ. කොමසාරිස්වරුන් මෙහෙයුම් කළමනාකරණ මට්ටමේ කණ්ඩායම් නායකයින් වේ.

### 8.2.3 පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා ගන්නා ලද පියවර

#### 8.2.3.1 ජ්‍යෙෂ්ඨ මට්ටම

නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්, ජ්‍යෙෂ්ඨ කොමසාරිස් සහ කොමසාරිස් තනතුරුවල පවතින සියලුම පුරප්පාඩු සඳහා වැඩ බැලීමේ පදනම මත රාජකාරී ආවරණය සඳහා නිලධාරීන් පත් කොට ඇත.

ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ විශේෂ ශ්‍රේණියේ පත්කිරීම් සඳහා වන සම්මුඛ පරීක්ෂණ 2023 වර්ෂයේ දී පැවැත්විණි.

2022 මාර්තු මස පවත්වන ලද විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් 68 දෙනෙකු සඳහා සම්මුඛ පරීක්ෂණ 2023 නොවැම්බර් මාසයේදී පැවැත්විණි. ඒ අනුව අයදුම්කරුවන් 62ක් දේශීය ආදායම් සේවයේ සහකාර කොමසාරිස් තනතුර සඳහා පත් කිරීමට තෝරා ගන්නා ලදී.

දෙපාර්තමේන්තුවේ මේ වන විට පුරප්පාඩු වී පවතින ඉංජිනේරු, නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) සහ සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) තනතුරු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුම්වත් කර තිබේ.

#### 8.2.3.2 තෘතීයක මට්ටම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන්ගේ පවතින පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය දැනුම්වත් කර තිබේ.

8.2.3.3 ද්විතීයක මට්ටම
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර, කළමනාකරණ සේවා නිලධාරී තනතුරුවල පවතින පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය නිරන්තරයෙන් (මාසිකව) දැනුම්වත් කරනු ලැබේ.

රජයේ ප්‍රතිපත්තියක් අනුව සියලු බඳවා ගැනීම් නැවත දැනුම් දෙන තෙක් අත්හිටුවා ඇති අතර පිළිගැනීමේ නිලධාරී තනතුරේ පුරප්පාඩු පිරවීම තාවකාලිකව අත්හිටුවා ඇත. දැනට සේවයේ යෙදී සිටින නිලධාරීන් මගින් එකී පිළිගැනීමේ නිලධාරී තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා පියවර ගෙන ඇත.

8.2.3.4 ප්‍රාථමික මට්ටම
රියැදුරු සහ කාර්යාල සේවක සේවය යන සේවා තුළ පවතින පුරප්පාඩු පිරවීම පිළිබඳව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය දැනුම්වත් කොට ඇත.

ගොඩනැගිලි පරීක්ෂක තනතුරු සඳහා බඳවා ගැනීමේ ක්‍රමවේදය කෙටුම්පත් කොට අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇත.
සංචාරක බංගලා භාරකරුගේ රාජකාරි තාවකාලිකව දැනට නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ කාර්යාල සේවක සේවයේ නිලධාරීන් ලවා ආවරණය කර ගැනීමට පියවර ගෙන ඇත.

## 8.2.4 2023 වර්ෂය තුළ උසස්වීම්

වර්ෂය තුළ ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරුන් 6 දෙනෙක් නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරුන් වශයෙන් ද කොමසාරිස්වරුන් 13 දෙනෙක් ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරුන් වශයෙන් ද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරුන් 26 දෙනෙක් කොමසාරිස්වරුන් වශයෙන් ද උසස්වීම් ලැබූහ. උසස්වීම් ලද නිලධාරීන්ගේ විස්තර ඇමුණුම 09හි දැක්වේ.

## 8.2.5 2023 වර්ෂය තුළ විශ්‍රාමයාම්

2023 වර්ෂයේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය උදෙසා දායකත්වය දක්වන ලද දේශීය ආදායම් සේවයේ පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විශ්‍රාම යන ලදී.

8.3 වගුව : 2023 වර්ෂය තුළ විශ්‍රාමයාම්

| නම | තනතුර | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| 1 ඩී.ආර්.එස්. හපුආරච්චි මයා | කොමසාරිස් ජනරාල් | 1987.09.14 | 2023.08.27 |
| 2 ටී. රාජපක්ෂ මයා | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 1991.03.01 | 2023.01.07 |
| 3 කේ.ඩී.එම්.එන්. ගුණතුංග මයා | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 1991.03.01 | 2023.01.13 |
| 4 ආර්.ඒ.එන්. රාජපක්ෂ මයා | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 1987.09.08 | 2023.01.23 |
| 5 එස්.එස්.ඩී. වීරසේකර මයා | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 1991.03.01 | 2023.01.29 |
| 6 එම්.එල්.එම්. තාහීර් මයා | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 1987.09.14 | 2023.05.16 |
| 7 එස්.එම්.ඒ. බණ්ඩාර මයා | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 1993.01.01 | 2023.05.30 |
| 8 එන්.එම්.එම්. මිෆ්ලි මයා | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 1993.01.01 | 2023.07.21 |
| 9 එම්. ගනේෂරාජා මයා | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 1993.07.01 | 2023.10.11 |
| 10 ඩබ්ලිව්.එස්. තිලකරත්න මයා | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් (වැ.බ.) | 1993.08.02 | 2023.08.10 |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

8.4 වගුව මගින් වර්ෂය තුළ වෙනත් තනතුරුවල විශ්‍රාමයාම් දැක්වේ.

**8.4 වගුව : වෙනත් විශ්‍රාමයාම්**

| තනතුර | විශ්‍රාමික සංඛ්‍යාව |
|---|---|
| කොමසාරිස් | 04 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | 10 |
| සහකාර කොමසාරිස් | 05 |
| පරිපාලන නිලධාරී | 01 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 |
| සංවර්ධන නිලධාරී | 01 |
| කළමනාකරණ සේවා නිලධාරී | 16 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 05 |
| රියදුරු | 11 |
| කාර්යාල සේවක සේවයේ නිලධාරී | 12 |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 8.2.6 වයස අනුව සේවක වර්ගීකරණය

8.5 වගුව සහ 8.1 සටහන මගින් දේශීය ආදායම් සේවයේ නිලධාරීන්ගේ වයස අනුව වර්ගීකරණය දැක්වේ.

**8.5 වගුව : වයස අනුව දේශීය ආදායම් සේවයේ නිලධාරී වර්ගීකරණය**

| වයස් කණ්ඩායම (අවුරුදු) | 2023.12.31 දිනට නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| 25 - 30 | - |
| 31 - 40 | 32 |
| 41 - 50 | 605 |
| 51 - 60 | 311 |
| **මුළු සංඛ්‍යාව** | **948** |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**සටහන 8.1 : වයස අනුව දේශීය ආදායම් සේවයේ නිලධාරී වර්ගීකරණය**




*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

## 8.3 මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විවිධ ජාතික හා අන්තර්ජාතික ප්‍රභව මගින් පුහුණු අවශ්‍යතා වැඩිදියුණු කරයි. විශේෂයෙන් ම ජපානය, ඉන්දියාව සහ චීනය ආදී රටවල් මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ආදී විශිෂ්ට ජාත්‍යන්තර සංවිධාන විස්තීර්ණ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. මෙම වැඩසටහන් බදු නිලධාරීන්ට ගෝලීය විශිෂ්ට භාවිතයන් සහ සම්මතයන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා සකස් කර තිබේ.

කෙටි කාලීන පුහුණු වැඩසටහන්වලට අමතරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ස්වකීය සේවකයින්ට ශාස්ත්‍රපති උපාධිය ඇතුළත්ව පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා අනුග්‍රහය දක්වයි. මෙම සන්දර්භයෙහි සුවිශේෂී ලක්ෂණය වන්නේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය විසින් ප්‍රදානය කරනු ලබන රැකියාව ආශ්‍රිත විශේෂ බදුකරණය පිළිබඳ පශ්චාත් උපාධියයි. මෙම පාඨමාලාව දකුණු ආසියානු කලාපයට ම අනන්‍ය වූ අධ්‍යයන පාඨමාලාවක් වන අතර බදු නිලධාරීන්ගේ වෘත්තීය භූමිකාව තුළ ඍජුවම භාවිත වන බදු පිළිබඳ උසස් දැනුම සහ කුසලතා සපයන පාඨමාලාවක් ලෙස මෙය ඔවුන් සඳහා ම නිර්මාණය කර තිබේ.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය රජයේ සේවකයින් සඳහා විශේෂිත සහ සාමාන්‍ය පුහුණු සැසි පවත්වන අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට මෙම දෙපාර්තමේන්තුව විසින් අනුග්‍රහය දක්වනු ලැබේ. තවද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන අංශය තමන්ගේම පුහුණු පාඨමාලා සහ පන්ති සංවිධානය කරයි. උසස්වීම් සඳහා අවශ්‍ය අනිවාර්ය විභාග සඳහා සේවකයින් සූදානම් කිරීම සහ සේවා ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි සේවයේ ස්ථිරත්වය ලබා ගැනීම මෙම පාඨමාලාවන්හි අරමුණයි. මෙම ව්‍යුහගත ප්‍රවේශය මගින් සේවකයින් හොඳින් සූදානම් වී ඇති අතර ආයතනය තුළ වෘත්තීය දියුණුව සඳහා සුදුසුකම් ලබා ඇති බව සහතික කරයි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සිය කාර්ය මණ්ඩලය සඳහා පුළුල් පුහුණු අවස්ථා ලබා දෙන අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කාර්ය මණ්ඩලය සඳහා අදාළ පුහුණු අවස්ථා ලබාදීම සාපේක්ෂව දුර්ලභ බව සඳහන් කළ යුතුය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පරිපාලනය, කාර්යක්ෂමතාව, දත්ත කළමනාකරණය සහ ඩිජිටල්කරණ ක්‍රියාවලීන් සඳහා උපකාර කරමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන බැවින් මෙම පරතරය පියවීම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

### 8.3.1 2023 වර්ෂයේදී පවත්වන ලද දේශීය සහ විදේශීය මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

2023 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් පවත්වන ලද මානව සම්පත් සංවර්ධන වැඩසටහන් 8.6 වගුව මගින් දැක්වේ.

**8.6 වගුව : දේශීයව පවත්වන ලද මානව සම්පත් සංවර්ධන වැඩසටහන්**

| අංකය | පාඨමාලාවේ නම | සහභාගීවූ සංඛ්‍යාව | ආයෝජනය (රු.) | අරමුදල් සැපයීම |
|---|---|---|---|---|
| 1 | දත්ත විශ්ලේෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - කැලණිය විශ්වවිද්‍යාලය | 2 | 800,000 | ශ්‍රී ලංකා රජය |
| 2 | Advanced MS Excel කුසලතා පිළිබඳ වැඩමුළුව | 5 | 65,000 | ශ්‍රී ලංකා රජය |
| 3 | තොරතුරු තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - කැලණිය විශ්වවිද්‍යාලය | 1 | 225,000 | ශ්‍රී ලංකා රජය |
| 4 | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - රුහුණු විශ්වවිද්‍යාලය | 1 | 100,000 | ශ්‍රී ලංකා රජය |
| 5 | රජයේ වාහන නඩත්තුකිරීම | 1 | 5,000 | ශ්‍රී ලංකා රජය |
| 6 | රජයේ නිලධාරීන්ගේ වැටුප් සැකසීම | 1 | 5,000 | ශ්‍රී ලංකා රජය |
| 7 | විනය කාර්යපටිපාටිය | 1 | 5,000 | ශ්‍රී ලංකා රජය |
| 8 | පෞද්ගලික ලිපිගොනු ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම | 1 | 5,000 | ශ්‍රී ලංකා රජය |
| 9 | ජනසන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය- කැලණිය විශ්වවිද්‍යාලය | 19 | 1,140,000 (1වන වාරිකය) | ශ්‍රී ලංකා රජය |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

2023 වර්ෂයේදී විදේශීය මානව සම්පත් සංවර්ධන වැඩසටහන් 22ක් පවත්වන ලද අතර මෙම වැඩසටහන් සඳහා නිලධාරීන් 47 දෙනෙකු සහභාගී විය. විදේශීය මානව සම්පත් සංවර්ධන වැඩසටහන් පිළිබඳ සම්පූර්ණ විස්තර ඇමුණුම 10 හි දක්වා තිබේ.

### 8.3.2 2023 වර්ෂය තුළ දේශීය ආදායම් සේවයේ නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු පන්ති සහ පරීක්ෂණ

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන ඒකකය සහකාර කොමසාරිස්වරුන් සහ නියෝජ්‍ය කොමසාරිස්වරුන් සඳහා පුහුණු පාඨමාලා සහ පරීක්ෂණ විධිමත්ව පවත්වනු ලැබුවේ ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ විශ්ලේෂණ කුසලතා, විශේෂයෙන් බදුකරණය සහ ගණකාධිකරණය වැඩිදියුණු කිරීමේ අරමුණ පෙරදැරිවයි. මෙම පාඨමාලා සැලසුම් කර ඇත්තේ අදාළ ශ්‍රේණිවල සේවයේ ස්ථිරකිරීම් සහ උසස්වීම් සඳහා නිලධාරීන්ගේ විවිධ සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය විෂයයන් පිළිබඳ පුහුණුව ලබාදීමට සහ රාජකාරි ඉටුකිරීම සඳහා දැනුම ලබාගැනීම සඳහාය. වසර තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු සහ පරීක්ෂණ පිළිබඳ විස්තර පහත පරිදි විය.

**8.7 වගුව : 2023 වර්ෂයේ දි දේශීය ආදායම් සේවයේ නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු පන්ති සහ පරීක්ෂණ**

| පාඨමාලාව/පරීක්ෂණය | පැවැත්වුණු කාලසීමාව | පුහුණුවූ සංඛ්‍යාව |
|---|---|---|
| 2018 ජූලි මස 16 දින පත්වීම් ලද සහකාර කොමසාරිස්වරුන් සඳහා දෙපාර්තමේන්තු ගත විභාගය සඳහා පවත්වන ලද සම්මන්ත්‍රණ - 1 වන වර පෙනීසිටීම | සම්පූර්ණ වර්ෂය | 30 |
| 2017.03.04, 2018.10.27, 2021.05.23 සහ 2023.11.18 දිනවල පත්වීම් ලද නියෝජ්‍ය කොමසාරිස්වරුන් සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා පැවැත්වුණු සම්මන්ත්‍රණ | 2023 ජනවාරි සිට මැයි දක්වා | 04 |
| 2017.03.04, 2018.10.27, 2021.05.23 සහ 2023.11.18 දිනවල පත්වීම් ලද නියෝජ්‍ය කොමසාරිස්වරුන් සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 2023 මැයි | 04 |
| 2018 ජූලි මස 16 වන දින පත්වීම් ලද සහකාර කොමසාරිස්වරුන් සඳහා පවත්වන ලද දෙපාර්තමේන්තුගත විභාගය - 1 වන වර පෙනීසිටීම | 2023 දෙසැම්බර් | 27 |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 8.3.3 2023 වර්ෂයේදී රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීම සඳහා පවත්වන ලද පුහුණු පාඨමාලා

අංක 18/2020 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව රාජ්‍ය නිලධාරීන් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. වර්ෂය තුළ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතා පාඨමාලා පවත්වන ලද අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පවත්වන ලද පාඨමාලා පිළිබඳ විස්තර පහත පරිදි වේ.

8.8 වගුව : 2023 වර්ෂයේ දී රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සඳහා පවත්වන ලද පුහුණු පාඨමාලා

| පාඨමාලාව | කාලසීමාව | පුහුණුවූ සංඛ්‍යාව |
|---|---|---|
| සහකාර කොමසාරිස්වරුන් සඳහා දෙමළ පාඨමාලාව | පැය 200 | 194 |
| කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා දෙමළ පාඨමාලාව | පැය 150 | 205 |
| කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සඳහා දෙමළ පාඨමාලාව | පැය 100 | 54 |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 8.3.4 2023 වර්ෂයේ දී පවත්වන ලද වෙනත් සම්මන්ත්‍රණ, වැඩමුළු, දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු වැඩසටහන්

දේශීය ආදායම් දෙපාර්තමේන්තු සියලුම කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා පහත සම්මන්ත්‍රණ, වැඩමුළු, දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

- දේශීය ආදායම් සේවයේ නිලධාරීන්ගේ සේවා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන්
- දේශීය ආදායම් සේවයේ සියලුම නිලධාරීන් සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ සහ දේශීය ආදායම් පනතේ නව සංශෝධන පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන - එක් නිලධාරියෙකු සඳහා අවම වශයෙන් පැය 6ක කාලයක් ආවරණය කළ යුතුය.
- දේශීය ආදායම් සේවයේ කොමසාරිස්වරුන් සඳහා අන්තර්ජාල ආරක්ෂාව පිළිබඳ පුහුණු වැඩසටහන්
- රියදුරන් සහ අනෙකුත් සේවා සඳහා සේවාවල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන
- ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සහ සහ කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සඳහා සේවාවල කාර්යක්ෂමතාව වර්ධනය කිරීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන
- මධ්‍ය පරිමාණ සංස්ථාපිත ඒකකයේ දේශීය ආදායම් සේවයේ නිලධාරීන් සඳහා විගණන සහ බදු පුහුණුව පිළිබඳ වැඩසටහන්

**ඇමුණුම 01**

## වර්ෂය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද බදු

| බදු වර්ගය | ප්‍රධාන පනත සහ සංශෝධන | සහතික කළ දිනය |
|---|---|---|
| ආදායම් බදු | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | 24.10.2017 |
| | 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | 13.05.2021 |
| | 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | 19.12.2022 |
| | 2023 අංක 4 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | 08.05.2023 |
| | 2023 අංක 14 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | 08.09.2023 |
| එකතු කළ අගය මත බද්ද (මූල්‍ය සේවා මත එකතු කළ අගය ඇතුළත්ව) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 26.07.2002 |
| | 2003 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 27.02.2003 |
| | 2004 අංක 13 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 18.11.2004 |
| | 2005 අංක 6 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 30.03.2005 |
| | 2006 අංක 8 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 31.03.2006 |
| | 2007 අංක 14 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 12.04.2007 |
| | 2008 අංක 15 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 29.02.2008 |
| | 2009 අංක 15 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 31.03.2009 |
| | 2011 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 31.03.2011 |
| | 2012 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 30.03.2012 |
| | 2013 අංක 17 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 24.04.2013 |
| | 2014 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 24.04.2014 |
| | 2015 අංක 11 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 30.10.2015 |
| | 2016 අංක 20 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 01.11.2016 |
| | 2018 අංක 25 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 16.08.2018 |
| | 2019 අංක 19 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 31.10.2019 |
| | 2021 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 13.05.2021 |
| | 2022 අංක 13 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 31.03.2022 |
| | 2022 අංක 44 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 14.12.2022 |
| | 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 13.12.2023 |
| ඔට්ටු හා සූදු බද්ද | 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු පනත | 24.11.1988 |
| | 2001 අංක 7 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත | 11.04.2001 |
| | 2002 අංක 11 දරන මුදල් පනත | 08.07.2002 |
| | 2003 අංක 23 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත | 30.07.2003 |
| | 2005 අංක 9 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත | 31.03.2005 |
| | 2006 අංක 14 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත | 31.03.2006 |
| | 2013 අංක 19 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත | 24.04.2013 |
| | 2015 අංක 14 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත | 30.10.2015 |
| | 2023 අංක 11 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත | 21.08.2023 |
| මුද්දර ගාස්තු | 1982 අංක 43 දරන මුද්දර බදු පනත | 14.12.1982 |
| | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත | 31.03.2006 |
| | 2008 අංක 10 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත | 29.02.2008 |
| | 2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනත | 31.03.2011 |
| | 2022 අංක 6 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) පනත | 17.02.2022 |
| කොටස් ගනුදෙනු බද්ද | 2005 අංක 5 දරන මුදල් පනත | 30.03.2005 |
| | 2007 අංක 13 දරන මුදල් (සංශෝධන) පනත | 11.04.2007 |
| | 2008 අංක 8 දරන මුදල් (සංශෝධන) පනත | 29.02.2008 |
| | 2009 අංක 18 දරන මුදල් (සංශෝධන) පනත | 31.03.2009 |
| විගමන බද්ද | 2015 අංක 10 දරන මුදල් පනත | 30.10.2015 |
| ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද | 2021 අංක 18 දරන මුදල් පනත | 15.09.2021 |
| අධිභාර බද්ද | 2022 අංක 14 දරන අධිභාර බදු පනත | 08.04.2022 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත | 20.09.2022 |
| | 2023 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත | 08.09.2023 |

**ඇමුණුම 02**

**අවලංගු කර හෝ අහෝසි කර ඇති නමුත් 2023 වර්ෂයේදී ආදායම් රැස් කිරීම සිදු කරන ලද බදු**

| බදු වර්ගය | ප්‍රධාන පනත සහ සංශෝධන | අවලංගු කළ හෝ අහෝසි කළ දිනය |
|---|---|---|
| ආදායම් බද්ද | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | 01.04.2018 |
| ජාතික ආරක්ෂක බද්ද | 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත | 01.08.2002 |
| භාණ්ඩ හා සේවා බද්ද | 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බද්ද | 01.08.2002 |
| පිරිවැටුම් බද්ද (උතුරු පළාත) | 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත | 01.01.2011 |
| ආර්ථික සේවා ගාස්තු | 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත | 01.01.2020 |
| | 2007 අංක 15 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2008 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2009 අංක 16 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2011 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2012 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2013 අංක 6 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2014 අංක 9 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2015 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2017 අංක 7 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2018 අංක 33 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2020 අංක 4 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | 01.12.2019 |
| | 2009 අංක 32 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2011 අංක 10 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2012 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2013 අංක 11 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2014 අංක 10 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2015 අංක 12 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2016 අංක 22 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2017 අංක 13 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2018 අංක 20 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2019 අංක 20 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2020 අංක 3 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 2018 අංක 35 දරන මුදල් පනත | 01.01.2022 |

**ඇමුණුම 03**

## එකතු කළ අගය මත බද්දෙන් නිදහස් භාණ්ඩ හා සේවා

| | | |
|---|---|---|
| **(අ)** | (i) | තිරිඟු සහ තිරිඟු පිටි; |
| | (ii) | ළදරු කිරි පිටි; |
| | (iii) | අවසන් භාවිතය ප්‍රතිකාරක හෝ රෝග නිවාරණ බලපෑමක් ඇති බවට සීමා කර ඇති සහ වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත මිල දී ගනු ලබන (සුවඳ විලවුන් නොවන) ඖෂධ නිෂ්පාදන, ඖෂධ වර්ග සහ එවැනි නිෂ්පාදන හෝ ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරනු ලබන අමුද්‍රව්‍ය; |
| | (iv) | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 3 වන වගන්තිය යටතේ පත්කරන ලද ආයුර්වේද කොමසාරිස්වරයාගේ නිර්දේශය සහිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් ආයුර්වේද ඖෂධ නිසන්ඩුවට අයත් ආයුර්වේද සංයෝග හෝ (සුවඳ විලවුන් සංයෝග නොවන) ආයුර්වේද සංයෝග හෝ (සුවඳ විලවුන් සංයෝග නොවන) යුනානි, සිද්ධ හෝ හෝමියෝපති සංයෝග සහ එම සංයෝග සඳහා භාවිත කරනු ලබන අමුද්‍රව්‍ය; |
| | (v) | පිරිපහදු නොකරන ලද බනිජතෙල්, භූමිතෙල්, ගුවන්යානා ඉන්ධන, නැව් සඳහා භාවිත කරන තෙල් හෝ රේගු කාර්ය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 2710.19.60 යටතේ නිශ්චිතව දක්වන ලද ඉන්ධන; |
| | (vi) | කෘත්‍රිම අත්පා, කිහිලිකරු, රෝද පුටු, ශ්‍රවණ ආධාරක, එවැනි ආධාරක සඳහා වන උපාංග හෝ විකලතාවක් හෝ අශක්නුතාවක් සඳහා උපකාර පිණිස පළඳින හෝ රැගෙන යන හෝ මිනිස් සිරුරේ තැන්පත් කරන විශේෂිත උපකරණ, අන්ධ තැනැත්තන් සඳහා වූ සුදු සැරයටි, බ්‍රේල් යතුරු ලියන යන්ත්‍ර සහ කොටස්, බ්‍රේල් ලිවීමේ කඩදාසි, බ්‍රේල් යතුරු ලියන පුවරු සහ තත්කාර්ය සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත එවැනි තැනැත්තන් විසින් ඉල්ලා සිටින සහනයේ තත්ත්වය පිළිබඳ සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන පරිදි වෙනත් යම් අයිතම; |
| | (vii) | රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් ජෛව පොහොර, ආටිමියා බිත්තර සහ පීට් පාසි; |
| | (viii) | කෘෂිකාර්මික බීජ, කෘෂිකාර්මික පැළ, ඉස්සන් සඳහා ආහාර ඇතුළුව කුනිස්සන් සඳහා ආහාර සහ කුකුළු ආහාර හැර සත්ව ආහාර; |
| | (ix) | රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් රෙදිපිළි කර්මාන්තය සඳහා භාවිත කරනු ලබන නූල්; |
| | (x) | රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් අත්යන්ත්‍ර කර්මාන්තය සඳහා භාවිත කරනු ලබන වර්ණක; |
| **සැපයීම හෝ ආනයනය කිරීම.** | | |
| **(ආ)** | (i) | යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් සපයනු ලබන අධ්‍යාපනික සේවා; |
| | (ii) | (ගුවන් ප්‍රවාහනය, ජලය මගින් ප්‍රවාහනය හෝ සංචාරකයින් ප්‍රවාහනය කිරීම, විනෝද චාරිකා සහ කුලී රථ සේවා හැර) පොදු මගී ප්‍රවාහන සේවා; |
| | (iii) | බෙදා හැරීම ද ඇතුළුව විදුලිබලය; |
| | (iv) | යම් ආයතනයක් හෝ තැනැත්තකු විසින් සපයනු ලබන භූමදාන සහ ආදාහන කටයුතු සම්බන්ධ සේවා; |
| | (v) | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ආගමන කවුළුවට ඔබ්බෙන් පිහිටා ඇති භෝජනාගාරයක සපයනු ලබන සේවා; |
| | (vi) | 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළ වන යම් රාජ්‍යයක දූත මණ්ඩලයකට හෝ යම් සංවිධානයකට සපයනු ලබන භාණ්ඩ සහ සේවා හෝ එවැනි වරප්‍රසාද සඳහා හිමිකම් ලබන එවැනි දූත මණ්ඩලයක හෝ සංවිධානයක කාර්ය මණ්ඩල සාමාජිකයකු සඳහා ලබා දෙන භාණ්ඩ හා සේවා;<br>එසේ වුව ද, ශ්‍රී ලංකාවේ ඊට අනුරූපී ප්‍රතිපාර්ශ්ව කාර්ය මණ්ඩලයට, කොමසාරිස්-ජනරාල්වරයා විසින් එසේ පවතින බවට හඳුනාගනු ලබන අන්‍යෝන්‍ය ප්‍රතිලාභ හිමිකම් පවතී; |
| | (vii) | ස්වභාවික හෝ මිනිස් ක්‍රියාකාරකමක් හෝ වෙනත් යම් ක්‍රියාකාරකමක් හේතුවෙන් සිදුවන හදිසි ආපදා සඳහා සහන සැලසීම පිණිස හෝ ජාතික ආර්ථිකයේ යහපත පිළිබඳ සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් ක්‍රියාකාරකමක් සඳහා විදේශීය සංවිධාන විසින් ඍජුවම අරමුදල් සපයනු ලබන භාණ්ඩ හා සේවා; |
| | (viii) | පහත දැක්වෙන මූල්‍ය සේවා:- |
| | | (අ) යම් ජංගම, තැන්පතු හෝ ඉතිරිකිරීමේ ගිණුමක් පවත්වාගෙන යාම; |
| | | (ආ) ව්‍යවහාර මුදල් හුවමාරු කිරීම; |

| | | | | |
|---|---|---|---|---|
| | | (ඇ) | | යම් නෝට්ටුවක්, ගෙවීම් නියෝගයක්, චෙක්පතක් හෝ ණයවර ලිපියක් නිකුත් කිරීම, ඒ සඳහා මුදල් ගෙවීම, රැස්කිරීම හෝ ඒවායේ අයිතිය පැවරීම; |
| | | (ඈ) | | යම් තැනැත්තකු විසින් ණය වී ඇති මුදල ගෙවීමට ඇති යම් අයිතිවාසිකමක් හෝ හිමිකමක් ඇත්තා වූ යම් ණය සුරැකුම්පතක් නිකුත් කිරීම, වෙන් කිරීම, අයිතිය පැවරීම, අණ කිරීම, ප්‍රතිග්‍රහණය හෝ පිටසන් කිරීම; |
| | | (ඉ) | | යම් සම කොටස් සුරැකුම්පතක්, ණය සුරැකුම්පතක් හෝ සහභාගී සුරැකුම්පතක් නිකුත් කිරීම, වෙන් කිරීම හෝ අයිතිය පැවරීම; |
| | | (ඊ) | | යම් සම කොටස් සුරැකුම්පතක්, ණය සුරැකුම්පතක් හෝ සහභාගී සුරැකුම්පතක් නිකුත් කිරීම, පැවරීම හෝ අතුරු පැවරීම; |
| | | (උ) | | යම් ණය මුදලක්, අත්තිකාරම් මුදලක් හෝ බැරපතක්; |
| | | (ඌ) | (i) | වෙනම ගාස්තුවක් අයකරනු ලබන සහ සැපයීම සිදු කරන තැනැත්තා වෙත හෙළිදරව් කරනු ලබන කුලී සින්නක්කර කොන්දේසිමය විකිණීමක් හෝ බැරකම් විකිණීමේ ගිවිසුමක දී සපයනු ලබන වාරික ණය මූල්‍ය පහසුකම්; |
| | | | (ii) | එම ගිවිසුමේ දිනය වන විට මාස දොළහකට නොඅඩු කාලයක් සඳහා ශ්‍රී ලංකාවේ දී භාවිත කර ඇති කුලී සින්නක්කර ගිවිසුමක් හෝ කොන්දේසිමය විකුණුමක් යටතේ සපයනු ලබන භාණ්ඩ; |
| | | | (iii) | මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ සපයනු ලබන කල්බදු පහසුකම්; |
| | | (එ) | | ජීවිත රක්ෂණය, "අග්‍රහාර" රක්ෂණය සහ භෝග සහ පශු සම්පත් රක්ෂණය; |
| | | (ඒ) | | බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක්‍රිය ණය මුදල්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරනු ලබන පරිදි එම බැංකුව ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනා ක්‍රමයක් හෝ එම බැංකුවේ වෙනත් යම් යෝජනා ක්‍රමයක් ප්‍රකාරව වෙනත් යම් තැනැත්තකු වෙත පැවරීම; |
| | (ix) | රෝහල් කාමර ගාස්තු හැර, සෞඛ්‍යාරක්ෂක සේවා සපයන වෛද්‍ය ආයතන විසින් හෝ වෘත්තීයමය වශයෙන් සුදුසුකම්ලත් තැනැත්තන් විසින් සපයනු ලබන සියලු සෞඛ්‍යාරක්ෂක සේවා; | | |
| | (x) | විකිණීම සඳහා කරනු ලබන සකස් කිරීමක් හැර කිසිදු පිරිසැකසුම් කිරීමකින් තොරව එම අයිතම අලෙවි කරනු ලබන බවට වූ කොන්දේසියට යටත්ව 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දට යටත්ව ආනයනය කරන ලද යම් අයිතම; | | |
| | (xi) | දේශීය වශයෙන් නිෂ්පාදිත අත්යන්ත්‍ර රෙදිපිළි; | | |
| | (xii) | එම නිෂ්පාදන දේශීය වශයෙන් නිපදවන තාක් දුරට සහල්, සහල් පිටි සහ පාන්; | | |
| | (xiii) | ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත පිරිසැකසුම් නොකළ කෘෂිකාර්මික, උද්‍යාන විද්‍යාත්මක හෝ මත්ස්‍ය නිෂ්පාදන; | | |
| | (xiv) | ශල්‍යකර්ම සඳහා භාවිත කරනු ලබන දේශීය වශයෙන් නිෂ්පාදිත ශල්‍යකර්ම දැල් රෙදි (ගෝස්); | | |
| | (xv) | 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නිකුත් කරනු ලබන ගැසට් නිවේදනයක නිශ්චිතව දක්වනු ලබන ආකාරයට රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, රට තුළට ඇතුළුවන ස්ථානයේ දී, ආනයනය කිරීම මත වෙනත් යම් බද්දක් අය කරනු ලැබීම වෙනුවට රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගිකරණ ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද විශේෂිත අනුපාතිකයක් යටතේ වූ සෙස් බද්දකට යටත්වන රෙදිපිළි; | | |
| | (xvi) | මේ පනත යටතේ බදු අය කිරීමේ කාර්යය සඳහා, වාණිජ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හෝ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් යම් අපනයන කටයුතු හෝ සේවා සපයන්නකු වෙත සපයනු ලබන ශුන්‍ය අනුප්‍රමාණගත සේවා වන තාක් දුරට වන යම් සේවා; | | |
| | (xvii) | ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිටින වෙනත් යම් තැනැත්තකු වෙත එම වෙනත් යම් තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී පරිභෝජනය කිරීම හෝ භාවිත කිරීම පිණිස සපයනු ලබන සහ ගෙවීම් කටයුතු ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කරනු ලබන සේවා; | | |
| | (xviii) | නූල්, රෙදිපිළි හෝ ඇඟලුම් නිෂ්පාදන අපනයනය කරන්නන් හැර වෙනත් යම් තැනැත්තන් වෙත සපයනු ලබන සේවාවන් වන තාක් දුරට නූල්, රෙදිපිළි හෝ ඇඟලුම්වල තත්ත්වය, ගති ලක්ෂණ හෝ වටිනාකම ප්‍රවර්ධනය වීමක් සිදුවන සේවාවන්; | | |
| | (xix) | වෘද්ධ සේවාවන් සහ ළමා සත්කාරක සේවාවන්; | | |
| | (xx) | 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වන වගන්තිය ප්‍රකාරව ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගෙන ඇති යම් ව්‍යාපෘතියක් සඳහා සපයනු ලබන භාණ්ඩ හෝ සේවා; | | |
| | (xxi) | (අ) බදු ගෙවීම රජය විසින් දරනු ලබන සහ රටෙහි ආර්ථිකමය සුබසිද්ධිය පිළිබඳ සලකා බැලීමෙන් පසුව අමාත්‍යවරයා විසින් හඳුනාගනු ලබන යම් විශේෂිත ව්‍යාපෘතියක් සඳහා සපයනු ලබන භාණ්ඩ හෝ සේවා;<br>හෝ | | |

| | | |
|---|---|---|
| | | (ආ) අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන පරිදි ශ්‍රී ලංකා රජයේ යම් අමාත්‍යාංශයක් වෙත විදේශ ණය හෝ පරිත්‍යාග වශයෙන් අරමුදල් සපයන යම් යටිතල සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා සපයනු ලබන භාණ්ඩ සහ සේවා; |
| | (xxii) | 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලබන භාණ්ඩ හෝ සේවා; |
| | (xxiii) | පාර්ලිමේන්තුව විසින් ඒකාබද්ධ අරමුදලින් සම්මත කරනු ලබන මුදල්වලින් හෝ රජය හරහා සකස් කරන ලද යම් ණය මුදලකින් ශ්‍රී ලංකාවේ රජය වෙනුවෙන් යම් රාජ්‍ය සංස්ථාවක් විසින්, ගාස්තු අය කිරීමෙන් තොරව සපයන තාක් දුරට, එසේ සපයනු ලබන සේවා; |
| | (xxiv) | විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් කිරීම පිණිස තීරු බදු රහිත සාප්පු සඳහා දේශීයව නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ, |
| **සැපයීම.** | | |
